# 2022 නොවැම්බර් 08

# මහා සභා රැස්වීමේ වාර්තාව

# දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

## මහා සභා රැස්වීම් වාර්තාව - 2022 නොවැම්බර්

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2022.11.08 වෙනි දින පෙ:ව: 09.30 ට දෙහිඕවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ වූ 2022 නොවැම්බර් මස මහා සභා රැස්වීමේ වාර්තාව.

සහභාගීත්වය:

1. ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා - ගරු සභාපති
2. ආර්.ඒ.විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා - ගරු උප සභාපති
3. අමිල කන්දෙආරච්චි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
4. ඩබ්.අබේසේන මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
5. ඩී.එස්.එම්.නිමල් මැතිතුමා. - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
6. යූ.ජී.සරත් විජේසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
7. එම්.ටී.ආර්.ලක්මාල් සමරරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
8. එච්.අමරාවතී මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී
9. ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
10. කේ.නිශාන් මැතිතුමා. - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
11. පී.ඊ.ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
12. අතුල ජයසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
13. පී.වී.එන්.සඳමාලි විජේරත්න මැතිණිය -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී
14. දිස්නා කුමාරි වීරක්කොඩි මැතිණිය - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී
15. කේ.විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
16. යශෝධ ලලංග පද්මසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
17. යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
18. ජේ.ඩී.තුෂාර අමරසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
19. යූ.සුධර්මා ලක්මාලි විජේසේකර මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී
20. අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
21. ඩී.එම්.වික්ටර් බණ්ඩාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
22. සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
23. එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
24. ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
25. පී.කේ.නිමල් රාජපක්ෂ මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
26. එම්.වි.සුගත් මාධව මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
27. ආර්.පී.ශ්‍රියානි ජයකොඩි මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී
28. රනිල් චන්ද්‍ර කුමාර විජේසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
29. එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී
30. කේ.ජී.ඒ.කේ.සුමනදාස මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී
31. බී.ඒ.නීතා බාලසූරිය මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී
32. ඩී.ජී.එච්.සී.කේ. පියරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
33. අඑච්.ඒ.කේ.එන්.ජයවිර මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී

නොපැමිණි:

01. කේ.ඩී.එන්.ප්‍රියන්ති මැතිණිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී

කාර්යාල නිලධාරීන්:

I එච්.ඒ.ආර්.එස්.තිලකරත්න මහතා - ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
II. ඩී.එම්.එන්.එන්. දිසානායක මිය - සංවර්ධන නිලධාරී.
III එම්.ජී. ආර්.සී.ජී.විජේරත්න මිය - සංවර්ධන නිලධාරී.
IV ඩබ්.එස්.කේ.වර්ණපුර මිය - කළමනාකරණ සේවා නිලධාරි

සභාවට පැමිණි සියලු දෙනා ආගම සිහිකිරීම, රණ විරුවන් සිහිකිරීම හා පළාත් පාලන ගීතය ගායනා කිරීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**(අ) 2022.10.11 දින පැවැත් වූ මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම:**

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2022.10.11 වෙනි දින පවත් වන ලද මහා සභා රැස්වීමේ වාර්තාව සියලුම මන්ත්‍රීවරුන් වෙත ලබා දී ඇති බවත් එම වාර්තාව කියවූවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත්,එසේ නොමැති නම් එම මහා සභා වාර්තාව සභා සම්මත කරන ලෙසත් දන්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නීතා බාලසූරිය මැතිණිය:**

2022.10.11 වෙනි දින පැවති මහා සභා රැසවීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බව ප්‍රකාශ කර සිටියාය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022.10.11 වෙනි දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත විය

**(ආ) ගරු සභාපතිතුමාගේ නිවේදන:**

- ප්‍රාදේශීය සභාව විසින් ඉදි කිරීමට යෝජිත ඉන්ධන පිරවුම්හල් ව්‍යාපෘතියේ වැඩ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බවත් එම ක්‍රියාවලිය සඳහා පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බවත් පැවසීය. එසේම ප්‍රාදේශීය සභාවක් වශයෙන් ලංකා IOC සමාගම සමඟ සම්මුඛ පරීක්ෂණයකට සහභාගී වූ බවත් මේ ව්‍යාපෘතිය සඳහා ණයක් ලබා ගැනීමේ අරමුණින් දේශිය ණය සංවර්ධන අරමුදල සමඟත් සාකච්ඡා කළ බව පැවසූ එතුමා එහි පොළිය 0.7% ක් වැනි අනුපාතයකට පවතින බවත් පවසා සිටියේය. ඒ අනුව මන්ත්‍රීතුමන්ලා සමඟත් සාකච්ඡා කර බලා ඉන්ධන පිරවුම්හල සඳහා බලපත්‍රය ලැබුණු පසු සභාවේ අනුමැතියෙන් ඉදිරි කටයුතු සිදු කිරීමට තමන් අපේක්ෂා කරන බවත් පැවසීය. මේ සම්බන්ධයෙන් වර්තමාන තත්වය ගරු මන්ත්‍රීතුමන්ලාගේ දැන ගැනීම සඳහා මේ ආකාරයට ඉදිරිපත් කිරීමට තමන් අදහස් කළ බව පවසා සිටින ලදී.

**(ඇ)** ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා නිවේදන සභාවට ඉදිරිපත් කිරීම :

**(ඈ)** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න: නැත

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා:**

**01.(i) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සභාවේ පොදු කාර්යයන් සඳහා වූ වියදම් වෙනුවෙන් ඇමුණුම 01 හි දැක්වෙන 2022.10.26 වෙනි දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව පිළිගැනීමට හා එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(ii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සභාවේ පොදු කාර්යයන් සඳහා වූ වියදම් වෙනුවෙන් ඇමුණුම 02 හි දැක්වෙන 2022 ඔක්තොම්බර් මාසයේ මාසික වියදම් සඳහා ගෙවීම් අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නීතා බාලසූරිය මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

**ඇමුණුම අංක 02**

## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

## 2022 ඔක්තොම්බර් මස 31 වන දින තෙක් ගෙවීම් වවුචර්පත්

| දිනය | වවුචර්පත් අංකය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|
| ඔක්:03 | 1494 | මු.භා.ක-එච්.පී.පී.සමන්කුමාර<br>PF7369 දරණ කැබ් රථය සඳහා 2022/09/22 දින මාගම්මන ඉන්ධන පිරවුම්හලින් ඉන්ධන ලබාගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 21,500.00 |
| ඔක්:03 | 1495 | මු.භා.ක-එච්.පී.පී.සමන්කුමාර<br>PF7369 දරණ කැබ් රථය සඳහා 2022/09/26 දින මාගම්මන ඉන්ධන පිරවුම්හලින් ඉන්ධන ලබාගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 21,500.00 |
| ඔක්:03 | 1496 | දෙහිඕවිට ටයර් ට්‍රේඩින්<br>RD9461 දරණ ට්‍රැක්ටරයේ පිටුපස ටයර් දෙක නැවත පිරවීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 61,600.00 |
| ඔක්:03 | 1497 | මෙට්රොපොලිටන් ටෙක්නොලජීස් ප්‍රයිවට් ලිමිටඩ්<br>පෙරටු කාර්යාලයේ ඇති ඡායා පිටපත් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම.(ටෝනර් හා ඩ්‍රම්) | 121,688.00 |
| ඔක්:03 | 1498 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ශ්‍රවණාගාරය කුලියට ලබාදීම වෙනුවෙන් ලබාගත් තැන්පත් මුදල් ආදායමට ගැනීම.(No Cash) | 9,000.00 |
| ඔක්:03 | 1499 | ජාතික රක්ෂණ භාර අරමුදල<br>දෙ/ප්‍රා/සභාවට අයත් 67-0130,RV2129,RC1403 යන වාහන සඳහා රක්ෂණ වාරිකය අලුත්කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 13,184.16 |

| | | | |
|---|---|---|---|
| ඔක්:04 | 1500 | ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව<br>කාර්යාලීය අවශ්‍යතා සඳහා ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 321,082.83 |
| ඔක්:04 | 1501 | හයිවේ ඉංජිනියරින්<br>LL7582 දරණ කැබ් රථයේ දුනුකොළ දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 25,800.00 |
| ඔක්:04 | 1502 | අල්ගොඩ සමඟි වැඩිහිටි සමිතිය<br>දෙහිඕවිට සිට අල්ගොඩ මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ 10% රැඳවුම් මුදල් ගෙවීම. | 35,708.65 |
| ඔක්:05 | 1503 | ඉහළ තලපිටිය ග්‍රාම සංවර්ධන සමිතිය<br>ඉහළ තලපිටිය තලාව හේන්යාය මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ 10% රැඳවුම් මුදල් ගෙවීම. | 49,500.00 |
| ඔක්:05 | 1504 | මු.හා.ක-ආර්.ඒ.පී.කේ.රණසිංහ<br>දිගලවත්ත කසල මධ්‍යස්ථානයේ හලර් යන්ත්‍රයේ බෙල්ට් එක අලුතින් දැමීම වෙනුවෙන් අතින් වියදම් කල මුදල් ලබා ගැනීම. | 6,600.00 |
| ඔක්:05 | 1505 | මු.හා.ක-ඩබ්.ඩී.එස්.සී.රණසිංහ- ගමන් වියදම් ගෙවීම. | 1,750.00 |
| ඔක්:05 | 1506 | මු.හා.ක-ඩබ්.ඩී.එස්.සී.රණසිංහ- ගමන් වියදම් ගෙවීම. | 350.00 |
| ඔක්:05 | 1507 | මු.හා.ක-එච්.එස්.ඩී.ආර්.නයනානන්ද- ගමන් වියදම් ගෙවීම. | 1,980.00 |
| ඔක්:05 | 1508 | මු.හා.ක-ආර්.ඩබ්.එම්.ඊ.කේ.චන්ද්‍රවීර - ගමන් වියදම් ගෙවීම. | 2,006.00 |
| ඔක්:05 | 1509 | මු.හා.ක-කේ.එම්.ඒ.ජේ.එන්.සිරිසේන- ගමන් වියදම් ගෙවීම. | 7,080.00 |
| ඔක්:05 | 1510 | මු.හා.ක-එච්.පී.පී.එස්.කුමාර - ගමන් වියදම් ගෙවීම. | 4,200.00 |
| ඔක්:05 | 1511 | මු.හා.ක-ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද - ගමන් වියදම් ගෙවීම. | 8,000.00 |
| ඔක්:05 | 1512 | මු.හා.ක-එච්.පී.පී.සමන්කුමාර- 2022 සැප්තැම්බර් මස අතිකාල ගෙවීම. | 12,095.00 |
| ඔක්:05 | 1513 | මු.හා.ක-ආර්.ජී.එස්.එස්.වික්‍රමාරච්චි- 2022 අගෝස්තු මස ගමන් වියදම් ගෙවීම. | 5,600.00 |
| ඔක්:05 | 1514 | මු.හා.ක-ආර්.ජී.එස්.එස්.වික්‍රමාරච්චි- 2022 ජූලි මස ගමන් වියදම් ගෙවීම. | 4,000.00 |
| ඔක්:05 | 1515 | මු.හා.ක-කේ.එම්.ටී.එම්.කපුකොටුව- ගමන් වියදම් ගෙවීම. | 520.00 |
| ඔක්:05 | 1516 | මු.හා.ක-ඒ.එම්.කේ.කේ.අත්තනායක- ගමන් වියදම් ගෙවීම. | 800.00 |
| ඔක්:05 | 1517 | මු.හා.ක-ආර්.ඩී.ඩබ්.ජේ.විජේවර්ධන- ගමන් වියදම් ගෙවීම. | 350.00 |
| ඔක්:05 | 1518 | මු.හා.ක-ආර්.ඩී.ඩබ්.ජේ.විජේවර්ධන- ගමන් වියදම් ගෙවීම. | 700.00 |
| ඔක්:05 | 1519 | මු.හා.ක-එම්.එල්.ඒ.කුමාර- ගමන් වියදම් ගෙවීම. | 972.00 |
| ඔක්:05 | 1520 | මු.හා.ක-කේ.ජී.පී.එල්.සෝමවීර- ගමන් වියදම් ගෙවීම. | 490.00 |
| ඔක්:05 | 1521 | මු.හා.ක-කේ.ජී.පී.එල්.සෝමවීර- ගමන් වියදම් ගෙවීම. | 980.00 |
| ඔක්:05 | 1522 | මු.හා.ක-කේ.ජී.පී.එල්.සෝමවීර- ගමන් වියදම් ගෙවීම. | 480.00 |
| ඔක්:05 | 1523 | මු.හා.ක-එම්.එල්.ඒ.කුමාර- ගමන් වියදම් ගෙවීම. | 972.00 |
| ඔක්:05 | 1524 | මු.හා.ක-එච්.ඩී.ටී.පෙරේරා- ගමන් වියදම් ගෙවීම. | 4,720.00 |
| ඔක්:05 | 1525 | මු.හා.ක-එච්.ඩී.ටී.පෙරේරා- ගමන් වියදම් ගෙවීම. | 3,540.00 |

| | | | |
|---|---|---|---|
| ඔක්:05 | 1526 | මු.හා.ක-කේ.ජී.පී.එල්.සෝමවීර- ගමන් වියදම් ගෙවීම. | 469.48 |
| ඔක්:05 | 1527 | මු.හා.ක-ඩබ්.එස්.කේ.වර්ණපුර- සංග්‍රහ වියදම් ගෙවීම. | 348.00 |
| ඔක්:05 | 1528 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව- සුළු මුදල් අග්‍රිමය අලුත්කිරීම. | 4,605.00 |
| ඔක්:06 | 1529 | මු.හා.ක-එච්.ආර්.කේ.ජයවර්ධන- 2022 සැප්තැම්බර් මස අතිකාල ගෙවීම. | 7,579.00 |
| ඔක්:06 | 1530 | මු.හා.ක-ඩී.එල්.ආර්.එස්.කුමාර- 2022 සැප්තැම්බර් මස අතිකාල ගෙවීම. | 4,441.00 |
| ඔක්:06 | 1531 | මු.හා.ක-එස්.පී.තිලකරත්න- 2022 සැප්තැම්බර් මස අතිකාල ගෙවීම. | 8,288.00 |
| ඔක්:06 | 1532 | මු.හා.ක-එන්.ජී.ආර්.ටී.ගුණරත්න- 2022 සැප්තැම්බර් මස අතිකාල ගෙවීම. | 4,576.00 |
| ඔක්:06 | 1533 | මු.හා.ක-එච්.එම්.එස්.නන්දකුමාර- 2022 සැප්තැම්බර් මස අතිකාල ගෙවීම. | 3,392.00 |
| ඔක්:06 | 1534 | මු.හා.ක-එම්.ආර්.පී.කුමාරසිරි- 2022 සැප්තැම්බර් මස අතිකාල ගෙවීම. | 7,366.00 |
| ඔක්:06 | 1535 | මු.හා.ක-ඩබ්.ඒ.ඩී.කොඩිකාර- 2022 සැප්තැම්බර් මස අතිකාල ගෙවීම. | 5,497.00 |
| ඔක්:06 | 1536 | මු.හා.ක-ආර්.ඩී.සී.කරුණාරත්න- 2022 සැප්තැම්බර් මස අතිකාල ගෙවීම. | 2,953.00 |
| ඔක්:06 | 1537 | මු.හා.ක-එච්.ජී.දේශප්‍රිය- 2022 සැප්තැම්බර් මස අතිකාල ගෙවීම. | 9,918.00 |
| ඔක්:07 | 1538 | මු.හා.ක-කේ.ජී.සී.වෙරෝනිකා ගමඇතිගේ<br>පෙර පාසැල් දීමනා ගෙවීම. | 15,000.00 |
| ඔක්:07 | 1539 | ලේකම්-දෙ/ප්රා/සභාව<br>2022 සැප්තැම්බර් මස දෙ/ප්‍රා/සභාවේ කුලී පදනම මත වැටුප් ගෙවීම. | 820,385.16 |
| ඔක්:07 | 1540 | එකමුතු වැඩිහිටි සංවිධානය-වෙලන්ගල්ල<br>වෙලන්ගල්ල පොදු සුසාන භූමියේ මෘත දේහ තැබීම සඳහා 10*15 ප්‍රමාණයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම කර්මාන්තයේ රැඳවුම් මුදල් ගෙවීම.(10%) | 25,000.00 |
| ඔක්:07 | 1541 | එන්.කරුණාරත්න<br>දෙ/ප්‍රා/සභා කාර්යාල පරිශ්‍රය හා පොදු වෙළඳ සංකීර්ණය පිරිසිදු කිරීම සඳහා 2022 සැප්තැම්බර් මස මුදල් ගෙවීම. | 85,200.00 |
| ඔක්:07 | 1542 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:6312082709 දරණ ඉඹුල්පිටිය මහජන පුස්තකාලයේ 2022/08/15-2022/09/14 දක්වා බිල්පත ගෙවීම. | 385.00 |
| ඔක්:07 | 1543 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි.අ.7991368912 දරණ මාගම්මන ආයුර්වේදයේ 2022/08/17 සිට 2022/09/20 දක්වා බිල්පත ගෙවීම. | 1,035.00 |
| ඔක්:07 | 1544 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි.අ.7918009002 දරණ තල්දූව පුස්තකාලයේ 2022/08/13 සිට 2022/09/13 දක්වා බිල්පත ගෙවීම. | 860.00 |

| | | | |
|---|---|---|---|
| ඔක්:07 | 1545 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි.අ.6321102601 දරණ පනාවල පෙර පාසැල් ගොඩනැගිල්ලේ 2022/08/26 සිට 2022/09/25 දක්වා බිල්පත ගෙවීම. | 510.00 |
| ඔක්:07 | 1546 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි.අ.7905151905 දරණ තල්දූව සතිපොළේ 2022/08/22 සිට 2022/09/22 දක්වා බිල්පත ගෙවීම. | 27,470.90 |
| ඔක්:07 | 1547 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/002/177/18 දරණ දෙ/පොදු වැසිකිළියේ ජල බිල්පත ගෙවිම. | 42,958.76 |
| ඔක්:07 | 1548 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-10/44/018/108/17 දරණ තල්දූව සතිපොළේ 2022/08/07-2022/09/07 දක්වා ජල බිල්පත ගෙවිම. | 31,159.33 |
| ඔක්:07 | 1549 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/068/152/18 දරණ මාගම්මන ආයුර්වේදයේ 2022/08/25-2022/09/23 දක්වා බිල්පත ගෙවිම. | 333.50 |
| ඔක්:07 | 1550 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දූ:අ:-036-2262315 දරණ කාර්යාලීය දූරකථනයේ 2022/8/16-2022/9/15 දක්වා බිල්පත ගෙවීම. | 2,320.46 |
| ඔක්:11 | 1551 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>2022 ඔක්තොම්බර් මස දෙ/ප්‍රා/සභාවේ සභික දීමනා ගෙවීම. | 795,000.00 |
| ඔක්:11 | 1552 | K M S ඔටෝ කෙයාර්<br>PF7369 කැබ් රථය සේවා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම.(2022 අගෝස්තු) | 38,837.00 |
| ඔක්:11 | 1553 | ඒ.ඩබ්.නන්දා වයලට්<br>දෙ/නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 22 හා 25 බදු ගැනීම වෙනුවෙන් තැන්පත් කරන ලද ටෙන්ඩර් ඇප තැන්පත් මුදල් ආපසු ගෙවීම. | 20,000.00 |
| ඔක්:12 | 1554 | රෙජිස්ට්රාර් ජනරාල්<br>2022 දෙසැම්බර් මසට අදාල මුද්දර ගාස්තු උපලේඛන සැකසීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 9,100.00 |
| ඔක්:12 | 1555 | පී.ජී.ඒ.එම්.පෙරේරා<br>RD9461 දරණ ට්‍රැක්ටරයට තත්ව වාර්තා ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,000.00 |
| ඔක්:12 | 1556 | ඒ.ඩී.චන්ද්‍රසේන<br>2022 වර්ෂයේ අගොස්තු මස තල්දූව මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,180.00 |
| ඔක්:12 | 1557 | ඩබ්.ඒ.විකුම් ආනන්ද<br>2022 වර්ෂයේ අගෝස්තු මස දෙහිඕවිට මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 6,260.00 |
| ඔක්:12 | 1558 | කේ.ඒ.පී.කුරුප්පු<br>2022 වර්ෂයේ අගෝස්තු මස පනාවල මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,510.00 |

| | | | |
|---|---|---|---|
| ඔක්:12 | 1559 | එම්.එච්.ඩී.එස්.සුගතපාල<br>2022 වර්ෂයේ අගෝස්තු මස මාගම්මන මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,550.00 |
| ඔක්:12 | 1560 | එම්.ඩී.ෆාතිමා හුස්නා<br>ජලය ලබා ගැනීම සඳහා මාර්ගය පළුදු කිරීම වෙනුවෙන් තැන්පත් මුදල් ආපසු ලබාදීම. | 3,500.00 |
| ඔක්:12 | 1561 | ඒ.කේ.එම්.නිස්තාර්<br>ජලය ලබා ගැනීම සඳහා මාර්ගය පළුදු කිරීම වෙනුවෙන් තැන්පත් මුදල් ආපසු ලබාදීම. | 3,500.00 |
| ඔක්:12 | 1562 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 7991487016 දරණ දෙ/පැරණි සභාවේ 2022/09/06-2022/10/07 දක්වා බිල්පත ගෙවීම. | 1,860.00 |
| ඔක්:12 | 1563 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:7909280106 දරණ ඊරියගොල්ල ආදාහනාගාරයේ 2022/08/29-2022/10/02 දක්වා බිල්පත ගෙවීම. | 3,855.00 |
| ඔක්:12 | 1564 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:7970101003 දරණ දෙ/ප්‍රා/සභා කාර්යාලයේ 2022/09/01-2022/10/01 දක්වා බිල්පත ගෙවීම. | 79,996.00 |
| ඔක්:12 | 1565 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:6316208308 දරණ දගලවත්ත කසළ මධ්‍යස්ථානයේ 2022/08/13-2022/09/09 දක්වා බිල්පත ගෙවීම. | 3,185.00 |
| ඔක්:12 | 1566 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:2692684915 දරණ පනාවල මහජන පුස්තකාලයේ 2022/08/26-2022/09/26 දක්වා බිල්පත ගෙවීම. | 360.00 |
| ඔක්:12 | 1567 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-10/44/018/265/16 දරණ තල්දුව පුස්තකාලයේ 2022/09/06-2022/10/04 දක්වා බිල්පත ගෙවීම. | 464.73 |
| ඔක්:12 | 1568 | කෑගල්ල ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>ඊ/ආදාහනාගාරයට ගෑස් සිලින්ඩර් 04ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 69,376.00 |
| ඔක්:12 | 1569 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව<br>ZA0126 දරණ JCB යන්ත්‍රයේ වාර්ෂික රක්ෂණාවරණය අලුත්කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,573.72 |
| ඔක්:12 | 1570 | සෙනොක් ට්‍රේඩ් කම්බයින් පුද්ගලික සමාගම<br>ZA0126 දරණ JCB යන්ත්‍රය සේවා කිරීම හා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 122,018.40 |
| ඔක්:12 | 1571 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ගලි බවුසරය ලබාදීම වෙනුවෙන් තැන්පත් කල මුදල ආදායමට ගැනීම.(No Cash) | 7,500.00 |

| | | | |
|---|---|---|---|
| ඔක්:12 | 1572 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>දෙ/ප්‍රා/සභාවට අයත් 250-4053 හා QU 2004 අංක දරණ වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබාගැනීමට ගත් අත්තිකාරම් මුදල් පියවීම.(No Cash) | 11,510.00 |
| ඔක්:12 | 1573 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>2022/09/23 දින පැවැත්වූ මාර්ග සිතියම්ගත කිරීමේ වැඩසටහන සඳහා ලබාගත් අත්තිකාරම් පියවීම.(No Cash) | 41,253.00 |
| ඔක්:13 | 1574 | එස්.එච්.එම්.ඉර්ෂාන්<br>තල්දුව සතිපොලේ මුරකරුවන් සඳහා විදුලි පන්දම් 02ක් මිලදීගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,500.00 |
| ඔක්:13 | 1575 | එස්.එච්.එම්.ඉර්ෂාන්<br>දෙ/ප්‍රා/සභාවට ලබාගත් හීටර් ජෝගුවක් වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,420.00 |
| ඔක්:13 | 1576 | එස්.එච්.එම්.ඉර්ෂාන්<br>2022 අත්කම් නිර්මාණ තරඟය සඳහා ත්‍යාග ලබාගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,650.00 |
| ඔක්:13 | 1577 | එස්.එච්.එම්.ඉර්ෂාන්<br>ඉඹුල්පිටිය මහජන පුස්තකාලයට බිත්ති ඔරලෝසුවක් මිලදීගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 850.00 |
| ඔක්:13 | 1578 | එච්.ඒ.ජයන්ත ප්‍රියලාල් හෙට්ටිආරච්චි<br>වීථි පහන් සඳහා 16W විදුලි බල්බ 300ක් සැපයීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 504,000.00 |
| ඔක්:13 | 1579 | බෙස්ට් වේ කොම්පියුටර්ස්<br>ශිරෝමි මියගේ පරිගණකයේ CPU යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා මුදල් ගෙවීම. | 2,000.00 |
| ඔක්:13 | 1580 | බෙස්ට් වේ කොම්පියුටර්ස්<br>2700 Brother ප්‍රින්ටර් සඳහා ටෝනර් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 25,500.00 |
| ඔක්:13 | 1581 | නිපෝන් හාඩ්වෙයාර්<br>ප්‍රා/සභා කාර්යාලයේ වගා කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 770.00 |
| ඔක්:13 | 1582 | නිපෝන් හාඩ්වෙයාර්<br>ප්‍රා/සභාවේ ශ්‍රවණාගාරයේ වැසිකිළි සඳහා බාල්දි 02ක් හා තල්දූව සතිපොල සඳහා ඉබි යතුරු කට්ටල මිලදී ගැනීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 6,740.00 |
| ඔක්:13 | 1583 | නිපෝන් හාඩ්වෙයාර්<br>ඊරියගොල්ල ආදාහනාගාරය සඳහා ඉස්කුරුප්පු නියන් 01ක් හා අඬුවක් මිලදී ගැනීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 1,290.00 |
| ඔක්:13 | 1584 | නිපෝන් හාඩ්වෙයාර්<br>පැරණි සභාවේ ඇති කසල බඳුන් බැඳ තැබීමට නයිලෝන් කඹයක් ලබා ගැනීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 1,200.00 |
| ඔක්:13 | 1585 | නිපෝන් හාඩ්වෙයාර්<br>දිගලවත්ත ප්‍රිමික්ස් අංගනයේ කටයුතු සඳහා ග්ලවුස් ලබා ගැනීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 2,000.00 |

| | | | |
|---|---|---|---|
| ඔක්:13 | 1586 | නිපෝන් හාඩ්වෙයාර්<br>දිගලවත්ත ප්‍රිමික්ස් අංගනය සඳහා පැතලි සවල් 04ක් හා උදලු මුල්ලු එකක් මිලදී ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 12,110.00 |
| ඔක්:14 | 1587 | මු.හා.ක-එම්.ඩී.සී.රුක්ෂාණි<br>ගමන් වියදම් ගෙවීම. | 7,722.00 |
| ඔක්:14 | 1588 | මු.හා.ක-ආර්.එම්.එච්.රත්නායක<br>2022.10.14 දින පවත්වන ලද ආයුර්වේද ජංගම සායනයේ සංග්‍රහ වියදම් සඳහා අත්තිකාරම් ලබා ගැනීම. | 3,000.00 |
| ඔක්:14 | 1589 | මු.හා.ක-ඊ.පී.එස්.සමන්ලතා<br>ප්‍රා/සභා ගෙවත්ත සඳහා බටු පැළ මිලදී ගැනීම වෙනුවෙන් අතින් වියදම් කල මුදල් ලබා ගැනීම. | 500.00 |
| ඔක්:14 | 1590 | මු.හා.ක-ආර්.ජී.එස්.ඩී.රොෂාන්ත<br>2022 සැප්තැම්බර් මස අතිකාල ගෙවීම. | 9,713.00 |
| ඔක්:14 | 1591 | මු.හා.ක-පී.ජී.සෙනවිරත්න<br>2022 සැප්තැම්බර් මස අතිකාල ගෙවීම. | 11,250.00 |
| ඔක්:14 | 1592 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>RD8018 දරණ ට්‍රැක්ටරයට හෝස් බටයක් ලබාගැනීමට අත්තිකාරම් මුදල් ලබා ගැනීම. | 5,000.00 |
| ඔක්:14 | 1593 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-10/44/018/108/17 දරණ තල්දුව සතිපොළේ 2022/09/07-2022/10/07 දක්වා බිල්පත ගෙවීම. | 22,076.60 |
| ඔක්:14 | 1594 | තලපිටිය ග්‍රාම සංවර්ධන සමිතිය<br>පූකුණුවල අම්බලන්පිටිය මාර්ගයේ තලපිටිය කොටසේ රංජිත් මයාගේ නිවස ඉදිරිපිට සිට අම්බලන්පිටිය වසම දෙසට මාර්ගය සංවර්ධනය කිරීම 30% රුඳවුම් ගෙවීම. | 148,500.00 |
| ඔක්:14 | 1595 | පෝස්ට් මාස්ටර් ජනරාල්<br>තැපැල් මුද්‍රා යන්ත්‍රයට ගාස්තු ඇතුලත් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 25,000.00 |
| ඔක්:19 | 1596 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු:අ:-036-3868934 දරණ ඊ/ආදාහනාගාරයේ දුරකථනයේ 2022/08/16-2022/09/15 දක්වා බිල්පත ගෙවීම. | 576.77 |
| ඔක්:19 | 1597 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123540 දරණ WIFI රවුටරයේ 2022 සැප්තැම්බර් මස බිල්පත ගෙවීම. | 1,081.93 |
| ඔක්:19 | 1598 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123539 දරණ WIFI රවුටරයේ 2022 සැප්තැම්බර් මස බිල්පත ගෙවීම. | 1,081.93 |
| ඔක්:19 | 1599 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123538 දරණ WIFI රවුටරයේ 2022 සැප්තැම්බර් මස බිල්පත ගෙවීම. | 1,081.93 |

| | | | |
|---|---|---|---|
| ඔක්:19 | 1600 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු:අ:-036-2222575 දරණ කාර්යාලීය දුරකථනයේ 2022 සැප්තැම්බර් මස බිල්පත ගෙවීම. | 11,116.15 |
| ඔක්:19 | 1601 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123537 දරණ WIFI රවුටරයේ 2022 සැප්තැම්බර් මස බිල්පත ගෙවීම. | 1,081.93 |
| ඔක්:19 | 1602 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු. අ.036-2222534 දරණ ගරු සභාපතිතුමාගේ කාර්යාලීය දුරකතනයේ 2022 සැප්තැම්බර් මස බිල්පත ගෙවීම. | 9,286.81 |
| ඔක්:19 | 1603 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/003/001/18 දරණ දෙහිඕවිට පැරණි ප්‍රා/සභා කාර්යාලයේ 2022/09/04-2022/10/04 දක්වා බිල්පත ගෙවිම. | 1,630.31 |
| ඔක්:19 | 1604 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/067/174/14 දරණ ඊ/ආදාහනාගාරයේ 2022/08/23-2022/09/21 දක්වා බිල්පත ගෙවිම. | 826.29 |
| ඔක්:19 | 1605 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/002/054/16 දරණ දෙහිඕවිට පොදු ජල කණුවේ 2022/09/03-2022/10/03 දක්වා බිල්පත ගෙවිම. | 2,997.91 |
| ඔක්:19 | 1606 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/002/073/13 දරණ දෙහිඕවිට පොදු ජල කණුවේ 2022/09/04-2022/10/04 දක්වා බිල්පත ගෙවිම. | 461.74 |
| ඔක්:19 | 1607 | දේශීය ණය සහ සංවර්ධන අරමුදල<br>තල්දුව පොදු වෙළද සංකීරණය ඉදිකිරීමට දේශිය ණය සංවර්ධන අරමුදලෙන් ලබා ගත් ණය මුදලේ මුදල හා පොළී මුදල ගෙවීම.(2022 සැප්තැම්බර් සඳහා) | 156,136.31 |
| ඔක්:19 | 1608 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/003/035/18 දරණ දෙ/ පොදු ජල කණුවේ 2022/09/09-2022/10/08 දක්වා බිල්පත ගෙවිම. | 346.10 |
| ඔක්:19 | 1609 | මු.හා.ක-කේ.කේ.එස්.ජයරුක්ෂි<br>2022 සැප්තැම්බර් මස අතිකාල ගෙවීම. | 975.41 |
| ඔක්:19 | 1610 | මු.හා.ක-ඊ.පී.එස්.සමන්ලතා- සංග්‍රහ වියදම් ගෙවීම. | 700.00 |
| ඔක්:19 | 1611 | මු.හා.ක-බී.ඩී.ටී.ටී.ප්‍රේමරත්න- ගමන් වියදම් ගෙවීම. | 5,000.00 |
| ඔක්:19 | 1612 | මු.හා.ක-ජී.ආර්.චන්ද්‍රකුමාර<br>පළාත් පාලන නායකත්ව සමුළුවට සහභාගි වීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1,500.00 |
| ඔක්:19 | 1613 | මු.හා.ක-ඩී.ජී.එස්.සී.කේ.පියරත්න<br>පළාත් පාලන නායකත්ව සමුළුවට සහභාගි වීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1,500.00 |
| ඔක්:19 | 1614 | එල්.එම්.ඩී.දමයන්ති විජේසිංහ<br>2022/10/11 දින පැවති මහා සභා රැස්වීමේ සංග්‍රහ කටයුතු වෙනුවෙන් මුදල් ගෙවීම. | 74,300.00 |

| | | | |
|---|---|---|---|
| ඔක්:21 | 1615 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>2022 ඔක්තොම්බර් මස දෙ/ප්‍රා/සභාවේ ස්ථිර සේවක වැටුප් ගෙවීම. | 3,414,223.00 |
| ඔක්:21 | 1616 | මධ්‍යම පරිසර අධිකාරිය<br>දෙ/ඊරියගොල්ල ආදාහනාගාරය සඳහා පරිසර බලපත්‍ර ලබා ගැනීමට බලපත්‍ර ගාස්තු ගෙවීම. | 5,000.00 |
| ඔක්:21 | 1617 | ගොඩගම්පල ගොවි සංවිධානය<br>හිඟුරලකන්ද ගොඩගම්පල දක්වා ඇති මාර්ගයේ ඩබල් බෝක්කුව අසලින් පහළට දිවෙන කටුවලකන්ද හොරගොල්ල මාර්ගය කොන්ක්‍රීට් කිරීම 30% රැඳවුම් මුදල් ගෙවීම. | 148,500.00 |
| ඔක්:21 | 1618 | එච්.එස්.එල්.වීරසිංහ<br>දෙ/ප්‍රා/සභාවේ මුද්‍රා 02ක් සෑදීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1,000.00 |
| ඔක්:21 | 1619 | එච්.එස්.එල්.වීරසිංහ<br>ඉඹුල්පිටිය පුස්තකාලයේ දින මුද්‍රාව සෑදීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 250.00 |
| ඔක්:21 | 1620 | K M S ඔටෝ කෙයාර්<br>PF7369 කැබ් රථය සේවා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 34,692.00 |
| ඔක්:21 | 1621 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 7921106404 දරණ දෙ/ම/පුස්තකාලයේ(E-library) 2022/09/14-2022/10/12 දක්වා බිල්පත ගෙවීම. | 1,460.00 |
| ඔක්:21 | 1622 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:6316208308 දරණ දිගලවත්ත කසල මධ්‍යස්ථානයේ 2022/09/08-2022/10/11 දක්වා බිල්පත ගෙවීම. | 3,385.00 |
| ඔක්:21 | 1623 | එම්.එම්.එම්.ෆයිසාන්<br>ජලය ලබා ගැනීම සඳහා මාර්ගය පළුදු කිරීම වෙනුවෙන් තැන්පත් කල මුදල් ආපසු ගෙවීම. | 5,700.00 |
| ඔක්:21 | 1624 | පී.ඒ.ඩී.පනම්බර<br>ලංකා IOC අයදුම්පත සම්පූර්ණ කිරීමට හා අදාල නීති උපදේශන සේවාව ලබා දීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 7,500.00 |
| ඔක්:21 | 1625 | මු.හා.ක-ආර්.ඒ.යූ.එන්.රණසිංහ<br>නිවාඩු දින සේවයෙහි දීමනා ගෙවීම. | 7,179.00 |
| ඔක්:21 | 1626 | මු.හා.ක-ආර්.ඒ.යූ.එන්.රණසිංහ- ගමන් වියදම් ගෙවීම. | 6,000.00 |
| ඔක්:21 | 1627 | මු.හා.ක-ආර්.ජී.එස්.එස්.වික්‍රමාරච්චි- ගමන් වියදම් ගෙවීම. | 5,600.00 |
| ඔක්:21 | 1628 | බෝමළුව රාජසිංහ වැඩිහිටි සමිතිය<br>ඔරුකන්ද වත්ත අතුරු මාර්ගයේ දුෂ්ර ස්ථාන සංවර්ධනය කිරීම 30% රැඳවුම් මුදල් ගෙවීම. | 148,500.00 |
| ඔක්:21 | 1629 | බෝමළුව රාජසිංහ වැඩිහිටි සමිතිය<br>විහාරවත්ත මාර්ගයේ කොන්ක්‍රීට් කර අවසන් කල ස්ථානයේ සිට ඉදිරියට සංවර්ධනය කිරීම කර්මාන්තයේ 30% රැඳවුම් මුදල් ගෙවීම. | 148,500.00 |
| ඔක්:21 | 1630 | කීර්ති ශ්‍රී රාජසිංහ වැඩිහිටි සමිතිය-විහාරකන්ද<br>කොස්හේන මාර්ගයේ ගයාන් මයාගේ නිවස අසල සිට දුෂ්කර ස්ථාන සංවර්ධනය කිරීම 10% රැඳවුම් මුදල් ගෙවීම. | 47,897.14 |

| | | | |
|---|---|---|---|
| ඔක්:21 | 1631 | කීර්ති ශ්‍රී රාජසිංහ වැඩිහිටි සමිතිය-විහාරකන්ද<br>පන්සල පහල නිමල් මයාගේ නිවස අසල මාර්ගය දුශ්කර ස්ථාන සංවර්ධනය කිරීම 10% රුදවුම් මුදල් ගෙවීම. | 49,500.00 |
| ඔක්:21 | 1632 | සුළු ගොවි සංවිධානය-හිඟුරලකන්ද නැගෙනහිර<br>හිඟුරලකන්ද අලවලවත්ත මාර්ගයේ දුශ්කර ස්ථාන සංවර්ධනය කිරීම 30% රුදවුම් මුදල් ගෙවීම. | 148,500.00 |
| ඔක්:21 | 1633 | විහාරකන්ද ගොවි සංවිධානය<br>පරණ සමූපාකාරය අසල මාර්ගයේ ස්වර්ණලතා මහත්මියගේ නිවස අසල සිට ඉදිරියට මාර්ගය සංවර්ධනය කිරීම 30% මුදල් ගෙවීම. | 148,500.00 |
| ඔක්:21 | 1634 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ආයුර්වේද ජංගම සායනයේ සංග්‍රහ සඳහා ලබාගත් අත්තිකාරම් මුදල් පියවීම.(No Cash) | 2,720.00 |
| ඔක්:21 | 1635 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>රියදුරු පුහුණු කටයුතු සඳහා ක්‍රීඩා පිටිය ලබාදීම වෙනුවෙන් තැන්පත් කල මුදල් ආදායමට ගැනීම.(No Cash) | 23,000.00 |
| ඔක්:21 | 1636 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>වෙළඳ ප්‍රදර්ශනයක් හා සැණකෙලියක් සඳහා ක්‍රීඩා පිටිය ලබාදීම වෙනුවෙන් තැන්පත් කල මුදල් ආදායමට ගැනීම.(No Cash) | 30,000.00 |
| ඔක්:21 | 1637 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ශ්‍රවණාගාරය කුලියට ලබාදීම වෙනුවෙන් තැන්පත් කල මුදල් ආදායමට ගැනීම.(No Cash) | 20,000.00 |
| ඔක්:21 | 1638 | මු.හා.ක-එච්.පී.පී.සමන් කුමාර<br>PF7369 කැබ් රථය සඳහා ඩීසල් 50L ක් ලබා ගැනීමට වියදම් වූ මුදල් ලබා ගැනීම. | 20,750.00 |
| ඔක්:21 | 1639 | මු.හා.ක-කේ.පී.රාජපක්ෂ<br>දිගලවත්ත තේ/රබර් අස්වැන්නෙන් 50% ක් ගෙවීම. | 7,050.00 |
| ඔක්:25 | 1640 | එකමුතු වැඩිහිටි සංවිධානය-ඉහළ තල්දුව<br>මානියම්ගම නාහැල්ම මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ රුදවුම් මුදල් ගෙවීම.(10%) | 94,734.99 |
| ඔක්:25 | 1641 | විමල් ඇග්‍රෝ ට්‍රැක්ටර්ස් ප්‍රයිවට් ලිමිටඞ්<br>RD8018 දරණ ට්‍රැක්ටරයට ඩීසල් මූඩිය ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,280.00 |
| ඔක්:25 | 1642 | එල්.එම්.ඩී.දමයන්ති විජේසිංහ<br>2022/09/15 දින පැවති ආදායම් ප්‍රවර්ධන පුහුණුව සඳහා සංග්‍රහ කටයුතු වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,500.00 |
| ඔක්:25 | 1643 | නීතිඥ සුමිත්‍රා දමයන්ති<br>අවි/වේල්ල දිසා අධිකරණ 29299/L නඩුව වෙනුවෙන් 2022/08/29 දින පෙනී සිටීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 3,000.00 |
| ඔක්:25 | 1644 | නීතිඥ බුද්ධික කේ.පියරත්න<br>2022/08/09 දින අධිකරණයේ පෙනී සිටීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 7,500.00 |

| | | | |
|---|---|---|---|
| ඔක්:25 | 1645 | නීතිඥ එච්.ආර්.අනුර ජයසිරි<br>2022/09/20 දින අධිකරණයේ පෙනී සිටීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 3,500.00 |
| ඔක්:25 | 1646 | නීතිඥ විජය නන්ද පත්මසිරි<br>අවි/වෙල්ල දිසා අධිකරණ 70326(66)L නඩුව වෙනුවෙන් 2022/06/21 හා 2022/07/12 දිනයන්හි පෙනී සිටීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 10,000.00 |
| ඔක්:25 | 1647 | පී.ඒ.ගුණරත්න<br>කතෘ ප්‍රකාශන මිලදී ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 9,900.00 |
| ඔක්:25 | 1648 | සී/ස රුවන්වැල්ල විවිධසේවා සමූපකාර සමිතිය<br>සෞඛ්‍ය අංශයේ අවශ්‍යතාවය සඳහා ලබාගත් සෞඛ්‍ය හා සනීපාරක්ෂක ද්‍රව්‍ය වෙනුවෙන් මුදල් ගෙවීම. | 39,910.00 |
| ඔක්:25 | 1649 | බෙස්ට් වේ කොම්පියුටර්ස්<br>ආර්.එම්.එච්.රත්නායක මියගේ පරිගණකයේ මොනිටර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,800.00 |
| ඔක්:25 | 1650 | බෙස්ට් වේ කොම්පියුටර්ස්<br>2700 Brother ප්‍රින්ටර් සඳහා ටෝනර් 03ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 25,500.00 |
| ඔක්:26 | 1651 | Y N P ට්‍රාන්ස්පෝර්ට්<br>දිගලවත්ත ප්‍රිමික්ස් අංගනය සඳහා වැලි කියුබ් 01ක් මිලදී ගැනීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 17,000.00 |
| ඔක්:27 | 1652 | ජේ.එන්.බී.ඔටෝ ට්‍රේඩර්ස්<br>RE2258 ට්‍රැක්ටරයේ ටේලර් එකේ හයිඩොලික් ජැක් පොම්පය ලබාගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 30,000.00 |
| ඔක්:27 | 1653 | මු.හා.ක-එච්.ඒ.ආර්.එස්.තිලකරත්න<br>සංග්‍රහ වියදම් ගෙවීම. | 4,840.00 |
| ඔක්:27 | 1654 | මු.හා.ක-එච්.ඒ.ආර්.එස්.තිලකරත්න<br>ගමන් වියදම් ගෙවීම. | 911.80 |
| ඔක්:27 | 1655 | මු.හා.ක-ඩී.එම්.එන්.එන්.දිසානායක<br>සංග්‍රහ වියදම් ගෙවීම.(2022/10/11 මහා සභාවේ) | 5,355.00 |
| ඔක්:28 | 1656 | ටෙස්මි ඉලෙක්ට්රිකල්ස්<br>දිගලවත්ත කසළ මධ්‍යස්ථානයේ බේල් යන්ත්‍රය සවිකිරීමට අවශ්‍ය විදුලි උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 31,813.00 |
| ඔක්:28 | 1657 | ඩබ්.එම්.අයි.ශිරන්ත කුමාර<br>දිගලවත්ත කසළ මධ්‍යස්ථානයේ බේල් කුට්ටි සැකසීමට අවශ්‍ය G.I කම්බි 250kg ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 199,250.00 |
| ඔක්:28 | 1658 | මු.හා.ක-කේ.ජී.පී.එල්.සෝමවීර- ගමන් වියදම් ගෙවීම. | 2,230.00 |
| ඔක්:28 | 1659 | මු.හා.ක-කේ.එම්.ඒ.ජේ.එන්.සිරිසේන- ගමන් වියදම් ගෙවීම. | 2,230.00 |
| ඔක්:28 | 1660 | මු.හා.ක-එච්.ඩී.ටී.පෙරේරා- ගමන් වියදම් ගෙවීම. | 7,080.00 |

| | | | |
|---|---|---|---|
| ඔක්:28 | 1661 | මු.හා.ක-එච්.පී.පී.සමන් කුමාර<br>PF7369 කැබ් රථය සඳහා ඩීසල් 50L ක් ලබා ගැනීමට වියදම් වූ මුදල් ලබා ගැනීම. | 20,750.00 |
| ඔක්:31 | 1662 | කෑගල්ල ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>ඊ/ආදාහනාගාරයට ගෑස් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 86,720.00 |
| ඔක්:31 | 1663 | කේ.කේ.ඒ.ආර්.කුමාරසිංහ<br>දෙහිඕවිට ප්‍රා/සභාවේ වාහන සඳහා 2022 සැප්තැම්බර් මස ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 642,715.00 |
| | | | **9,855,587.13** |
| ඔක්:07 | 18 | සේවක ණය- එම්.සී.පී.කුමාරි<br>ආපදා ණය අත්තිකාරම් ගෙවීම. | 250,000.00 |
| ඔක්:07 | 19 | සේවක ණය- යූ.එල්.ජී.ජයතිලක<br>ආපදා ණය අත්තිකාරම් ගෙවීම. | 82,500.00 |
| ඔක්:21 | 20 | සේවක ණය- කේ.කුමාර්<br>උත්සව අත්තිකාරම් ගෙවීම.(දීපවාලී) | 10,000.00 |
| ඔක්:27 | 21 | සේවක ණය- ඩබ්.ඒ.ඩී.කොඩිකාර<br>ආපදා ණය අත්තිකාරම් ගෙවීම. | 99,145.00 |
| | | **එකතුව** | **10,297,232.13** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා:**

ඔක්: 05 වෙනි දින වවුචර් අංක 1511 යටතේ ගරු සභාපතිතුමාගේ ගමන් වියදම් ලෙස රු.8000.00 ක මුදලක් ගෙවා තිබෙන බවත් ගරු සභාපතිතුමාට නිල රථයක් සහ ඉන්ධන හිමි වන බැවින් මේ ආකාරයට අමතරව ගමන් වියදම් ලෙස මුදල් ගෙවීම සම්බන්ධයෙන් විමසා සිටින ලදී.

(ගරු මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 09.51)

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙය සභාපතිවරුන්ට හිමි වන දීමනාවක් බවත් තම නිල රථය වෙනුවෙන් ධාවන සටහන් භාවිතා කරන බවත් බල ප්‍රදේශයෙන් පිට පැය 05 කට වඩා කාලයක් ගමන් කළ විට එය ලබා ගැනීමේ හැකියාව ඇති බවත් පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

එය ගමන් වියදම් නොවන බවත් සංයුක්ත දීමනා ලෙස සංශෝධනය විය යුතු බවත් පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මාසික වියදම් ලේඛනයට එය ඇතුලත් කිරීමේදී ගමන් වියදම් ලෙස සඳහන්ව ඇති බවත් එය සංයුක්ත දීමනා ලෙස නිවැරදි විය යුතු බැවින් එය නිවැරදි කිරීමට කටයුතු කරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා:**

එසේම 2022.10.11 දින මහා සභා රැස්වීම පැවැත්වෙන අතරතුර තේ පැන් සංග්‍රහයක් පමණක් හිමි වූ බවත් වවුචර් අංක 1614 යටතේ මහා සභා රැස්වීමේ සංග්‍රහ වියදම් වෙනුවෙන් රු. රු.74,300.00 ක මුදලක් සහ නැවතත් වවුචර් අංක 1655 යටතේ 2022.10.11 මහා සභාවේ සංග්‍රහ වියදම් ලෙස රු. 5,355.00 ක මුදලක් ගෙවා ඇති බවත් වවුචර් අංක 1653 යටතේත් සංග්‍රහ වියදම් ලෙස ගෙවීම් සිදු කර ඇති බැවින් ඒ එක් එක් ගෙවීම් පැහැදිලිව සඳහන් කරන ලෙස ඉල්ලා සිටියේය. මෙය එදින පැවති අය වැය විවාදය හේතුවෙන් ලබා දුන් භෝජන සංග්‍රහය වෙනුවෙන් වියදම් වූ බවට ගරු සභාපතිතුමා පවසනු ඇති බවත් නමුත් අද වන විට රටේ පවතින ආර්ථික අර්බුදය හමුවේ ජනතාව පීඩාවට පත්ව ඇති අවස්ථාවක එක් මන්ත්‍රීවරයෙකු වෙනුවෙන් රු.2000.00 කට වැඩි වන ලෙස වියදම් දැරීම සදාචාර සම්පන්න නොවන බවට තමන් විශ්වාස කරන බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 09.53)

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සාමාන්‍යයෙන් අය වැය විවාදය පැවැත්වෙන දිනයේදී මන්ත්‍රීවරුන්ට අමතරව කාර්ය මණ්ඩලයේ සියළු දෙනාටත් ඒ සඳහා බාහිරින් සම්බන්ධ වන මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනාට දිවා ආහාරය ලබා දීම මේ දක්වා පැවති සෑම අය වැය විවාදයක් අවසානයේම සිදු කළ බවත් පසු ගිය වර්ෂයේදීත් එය ඒ ආකාරයෙන්ම සිදු කළ බවත් සිහිපත් කර සිටියේය.එලෙසම මේ වසරේදීත් මන්ත්‍රීවරුන්ට අමතරව කාර්ය මණ්ඩලයේ සියළුදෙනාටත් එලෙස දිවා භෝජනය ලබා දුන් බවත් ඒ සඳහා වූ වියදම මෙලෙස දක්වා ඇති බවත් පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා:**

එසේ නම් එය දිවා භෝජන සංග්‍රහය සඳහා වූ වියදම් ලෙස සඳහන් කළ යුතු බවත් නොඑසේ නම් එය තේ පැන් සංග්‍රහය වෙනුවෙන් වූ වියදම් ලෙස අවබෝධ කර ගනු ඇතැයි පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එලෙස කටයුතු කිරීමට ක්‍රියා කරන බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 09.54)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා:**

එලෙසම IOC ඉන්ධන පිරවුම්හල ව්‍යාපෘතියේ නීති උපදෙස් ලබා ගැනීම සඳහාත් රු. 7500.00ක මුදලක් වැය කර ඇති බව පෙන්වා දුන්නේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

අප ව්‍යාපෘතිය එම සමාගමට භාර දීමේදී එය සිදු කළ යුතු වන්නේ එම සමාගමේ නීතීඥවරයෙකු මාර්ගයෙන් බවත් එම නීතීඥවරයා මඟින් එම ලියවිලි පරික්ෂා කර ලබා ගැනීම සිදු කරන බැවින් එකී කර්තව්‍ය සඳහා මෙම මුදල වැය වූ බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා:**

අප විසින් මිලියන 100 ක ණය මුදලක් ලබා ගෙන මෙම ව්‍යාපෘතිය සිදු කරන්නේ නම් එලෙස එම සමාගමේ නීතිඥයන් වෙනුවෙන් මේ ආකාරයට මුදල් ගෙවීමට කටයුතු කරන්නේ කුමන හේතුවකටදැයි විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ මුදල ගෙවා ඇත්තේ අයදුම් පත්‍රය භාර දීමට බව පැහැදිලිව සඳහන් කර ඇති බවත් අයදුම් පත්‍රය තුළ NBRO වාර්තාව , පරිසර බල පත්‍රය ඇතුළු සියළු ලියවිලි නිසි ආකාරයට සම්පූර්ණ කර භාර දිය යුතු බවත් ඒවා අධීක්ෂණය කිරීම නීතිඥයෙකු මඟින් සිදු වන බවත් පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 09.56)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා:**

මෙම ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා IOC සමාගමම යොදා ගැනීමට කටයුතු කරන්නේ කුමන හේතුවක් නිසාද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

IOC සමාගමෙන් දිවයින පුරා ඉන්ධන පිරවුම්හල් ඉදි කිරීමේ ව්‍යාපෘතිය යටතේ අලුතින් ඉදි කිරීමට යෝජිත ඉන්ධන පිරවුම්හල් 50 ට දෙහිඕවිට නගරයටත් ඉන්ධන පිරවුම්හලක් ඇතුලත්ව ඇති බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා:**

සිපෙට්කෝ ආයතනය මෙම කාර්ය සඳහා බලපත්‍ර ලබා නොදෙන බවත් එලෙස සිදු නොකරන්නේ කුමන හේතුවක් නිසාද යන්නත් සිතා බැලිය යුතු බව පෙන්වා දෙන ලදී. එම නිසා අද දිනයේ මේ යෝජනාව සම්මත කරන්නේ නම් සංශෝධන සහිතව එය සිදු කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 10.00)

(සභාව ඝෝෂාකාරී)

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එය නිවැරදි කිරීමට කටයුතු කරන බව පවසා සිටියේය. පසුගිය වසරේත් මේ ආකාරයට දිවා ආහාරය ලබා දුන් බවත් ඒ අවස්ථාවේදී මේ ආකාරයට ගැටළු ඇති කිරීමට ක්‍රියා නොකළ බවත් සිහිපත් කර සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා:**

වසර 04ක් පුරා මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර එය සැලකිල්ලට නොගත්තත් නවක මන්ත්‍රීවරුන් වශයෙන් මේ වසරේ ඒ සම්බන්ධයෙන් අවධානයෙන් සිටීමේ වරදක් තමන් නොදකින බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

මෙය නිවැරදි විය යුත්තේ 2022.10.11 වෙනි දින අය වැය විවාදය පැවති දිනයේ අය වැයෙන් පසුව ලබා දුන් දිවා භෝජන සංග්‍රය වෙනුවෙන් වූ බිල්පත් ගෙවීම් ලෙස බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා:**

මෙය මහා සභා රැස්වීමේ සංග්‍රහ කටයුතු ලෙස සඳහන් කළහොත් එය මන්ත්‍රීවරුන් සඳහා පමණක් ලබා දුන් බවට හෝ තේ පැන් සංග්‍රහය වෙනුවෙන් එතරම් මුදලක් වැය වූ ලෙස වැරදි අවබෝධයක් මන්ත්‍රීවරුන් ලබා ගනු ඇති බැවින් සහ මේ ගෙවීම් පූර්වයෙන් මුදල් කාරක සභාව වෙත ඉදිරිපත් නොවූ බැවින් මුදල් ගෙවූ කාරණය පිළිබඳව අවබෝධ වන ලෙස එය සංශෝධනය කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

මේ කාරණය පිළිබඳව බුද්ධිමත් සැම සිතා බැලිය යුතු බවත් විගණන විමසුමක් උද්ගත වුවහොත් අධිභාරයක් ගෙවීමට සිදු වීමට ඉඩ ඇති බැවින් මෙය සංශෝධන කරන්නේ කෙසේද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2022.10.11 වෙනි දින අය වැය විවාදය පැවති දිනයේ අය වැයෙන් පසුව ලබා දුන් දිවා භෝජන සංග්‍රය වෙනුවෙන් වූ බිල්පත් ගෙවීම් ලෙස එය සංශෝධනය කරන බව පවසා සිටියේය.

සංශෝධිත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව සඳහා බෙදීමක් අවශ්‍ය බවට ගරු මන්ත්‍රීවරුන් විසින් ප්‍රකාශ කළ බැවින් ඒ සඳහා ඡන්දය විමසා සිටින ලදී.

<u>**යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ සභිකයින්:**</u>

1. ගරු සභාපති දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා -ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
2. ගරු උප සභාපති විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා. - ස්වාධීන මන්ත්‍රී
3. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
4. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
5. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එච්.අමරාවතී මැතිණිය. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
6. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා. - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
7. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
8. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.නිශාන් මැතිතුමා - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
9. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී සඳමාලි විජේරත්න මැතිණිය. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
10. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
11. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී සුධර්මා ලක්මාලි මැතිණිය. - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
12. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී නීතා බාලසූරිය මැතිණිය. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ

<u>**යෝජනාවට විරුද්ධ බව ප්‍රකාශ කළ සභිකයින්:**</u>

1. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා. - එක්සත් ජාතික පක්ෂය
2. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා. - එක්සත් ජාතික පක්ෂය
3. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා. - එක්සත් ජාතික පක්ෂය
4. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා. - එක්සත් ජාතික පක්ෂය
5. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කෝසල නුවන් ජයවීර මැතිතුමා - ජනතා විමුක්ති පෙරමුණ
6. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා. - ස්වාධීන මන්ත්‍රී
7. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා. - එක්සත් ජාතික පක්ෂය

ඡන්දය දීමෙන් වැලකී සිටි සභිකයින්:

1. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා. - එක්සත් ජාතික පක්ෂය
2. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා. - එක්සත් ජාතික පක්ෂය
3. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි කේ.ජී.ඒ.කේ.සුමනදාස මැතිණිය - එක්සත් ජාතික පක්ෂය
4. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ශ්‍රියානි ජයකොඩි මැතිණිය. - එක්සත් ජාතික පක්ෂය

ඡන්දය විමසන අවස්ථාවේදී සභාවේ නොසිටි සභිකයින්

1. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
2. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී යූ.ජී.සරත් විජේසිරි මැතිතුමා. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
3. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
4. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
5. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී දිස්නා වීරක්කොඩි මැතිණිය. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
6. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී තුෂාර අමරසිරි මැතිතුමා - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
7. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
8. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා. - ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ
9. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා. - එක්සත් ජාතික පක්ෂය
10. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය. - එක්සත් ජාතික පක්ෂය

මහා සභා රැස්වීම සඳහා නොපැමිණි සභිකයින්

1. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී.නයනා ප්‍රියන්ති මැතිණිය - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය

ඒ අනුව වැඩි ඡන්ද 01 කින් යෝජනාව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

අද පවතින භාණ්ඩ මිල ගණන් දෙස බැලූ විට මේ මහා සභා රැස්වීම සඳහා දිවා ආහාර වේලක් ලබා දුන්නත් සාමාන්‍යයෙන් මෙතරම් මුදලක් වැය වන බව පැවසීය. එසේ තිබියදී ඔක්තොම්බර් මස මහා සභා රැස්වීම සඳහා සහභාගී වූ මන්ත්‍රීවරුන් වශයෙන් එදින දිවා ආහාර වේල ලබා දුන් බවට අප සියළුදෙනා දන්නා බවත් එසේ දැනගෙන ඒ සඳහා සහභාගී වී මෙලෙස ගරු සභාපතිතුමා විසින් වංචා කර ඇති බවට චෝදනා කිරීම යුක්තිසහගත නොවන බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 10.05)

(සභාව සෝෂාකාරී)

(ගරු මන්ත්‍රිනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය සහ ගරු මන්ත්‍රී විකුම් චන්දන මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 10.09)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා:**

දිවා ආහාරය ලබා දුන් බව දැන දැන මේ සඳහා විරුද්ධ වන බව පැවසිම සාධාරණ නොවන බවත් විපක්ෂයක් ලෙස අප සඳහන් කළේ මේ වවුචර්පතේ සඳහන් කර ඇති කාරණය මහා සභාවේ සංග්‍රහ වියදම් සඳහා ගෙවීම් ලෙස සඳහන් වීම යෝග්‍ය නොවන බව හා එය එදින දිවා ආහාරය ලබා දීම

වෙනුවෙන් සිදු කරන ලද ගෙවීම් ලෙස සංශෝධනය කරන ලෙස බවත් පෙන්වා දෙන ලදී. එසේ නොමැතිව නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයට දිවා ආහාරයක් ලබා දීම සම්බන්ධයෙන් අපගේ විරුද්ධත්වයක් නොමැති බව පැවසීය. එසේම න්‍යාය පත්‍රය යනු නීත්‍යානුකූල ලියවිල්ලක් බවත් එහි කරුණු අනුසාරයෙන් සභා වාර්තාව සකස් වන බැවින් මේ න්‍යාය පත්‍රයට කරුණු ඇතුලත් කිරීමේදි එය නිසි ආකාරයෙන් පරීක්ෂා කර බලන ලෙසත් ඉල්ලා සිටියේය.

(ගරු මන්ත්‍රී තුෂාර සංජීව මැතිතුමා සභාවට පැමිණෙන ලදි.පෙ:ව: 10.11)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

මෙය සිදු වන ආකාරය අප දන්නා බවත් සාමාන්‍යයෙන් දිවා ආහාර වේලක් ලබා දීම සිදු කරන බවත් එය සිදු වූ ආකාරය විනිවිදභාවයෙන් යුක්තව සඳහන් නොවීම නිසා උද්ගත විය හැකි ගැටළු පෙන්වා දෙමින් එය නිවැරදි විය යුතු ආකාරය පමණක් පෙන්වා දුන් බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 10.12)

(සභාව ඝෝෂාකාරී)

(ගරු මන්ත්‍රී කේ. නිශාන් මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී.පෙ:ව: 10.14)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකුම් චන්දන මැතිතුමා:**

එම ගෙවීම් විස්තර වල වවුචර් අංක 1655 යටතේත් මහා සභාවේ සංග්‍රහ වියදම් ලෙස රුපියල් 5355.00 ක මුදලක් සඳහන් වී ඇති බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එම මාසයේ කාරක සභා රැස්වීම් පැවැත්වීමට අදාල ගෙවීම්ද මාසික ගෙවීම් විස්තර යටතේ සඳහන්ව ඇති බවත් මෙය පරීක්ෂා කර බලා පවසන බවත් ප්‍රකාශ කර සිටියේය. වවුචර් පත් ලිවීමේදී අදාල කරුණු පැහැදිලිව සඳහන් කරන ලෙස විෂය නිලධාරීන්ට උපදෙස් ලබා දීමට තමන් ක්‍රියා කරන බවත් එසේ නොවූ විට අනවශ්‍ය ලෙස ගැටළු සහගත තත්ව උද්ගත වන බව පැවසූ එතුමා මාසික ගෙවීම් ලේඛනයේ අඩංගු කරුණු පැහැදිලිව දැක්වීමට ඉදිරියේදී ක්‍රියා කරන බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී කේ.නිශාන් මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 10.18)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

තමන් දන්නා අකාරයට මේ සභාවේ සම්ප්‍රදායක් පවතින බවත් හිටපු සභාපතිවරුන්ගේ කාලයේදී පවා මේ ආකාරයට දිවා භෝජන ලබා දුන් බවත් නමුත් ඒවා සඳහා අනුග්‍රහය ඔවුන් විසින් සිදු කළ බවත් සභා අරමුදලෙන් ඒ සඳහා මුදල් වියදම් කර නොමැති බවත් පවසා සිටියේය. අද දින ඉදිරිපත් කර ඇති ගෙවීම් විස්තර වල එකම දිනයේ මහා සභාවේ සංග්‍රහ කටයුතු සඳහා ලෙස මුදල් ගෙවීම් කීපයක් සිදු කර ඇති බැවින් ඒ සම්බන්ධයෙන් විමසීමට සිදු වූ බව පවසා සිටියේය. එසේ නොමැතිව අනාගතයේ යම් දිනක මේ කාර්යන් විගණනයට ලක්ව අධි භාර ගෙවිමට සිදු වුවහොත් එයට මේ සභාවාරය නියෝජනය කළ සියළුම මන්ත්‍රීවරුන් අයත් වන බව පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 10.22)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

එසේ බැලූ විට මාසයක් පුරා සභාවේ සිදු කරන ලද ගෙවීම් වල විස්තර දැක්වෙන මේ ලියවිල්ලේ වවුචර් පත් අංක 1653 හා 1655 යටතේත් සංග්‍රහ වියදම් සඳහා ගෙවීම් සිදු කර ඇති බවත් පෙන්වා දෙන ලදී. මේ සියළු ගෙවීම් අදාල කාර්යක් වෙනුවෙන් සිදු කරන ලද ගෙවීම් බවත් ඇතැම් අවස්ථා වල ලේඛන මුද්‍රණය කිරීමේදී මුද්‍රණ දෝෂ සිදු වීම සාමාන්‍ය කරුණක් බවත් පවසා සිටියේය. එලෙස බැලීමේදී තමන් විසින් පෞද්ගලිකව ලියන ලද ලිපියක් නැවත නැවත පරික්ෂා කිරීමේදී ඒවායේත් ඕනෑතරම් දෝෂ තිබිය හැකි බවත් මේවා සකස් කරන පුද්ගලයන් විශ්වකර්ම කාර්යන් සිදු කරන අයවරුන් නොවන බවත් පැවසූ එතුමා ගරු සභාපතිතුමා විසින් යෝජනාවට අවශ්‍ය සංශෝධනය ඇතුලත් කිරීමට එකඟ වූ බැවින් නැවත නැවත ඒ සම්බන්ධයෙන් කතා කිරීම සභාවේ වටිනා කාලය විනාශ කර දැමීමක් බව පවසා සිටියේය.

**01.(iii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අක්කර බදු සත්‍යාක්ෂණයේදී අනාවරණය වූ කහනාවිට , එළුවාන යන වසම්වල කිසිදු තොරතුරක් සොයාගත නොහැකි වූ දේපල, නිශ්චිත භූමි ප්‍රමාණය නොමැති වූ දේපල, දේපල නම සහ භූමි ප්‍රමාණය ලේඛනයේ සඳහන් නොවූ දේපල , බෙදුම් නඩු පවතින බැවින් ගෙවීම් ප්‍රතික්ෂේප කරන දේපල යන කාරණා මත ඇමුණුම 03 හි සඳහන් දේපල අක්කර බදු ලේඛනයෙන් 2022.12.31 දින දක්වා ඇති ශේෂයන් කපා හැරීමත් සුදුසු යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.අමරාවතී මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (iv) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2018 වර්ෂයේදී සිදු කරන ලද නව වරිපනම් තක්සේරුව 2023 වර්ෂයේ සිට පිළි ගැනීම හා ක්‍රියාත්මක කිරීම සඳහා 2022.10.11 දින පැවති මහා සභාවේදී තීරණ 01 (xii) යටතේ මහා සභා අනුමැතිය හිමි විය. එසේ වුවද සබරගමුව පළාත් ආණ්ඩුකාරතුමාගේ නියෝගයට අනුව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GS/ES/6/14/3/11 හා 2022.10.13 දිනැති ලිපිය මඟින් රටේ පවතින උද්ධමනය හා මහජනතාවට මුහුණ දීමට සිදුව ඇති ආරථික දුෂ්කරතාවය මත නව දේපල තක්සේරු කිරීම අනුව වරිපනම් බදු පනවා අය කිරීම 2023.12.31 දින දක්වා කල් දැමීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත. ඒ අනුව 2022.10.11 දින පැවති මහා සභාවේදී තීරණ 01 (xii) යටතේ පනවන ලද නව වරිපනම් තක්සේරුව ක්‍රියාත්මක කිරීමේ යෝජනාව පරිච්ඡින්න කිරීම සුදුසු බව යෝජනා කරමි.
(මෙම යෝජනාවට ගරු සභාපතිතුමාට අමතරව ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා, ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකුම් වන්දන මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. අබේසේන මැතිතුමා විසින් අත්සන් කර භාර දී ඇත)

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව:10: 26)

**01 (v) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

<u>2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම</u>

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ දෙහිඕවිට ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ

යැයි ප්‍රකාශයට පත් කර ඇති පහත උපලේඛන අංක (i) යටතේ වන ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැඟිලි වල, ඉඩම් වල , ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2022 වර්ෂය සඳහා වූ තක්සේරුව / සතොයක්ෂණය 2023 වර්ෂය සඳහා තක්සේරුව / සතොයක්ෂණය ලෙස සම්මත කළ යුතු බවටත් එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ134 (1) වන උප වගන්තිය ප්‍රකාර එකී දේපල මත උපලේඛන අංක (i) හි සඳහන් වන ආකාරයට ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් 2%, 3%, 4%, 6%, 7% වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තව ද, 2023 වර්ෂයෙහි පහත උප ලේඛන අංක (ii) හි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද දෙහිඕවිට ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2023 වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක ( 10%) වට්ටමක් ද, එකී උප ලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල දෙහිඕවිට ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදාළ මුදලින් 5% ක වට්ටමක් ද ලබා දීමටයෝජනා කරමි.

<u>උප ලේඛනය (i)</u>

1964/06/26 දිනැති අංක 14080 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලවීඇති දෙහිඕවිට සුලු නගර සභා බල ප්‍රදේශයේ,

| | |
|---|---|
| කොට්ඨාශ අංක 01 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 940 - 1000 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 01 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 1000/1-1000/17 දක්වා | 6% |
| කොට්ඨාශ අංක 01 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 1002 -1070/1 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 01 - අවිස්සාවේල්ල පාර/දකුණ - තක්සේරු අංක 1084 -1084/3 දක්වා | 6% |
| කොට්ඨාශ අංක 01 - දංගොල්ල පාර/වම - තක්සේරු අංක 3 -65/1 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 01 - දංගොල්ල පාර/දකුණ - තක්සේරු අංක 8 -32 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 01 -දංගොල්ල පාර/දකුණ - තක්සේරු අංක 32/5 -62 දක්වා | 6% |
| කොට්ඨාශ අංක 01 - ගුරුගල්ලපාර/වම - තක්සේරු අංක 1-95 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 01 - ගුරුගල්ල පාර/වම - තක්සේරු අංක 97-165/5 දක්වා | 6% |
| කොට්ඨාශ අංක 01 - ගුරුගල්ල පාර/වම - තක්සේරු අංක 175-255 දක්වා | 4% |
| කොට්ඨාශ අංක 01 - මුස්ලිම් පල්ලිය පාර/වම - තක්සේරු අංක 3-37 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 01 - මුස්ලිම් පල්ලිය පාර/දකුණ- තක්සේරු අංක 6-38/14 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 01 - සීතා විද්‍යාලපාර/වම - තක්සේරු අංක 3-61 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 01 - සීතා විද්‍යාල පාර/දකුණ- තක්සේරු අංක 4-58/1 දක්වා | 7% |

| | |
|---|---|
| කොට්ඨාශ අංක 02 - අවිස්සාවේල්ල පාර/වම - තක්සේරු අංක 611-843/ඒ දක්වා | 6% |
| කොට්ඨාශ අංක 02 - අවිස්සාවේල්ල පාර/වම -තක්සේරු අංක 849 -1019/10 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 02 - අවිස්සාවේල්ල පාර/වම -තක්සේරු අංක 1019/16 -1019/24 ඒ දක්වා | 6% |
| කොට්ඨාශ අංක 02 - අවිස්සාවේල්ල පාර/වම -තක්සේරු අංක 1019/26 -1047 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 02 - අවිස්සාවේල්ල පාර/වම -තක්සේරු අංක 1047/7-1047/38 දක්වා | 6% |
| කොට්ඨාශ අංක 02 - අවිස්සාවේල්ල පාර/වම -තක්සේරු අංක 1049 -1087/ඒ දක්වා | 7% |
| කොට්ඨාශ අංක 02 - සුගතාරාම පාර/වම -තක්සේරු අංක 1-25 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 02 - සුගතාරාම පාර/වම -තක්සේරු අංක 31- 41/3 දක්වා | 4% |
| කොට්ඨාශ අංක 02 - සුගතාරාම පාර/දකුණ -තක්සේරු අංක 8/16-11 දක්වා | 7% |

| | |
|---|---|
| කොට්ඨාශ අංක 02 - සුගතාරාම පාර/දකුණ -තක්සේරු අංක 26 -30 දක්වා | 6% |
| කොට්ඨාශ අංක 02 - සුගතාරාම පාර/දකුණ -තක්සේරු අංක 32 - 40 දක්වා | 4% |
| | |
| කොට්ඨාශ අංක 03 - අවිස්සාවේල්ල පාර/දකුණ -තක්සේරු අංක 644 - 844 දක්වා | 4% |
| කොට්ඨාශ අංක 03 - අවිස්සාවේල්ල පාර/දකුණ -තක්සේරු අංක 844/2 - 844/5 දක්වා | 6% |
| කොට්ඨාශ අංක 03 - අවිස්සාවේල්ල පාර/දකුණ -තක්සේරු අංක 844/8 - 844/10 දක්වා | 4% |
| කොට්ඨාශ අංක 03 - අවිස්සාවේල්ල පාර/දකුණ -තක්සේරු අංක 850 - 868 දක්වා | 6% |
| කොට්ඨාශ අංක 03 - අවිස්සාවේල්ල පාර/දකුණ -තක්සේරු අංක 872 - 932 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 03 - ගුරුගල්ල පාර/දකුණ -තක්සේරු අංක 2 - 100 බී දක්වා | 7% |
| කොට්ඨාශ අංක 03 - ගුරුගල්ල පාර/දකුණ -තක්සේරු අංක 102 -310 දක්වා | 6% |
| | |
| කොට්ඨාශ අංක 04 - අවිස්සාවේල්ල පාර/දකුණ -තක්සේරු අංක 78 - 338 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 04 - අවිස්සාවේල්ල පාර/දකුණ -තක්සේරු අංක 342 - 408 ඒ දක්වා | 6% |
| කොට්ඨාශ අංක 04 - අවිස්සාවේල්ල පාර/දකුණ -තක්සේරු අංක 408 /1 - 636/1 දක්වා | 4% |
| කොට්ඨාශ අංක 04 - පිරිවෙන පාර/වම -තක්සේරු අංක 1-103 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 04 - පිරිවෙන පාර/දකුණ -තක්සේරු අංක 2 -114 දක්වා | 7% |
| | |
| කොට්ඨාශ අංක 05 - අවිස්සාවේල්ල පාර/දකුණ -තක්සේරු අංක 2-76/6 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 05 - ගිණිගත්හේනපාර/වම -තක්සේරු අංක 1 - 401 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 05 - පිරිවෙනපාර/වම -තක්සේරු අංක 113 -273 දක්වා | 7% |
| | |
| කොට්ඨාශ අංක 05 - පිරිවෙනපාර/වම -තක්සේරු අංක 275 -345 දක්වා | 6% |
| කොට්ඨාශ අංක 05 - පිරිවෙනපාර/දකුණ -තක්සේරු අංක 116 -276 දක්වා | 7% |
| | |
| කොට්ඨාශ අංක 06 - අවිස්සාවේල්ල පාර/වම -තක්සේරු අංක 7-83/2 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 06 - දැරණියගල පාර/වම -තක්සේරු අංක 3-173/4 දක්වා | 6% |
| කොට්ඨාශ අංක 06 - දැරණියගල පාර/දකුණ -තක්සේරු අංක 10-80 දක්වා | 6% |
| කොට්ඨාශ අංක 06 - ගිණිගත්හේන පාර/දකුණ -තක්සේරු අංක 2-380 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 06 - කනංගම පාර/දකුණ -තක්සේරු අංක 6-28/12 දක්වා | 7% |
| | |
| කොට්ඨාශ අංක 07 - අවිස්සාවේල්ල පාර/වම -තක්සේරු අංක 85-287/2/බී දක්වා | 7% |
| කොට්ඨාශ අංක 07 - අවිස්සාවේල්ල පාර/වම -තක්සේරු අංක 287/3-605 දක්වා | 6% |
| කොට්ඨාශ අංක 07 - අල්ගොඩ පාර/වම -තක්සේරු අංක 1-51 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 07 - අල්ගොඩ පාර/වම -තක්සේරු අංක 71-171 දක්වා | 6% |
| කොට්ඨාශ අංක 07 - අල්ගොඩ පාර/දකුණ -තක්සේරු අංක 4-32 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 07 - අල්ගොඩ පාර/දකුණ -තක්සේරු අංක 34-168 දක්වා | 6% |
| කොට්ඨාශ අංක 07 - ඇහැලියගොඩ පාර/වම -තක්සේරු අංක 3-181 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 07 - ඇහැලියගොඩ පාර/දකුණ -තක්සේරු අංක 106-132 දක්වා | 7% |
| කොට්ඨාශ අංක 07 - මල් වරුෂාව තිඹිරිපොල පාර/වම -තක්සේරුඅංක 11-21 දක්වා | 6% |
| කොට්ඨාශ අංක 07 - මල් වරුෂාව තිඹිරිපොල පාර/වම - තක්සේරුඅංක 27- 41 දක්වා | 4% |

කොට්ඨාශ අංක 07 - මල් වරුෂාව තිඹිරිපොල පාර/දකුණ -තක්සේරුඅංක 6 - 100/17 දක්වා 6%
කොට්ඨාශ අංක 07 - ක්‍රීඩා පිටිය පාර/දකුණ -තක්සේරු අංක 2-22/4 දක්වා 7%

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 134 (1) යටතේ කෑගල්ලප්‍රාදේශිය පළාත් පාලන කොමසාරිස් තුමාගේ අංක සී/4 හා 1988/07/04 දින අනුමත කළ දියුණුප්‍රදේශ,

i. මාදොල - අවිස්සාවේල්ල-රත්නපුර පාරේ 61/1 බෝක්කුවේ සිට 62/3 බෝක්කුව දක්වා දම්වැල් 02 ක් - 7%
ii. (පනාවල) - දෙහිඕවිට-ඇහැලියගොඩ පාරේ 0/5 බෝක්කුවේ සිට 62/3 බෝක්කුව දක්වා දම්වැල් 02 ක් -3%
iii. (නාපාවල) -තල්දූව - ගුරුගල්ල පාරේ 2/3 බෝක්කුවේ සිටදයිගල දෙසට 1/6 බෝක්කුව දක්වාමුස්ලිම් පල්ලිය පාරේ දම්වැල් 02 ක් - 2%
iv.මාගම්මන - අවිස්සාවේල්ල - ගිනිගත්හේන පාරේ 11/3 බෝක්කුවේසිට 14/2 දක්වා දම්වැල් 02 ක් - 4%
v. දෙල්ඔලුව - දෙහිඕවිට - දැරණියගල පාරේ 8 වෙනි කිලෝ මීටර්කනුවේ සිට 9/8 බෝක්කුව දක්වා දම්වැල් 02 ක් - 4%

<u>උප ලේඛනය (ii)</u>

| **කාර්තුව** | **ගෙවිය යුතු දිනය** | **5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය** |
|---|---|---|
| පළමුවන කාර්තුව | 2023 මාර්තු 31 හෝ ඊට පෙර | ජනවාරි 31 |
| දෙවන කාර්තුව | 2023 ජුනි 30 හෝ ඊට පෙර | අප්‍රේල් 30 |
| තුන්වන කාර්තුව | 2023 සැප්තැම්බර් 30 හෝ ඊට පෙර | ජුලි 31 |
| හතරවන කාර්තුව | 2023දෙසැම්බර් 31 හෝ ඊට පෙර | ඔක්තෝම්බර් 31 |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එච්.අමරාවතී මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(vi) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2023 වර්ෂය සඳහා ක්‍රියාත්මක විමට නියමිත නව වරිපනම් තක්සේරුව රටේ පවතින උද්ධමනය හා මහජනතාවට මුහුණ දීමට සිදුව ඇති ආර්ථික දුෂ්කරතාවය මත නව තක්සේරුව ක්‍රියාත්මක කිරීම 2023.12.31 වන දින දක්වා කල් දමන ලෙස සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමන් විසින් දන්වා ඇති බැවින් 2023 වර්ෂයේ තක්සේරු කරන ලද නව තක්සේරුව වූ රු.5,888,722.00 ක මුදල පැරණි තක්සේරු මුදල වූ 3,038,000.00 දක්වා අඩු වන බැවින් රු. 2,850,722.00 ක මුදලක් සංශෝධනය වේ. එලෙස සංශෝධනය වන මුදල පහත දක්වා ඇති වැය ශීර්ෂයන්ගෙන් අඩු කර අදාල හිඟය පියවා 2023 අය වැය කෙටුම්පත සඳහා අදාල සංශෝධනය ඇතුලත් කිරීම සුදුසු බව යෝජනා කරමි.

(මෙම යෝජනාවට ගරු සභාපතිතුමාට අමතරව ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා, ප්‍රාදේශීය සභා මන්ත්‍රී චිකුම් වන්දන මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. අබේසේන මැතිතුමා විසින් අත්සන් කර භාර දී ඇත)

| | | |
|---|---|---|
| 1.11 | වරිපනම් බදු | 2,850,722.00 |

2,850,722.00

| වැය ශීර්ෂය | විස්තරය | මුදල |
|---|---|---|
| 103(2)1 | **ඉන්ධන හා ලිහිසි තෙල් කාර්ය මණ්ඩල** | 320,000.00 |
| 104(1) | වාහන යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අලුත්වැඩියාව | 250,000.00 |
| 203(2) | ඉන්ධන හා ලිහිසි තෙල් | 810,722.00 |
| 204(1) | වාහන යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අලුත්වැඩියාව | 330,000.00 |
| 303(2) | ඉන්ධන හා ලිහිසි තෙල් (ලෙලන තලනය, කොන්ක්‍රීට් මිශ්‍රණය, බැකෝ යන්ත්‍රය හා වෙනත්) | 850,000.00 |
| 304(1) | වාහන යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අළුත්වැඩියාව | 40,000.00 |
| 503(2) | ඉන්ධන හා ලිහිසි තෙල් (ආදාහනාගාරයේ මෘත ශරීර ආදාහනයට ගෑස් සිලින්ඩර්) | 250,000.00 |
| | | 2,850,722.00 |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 10.29)

**01.(vii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සතු රුපියල් 5,000,000.00 ක් වටිනා ලංකා බැංකුවේ 88942832 අංක දරණ ස්ථාවර තැන්පතු මුදල 2022.11.18 දින කල් පිරෙන අතර එහි ප්‍රතිශතය 15% වේ. එසේම එම බැංකුවේම 88942839 දරණ රු.16,000,000.00 වටිනා ස්ථාවර තැන්පතුවද 2022.11.18 දින කල් පිරෙන අතර එම තැන්පතු දෙක ඉහළ ප්‍රතිශතයක් දක්වා වැඩි කර ගැනීමට එම තැන්පතු නිදහස් කර වැඩි පොලී ප්‍රතිශතයක් හිමි වන රාජ්‍ය බැංකුවක නැවත ආයෝජනය කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී නීතා බාලසූරිය මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

ස්ථාවර තැන්පතු ඉහළ පොලියක් ලැබෙන බැංකුවක තැන්පත් කිරීම සුුදුසු බවට යෝජනා කළත් මෙහි තැන්පත් කරනු ලබන බැංකුවක නමක් සඳහන් කර නොතිබීම ගැටළුවක් බව පැවසීය. ඒ අනුව මහජන බැංකුවේ හෝ ලංකා බැංකුවේ මේ මුදල් තැන්පත් කිරීම සුදුසු බවට තමන් විශ්වාස කරන බවත් එය පැහැදිලිව යෝජනාවට ඇතුලත් කරන්නේ නම් වඩාත් සුදුසු බවත් පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ යෝජනාවේ රාජ්‍ය බැංකුවක ලෙස සඳහන් කර තිබෙන බවත් රාජ්‍ය බැංකු යනු අනිවාර්යයෙන්ම ලංකා බැංකුව හෝ මහජන බැංකුව බවත් පෙන්වා දෙන ලදී. එසේම මේ ගිණුම් කල් පිරෙන දිනය වන නොවැම්බර් 18 වන විට පොලී අනුපාතයේ යම් වෙනසක් සිදු වුවහොත් වැඩිම ප්‍රතිශතය හිමි වන බැංකුවක තැන්පත් කිරීමේ අරමුණින් නමක් සඳහන් නොකල බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

මහා සභාවේ අනුමැතිය හිමි වූ පසු ඕනෑම තීරණයක් ගැනීමේ හැකියාව ඇති බැවින් මේ යෝජනාව සංශෝධනය කර බැංකුවක නම සඳහන් කරන්නේ නම් වඩාත් සුදුසු බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සතු රුපියල් 5,000,000.00 ක් වටිනා ලංකා බැංකුවේ 88942832 අංක දරණ ස්ථාවර තැන්පතු මුදල 2022.11.18 දින කල් පිරෙන අතර එහි ප්‍රතිශතය 15% වේ. එසේම එම බැංකුවේම 88942839 දරණ රු.16,000,000.00 වටිනා ස්ථාවර තැන්පතුවද 2022.11.18 දින කල් පිරෙන අතර එම තැන්පතු දෙක ඉහළ ප්‍රතිශතයක් දක්වා වැඩි කර ගැනීමට එම තැන්පතු නිදහස් කර ලංකා බැංකුව හෝ මහජන බැංකුව අතුරින් ඒ අවස්ථාවේදී වැඩි පොලී ප්‍රතිශතයක් හිමි වන රාජ්‍ය බැංකුව නැවත ආයෝජනය කිරීම සුදුසු බව යෝජනා කරමි.

සංශෝධිත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(viii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අල්ගොඩ හා අටුළුගම පිහිටි වැඩිහිටි හා ආබාධිත නිවාස වල නේවාසිකව සිට මිය ගිය අයගේ දේහයන් ආදාහනය කිරීමේදී එක් මෘත දේහයක් රු.10,000.00 ක සහන මිලකට ඊරියගොල්ල ආදාහනාගාරයේදී ආදාහනය කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

මෙහි සඳහන් කර ඇති වැඩිහිටි නිවාස දෙකටම හරි හැටි ආදායම් මාර්ගයක් නොමැති බැවින් මේ කාර්ය නොමිලේ සිදු කර දීමට කටයුතු කරන්නේ නම් වඩාත් සුදුසු බව පැවසීය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

අද වන විට ගෑස් මිල ඉහල යාම මත නොමිලයේ සිදු කිරීමේදී සභාව අපහසුතාවයකට පත් වන බැවින් එය සිදු කිරීමේ අසීරුතාවය පෙන්වා දෙන ලදී. එසේම පළාත් සභාවේ පරිවාස දෙපාර්තමේන්තුවෙන් වැඩිහිටි නිවාසයක එක් මරණයක් සඳහා රු. 10,000.00 ක දීමනාවක් ගෙවන බවත් එම මුදල ආදාහන ගාස්තු ලෙස ලබා ගැනීමට හැකි බැවින් මෙලෙස තීරණය කළ බවත් එසේ සිදු කළ විට වැඩිහිටි නිවාසයෙන් අමතර මුදලක් ඒ සඳහා වැය නොවන බවත් පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.එම්. ෆර්හාන් මැතිතුමා:**

මේ යෝජනාව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවට ඉදිරිපත් කරන ලද අවස්ථාවේදීත් පරිවාස දෙපාර්තමේන්තුවෙන් ගෙවනු ලබන මෙම දීමනාව පිළිබඳව දැනුවත් කළ බවත් ගෑස් මිල පිළිබඳවත් සලකා බලා මේ ආකාරයට සිදු කිරීම සුදුසු බවට එම අවස්ථාවේදී මුදල් කමිටුවේ සාමාජිකයන් විසින්ද නිර්දේශ කළ බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

පරිවාස දෙපාර්තමේන්තුවෙන් සිදු කරන ලද ගෙවීම සම්බන්ධයෙන් තමන් දැන නොසිටි බවත් ඒ හේතුවෙන් අවසන් කටයුතු නොමිලේ සිදු කර දෙන ලෙස යෝජනා කළ බවත් පැවසූ එතුමා දැන් ඒ සම්බන්ධයෙන් තමන් දැනුවත් බැවින් තමන් විසින් සිදු කළ එම යෝජනාව ඉල්ලා අස් කර ගන්නා බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා:**

යෝජනා අංක 01 (viii) යටතේ ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව අගය කරන බව පවසා සිටියේය. නමුත් මේ වන විට ප්‍රදේශයේ පැතිරි යන කට කතාවක් සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාගේ අවධානය යොමු කිරීමට කැමති බව පැවසූ එතුමා ඊරියගොල්ල ආදාහනාගාරයට මෘත දේහයක් රැගෙන යන අවස්ථාවේ ඥාතීන් විසින් මෘතදේහය අවසන් කටයුතු සිදු කිරීම සඳහා ආදාහනාගාර සේවකයන්ට භාර දුන් පසු එම සේවකයන් විසින් එම මෘත් දේහය බහා ඇති පෙට්ටියේ ඇති සියළුම යකඩ තහඩු ගලවා ඉවත් කිරීමට කටයුතු කරන බවත් එය මිය ගිය පුද්ගලයාට සිදු කරන අගෞරවයක් බවට ඔවුන් පවසන බව පෙන්වා දෙන ලදී. ඒවා ගලවා විකුණා එයින් ආදායමක් ලබා ගැනීමට ක්‍රියා කරන බවට ප්‍රදේශයේ කතාවක් පැතිර යන බව පවසා සිටියේය. පසුගිය දිනක වෙලන්ගල්ල ප්‍රදේශයේ මිය ගිය තැනැත්තෙකුගේ මෘත දේහය ආදාහනාගාරයට රැගෙන ආ අවස්ථාවේදීත් එලෙස සිදු වී ඇති බවත් මෙය අවිස්සාවේල්ල නගර සභාවේවත් සිදු නොවන බවත් දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ පමණක් සිදු වන කාර්යක් බවට පවසන නිසා මෙහි සත්‍ය අසත්‍යතාවය පිළිබඳව කරුණු පැහැදිලි කර දෙන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෘත දේහ පිළිස්සී ඉතිරි වූ භෂ්මාවශේෂ සමඟ මෙම යකඩ කැබිලිත් භෂ්මාවශේෂ දමන වළට දමන බවත් ඒවා දිරා නොයාම හේතුවෙන් පාරිසරික ගැටළු උද්ගත වන බැවින් මෘත දේහ ආදාහනයට පෙර එම යකඩ කොටස් ගලවා ඉවත් කිරීම සුදුසු බවට පරිසර බලපත්‍රය ලබා දෙන අවස්ථාවේදී මධ්‍යම පරිසර අධිකාරියෙන් නිර්දේශ කර ඇති බැවින් ඒ ආකාරයට ක්‍රියා කිරීමට සිදු වී ඇති බව පැවසීය. ඒ සම්බන්ධයෙන් මෘත දේහය ආදාහනාගාරයට රැගෙන එන පිරිස් දැනුවත් කරන බවත් අවශ්‍ය නම් එම යකඩ කැබලි ඔවුන්ට රැගෙන යා හැකි බවත් නොඑසේ නම් ආදාහනාගාරයේ තබා යා හැකි බවටත් ඔවුන් දැනුවත් කර තිබෙන බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා සභාවට පැමිණෙන ලදී.පෙ:ව: 10.38)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ. පියරත්න මැතිතුමා:**

සභාපතිතුමා දැනුවත්ව මේ කාර්ය සිදු කරන බවට එතුමාගේ ප්‍රකාශයෙන් තහවුරු වන බවත් එසේ නම් මේ සම්බන්ධයෙන් පිටස්තර සමාජය එල්ල කරන දෝෂාරෝපණය සත්‍ය බවත් පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ගරු මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ. පියරත්න මැතිතුමා ප්‍රකාශ කරන්නේ මධ්‍යම පරිසර අධිකාරියෙන් නිර්දේශයක් ලබා දී ඇති විට ඒවා ගලවා ඉවත් නොකර සිටින ලෙසද යන්න විමසා සිටියේය. එහි යම් පාරිසරික ගැටළුවක් ඇත් නම් එය සිදු කිරීම කළ නොහැකි බවත් අවශ්‍ය අයට ඒ තහඩු නැවත රැගෙන යා හැකි බවට ඔවුන්ට දන්වා සිටින බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ. පියරත්න මැතිතුමා:**

මේ වන විට ප්‍රදේශයේ මල් ශාලා වල තහඩු හිඟයක් පවතින බව පෙන්වා දෙන ලදී.

(සභාව සෝෂාකාරී)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකුම් චන්දන මැතිතුමා:**

මධ්‍යම පරිසර අධිකාරියෙන් එලෙස දැනුම් දී ඇත්නම් එය සිදු කිරීම අපගේ වගකීමක් බවත් එසේම සභාව විසින් මෘත දේහ බහාලන පෙට්ටි වල එවැනි යකඩ ඇණ ගැසීමෙන් වලකින ලෙස ප්‍රදේශයේ අවමංගල්‍ය ශාලා හිමියන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස මධ්‍යම පරිසර අධිකාරියෙන් ඉල්ලා සිටීමත් සුදුසු බව පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා සහ ගරු මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී.පෙ:ව: 10.40)

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ආදාහනාගාරය වෙන් කර ගැනීමට කාර්යාලයට පැමිණෙන පිරිස මේ සම්බන්ධයෙන් දැනුවත් කරන බවත් පැවසීය. කාරණා පැහැදිලි කර දීමට පෙර කෑ කෝ ගසමින් සභාවේ කාලය නාස්ති කරන මන්ත්‍රිවරු සිටින බවත් ඒ සම්බන්ධයෙන් කණගාටු වන බවත් පවසා සිටියේය. ඉවතලන යකඩ කැබලි ටිකක් අලෙවි කරමින් මුදල් ඉපයීමට තමන්ට අවශ්‍ය නොවන බවත් තමන් හෙට මෙම ධූරයෙන් ඉවත් වී ගියත් තම අත් පිරිසිදු බවත් කිසිදු වංචාවක් දූෂණයක් තමන් අතින් සිදු වී නොමැති බවත් පවසා සිටියේය. ආදාහනාගාරයේ මේ වන විටත් ගලවා ඉවත් කරන කොටස් පිළිබඳව සඳහන් කිරීමට ලේඛනයක් පවත්වාගෙන යන බවත් ඒ ගලවන ලද යකඩ කොටස් වෙනමම පවතින බවත් ඒවා වෙන්දේසි කර එම මුදල් සභා ගිණුමේ තැන්පත් කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කර ඇති බව පවසා සිටියේය. ආදාහනාගාරයක් පවත්වාගෙනයාමේදී පරිසර බලපත්‍රයක් ලබා ගත යුතු බවත් ඒ අනුව මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබා දෙන නිර්දේශ වලට තමන් ගරු කරන බවත් පැවසූ එතුමා අනෙකුත් නගර සභා හෝ ප්‍රාදේශීය සභා මෙය සිදු කිරීම හෝ නොකිරීම ඔවුන්ගේ කාර්යක් බවත් නමුත් මේ සභාව සෑම අවස්ථාවකදීම පරිසර හිතකාමී ලෙස සිය කාර්යන් පවත්වාගෙන යන ආයතනයක් ලෙස කටයුතු කිරීමට මෙහෙය වීම තම වගකීම බවත් පවසා සිටියේය. අවශ්‍ය නම් මධ්‍යම පරිසර අධිකාරියෙන් ඉදිරිපත් කරන ලද නිර්දේශය සභාවට ඉදිරිපත් කිරීමට හැකි බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

එසේ සිදු කිරීමට අවශ්‍ය නොව බවත් මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබා දී ඇති නිර්දේශයන්ට අනුව මෘත දේහ ආදාහනයේදී ඒ පෙට්ටි වල ඇති යකඩ කොටස් සමඟ ආදාහනය කිරීම සිදු කළ නොහැකි බවත් ඒ හේතුවෙන් එම යකඩ ඉවත් කිරීමට සිදුව ඇති බවත් පවසා දැන්වීමක් ආදාහනාගාරයේ ප්‍රදර්ශනය කිරීමටත් ඒ සම්බන්ධව අදාල ඥාතීන් දැනුවත් බවත් ඔවුන් ඒ සඳහා එකඟ බවත් පවසා අත්සනක් ලබා ගැනීමට ලේඛනයක් නඩත්තු කිරීමත් සුදුසු බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා:**

කාර්යාලයේදී එම දැනුවත් කිරීම සිදු කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් දැනුවත් වන්නේ ආදාහනාගාරය වෙන් කිරීම සඳහා පැමිණෙන පුද්ගලයන් පමණක් බවත් එම නිසා ආදාහනාගාරයේත් මේ සම්බන්ධ දැනුවත් කිරීම සඳහා දැන්වීමක් හෝ ප්‍රදර්ශනය කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදි.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

(ගරු මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා සභාවට පැමිණෙන ලදී.පෙ:ව: 10.43)

**01.(ix) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ප්‍රාදේශීය සභා ඉන්ධන පිරවුම්හල වාණිජ ව්‍යවසාය ව්‍යාපෘතිය සැලසුම් කිරීම ඉදි කිරීම පවත්වාගෙන යාම හා කළමනාකරණ කටයුතු සඳහා උපදේශ ලබා දීම, සම්බන්ධ කටයුතු වලදී අපේක්ෂිත සැලැස්ම සඵලමත්ව ක්‍රියාත්මක කිරීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාම සඳහා නිපුනතාවයෙන් යුත් ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවක් පත් කිරීම සුදුසු බැවින්

- මෙම ව්‍යාපෘතියට අදාල සභා යෝජනා කෙටුම්පත්කරණය සඳහා උපදෙස් ලබා දීම හා පරීක්ෂා කිරීම
- ණය ඉල්ලුම්පත් පරීක්ෂා කිරීම
- ගිවිසුම විශ්ලේෂණය කර සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම
- ලංසු කැඳවීම හා කොන්ත්‍රාත් පිරිනැමීමට අදාල කටයුතු අධීක්ෂණය,මූල්‍ය ණය වාරික ලැබීම්, ණය වාරික ගෙවීම් අධීක්ෂණය
- අදාල අතුරු නීති කෙටුම්පත් කිරීම සඳහා උපදෙස් ලබා දිම හා අධීක්ෂණය
- මෙම ව්‍යාපෘතියට අදාලව අවස්ථානුකූලව ගරු මහා සභාව, ගරු සභාපතිතුමා ලේකම්තුමිය විසින් කමිටුව වෙත ඉදිරිපත් කරන වෙනත් කරුණු පරීක්ෂාව අධීක්ෂණය උපදෙස් ලබා දිම
- ව්‍යාපෘතිය ඉදි කිරීම අවසන් වූ පසු සභාවට භාර ගැනීම ඉන්ධන පිරවුම්හල් කාර්ය කටයුතු පවත්වාගෙන යාම කළමනාකරණය, අධීක්ෂණය හා අවශ්‍යතාවය මත සභාව වෙත වාර්තා කිරීම
- සෑම මසකම දෙවන සතියේ සහ සිව් වන සතියේ මේ ව්‍යාපෘතියට අදාලව පසු විපරම හා අධීක්ෂණය සිදු කර අවශ්‍ය වාර්තා සකස් කිරීම

යන කාර්යන් ප්‍රමුඛව ඊට අනුශාංගික සියළු කටයුතු මෙහෙය විම හා අධීක්ෂණය සඳහා ඉටු කර ගැනීම සඳහා පහත සාමාජිකයන්ගෙන් සැදුම්ලත් **ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවක්** පත් කිරීම සුදුසු බව යෝජනා කරමි.

I. දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ඒ.ජී.දමිදු ශ්‍යාමින්ද මැතිතුමා
II. ගරු උප සභාපති විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා
III. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා
IV. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා
V. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා
VI. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා
VII. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා
VIII. දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්.ඩී.සී.රුක්ෂානි මහත්මිය
IX. ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී එච්.ඒ.ආර්.එස්. තිලකරත්න මහතා
X. සංවර්ධන නිලධාරී එච්.එන්.ආර්.එස්.කරුණාරත්න මහතා
XI. කාර්මික නිලධාරී ආර්.ඒ.යූ.එන්.රණසිංහ මහතා
XII. සංවර්ධන නිලධාරිනී ඊ.පී.එස්.සමන්ලතා මිය.
XIII. කළමනාකරණ සේවා නිලධාරී ආර්.එච්.එම්.එන්.පත්මසිරි මිය

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නීතා බාලසූරිය මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

(ගරු මන්ත්‍රිනී දිස්නා කුමාරි මැතිණිය සභාවට පැමිණෙන ලදී.පෙ:ව: 10.45)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

මේ ඉන්ධන පිරවුම්හල ඉදි කිරීමේ යෝජනාව සම්මත වන්නේ 2020 වර්ෂයේදීත් බවත් 2020.07.15 මහා සභාවේදි විපක්ෂය ලෙස අපත් එයට සහය දුන් බවත් සභාවට ආදායමක් ලැබෙන කාර්යක් බැවින් විරුද්ධ වීමේ අවශ්‍යතාවයක් නොතිබූ බවත් පවසා සිටියේය. 2021 අයවැයෙන් මේ සඳහා රුපියල් ලක්ෂ 40ක මුදලක් වෙන් කර තිබූ බවත් නමුත් සැලකිය යුතු ප්‍රගතියක් ඒ සම්බන්ධයෙන් එම වර්ෂයේ සිදු නොවූ බවත් පවසා සිටි එතුමා එසේ තිබියදී පසුගිය දිනක මේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් විෂය නිලධාරිනිය විසින් සිදු කළ බවත් එහිදී ලබා දුන් වාර්තාව තමන් අත තිබෙන බවත් පවසා සිටියේය. මේ කාර්යේ ගැටළුවක් නොමැති බවත් නමුත් මිල ගණන් සම්බන්ධයෙන් ඇති ගැටළු කීපයක් නිරාකරණය කර ගැනිම සඳහා මේ සම්බන්ධව කතා කළ යුතු බවට තීරණය කළ බව පැවසීය. මේ කාර්ය සඳහා බැංකු ණයකට යොමු වන බවත් ලංකා බැංකුවේ බිලියන 100ක ණයක් ලබා ගැනීමට අදහස් කර ඇති බවට පැවසූ බවත් සිහිපත් කළ එතුමා එම මිලියන 100 ට අමතරව සභාවෙන් මිලියන 06ක් එකතු කර සම්පූර්ණ මිලියන 121 ක් මේ සඳහා වැය වන බව පැවසූ බව එතුමා එම අවස්ථාවේදී තමන් මේ කාලය තුළ බැංකු වල ඇති පොලී අනුපාත ඉහල අගයක් ගන්නා බැවින් ලබා ගැනීමට අපේක්ෂිත ණය මුදලේ පොලිය පමණක් ලක්ෂ 05 කට වැඩි මුදලක් මාසිකව ගෙවීමටට සිදු වන බව පෙන්වා දුන් බව පවසා සිටියේය. මෙම ඉන්ධන පිරවුම්හල ඉදි කිරීමේ අපේක්ෂාව ලෙස සඳහන් කර ඇත්තේත් සභාවේ අරමුදල් නොමැති නිසා එය වැඩි කර ගැනීමේ අරමුණින් බවට සඳහන් කර ඇති නිසා මේ පොලී මුදල හෝ ගෙවීමට හැකියාවක් සභාව සතු වේදැයි විමසා සිටියේය. එසේ සිදු වුවහොත් සභා අරමුදලින් පවා මුදල් ගෙන බැංකු ණය පොලි ගෙවීමට සිදු වුවහොත් අඩු තරමින් වීථි පහනක් හෝ දමා ගැනීමට සභාවට හැකි වේදැයි යන ගැටළුව උද්ගත වන බව පවසා සිටියේය. මේ ව්‍යාපෘතිය සම්බන්ධව පැහැදිලි කිරීමේදී ඉන්ධන ලීටරයකින් රු.50.00 ක ලාභයක් තිබෙන බවට විෂය නිලධාරිනිය විසින් පැහැදිලි කළ නිසා එම ව්‍යාපෘති යෝජනාව සකස් කලේ ඒ සම්බන්ධ විශේෂඥ දැනුමක් ඇති අයෙක් විසින්ද නොඑසේ නම් නිලධාරින් විසින්ද යන්න විමසා සිටි බව පැවසීය. ඒ අනුව මසකට ඉන්ධන ලීටර් 30,000 ක් අලෙවි කළහොත් රු.1,500,000 ක මුදලක් සභාවට හිමි වන බැවින් අප ඒ සම්බන්ධයෙන් සතුටු වූ බව පැවසීය. නමුත් ඊයේ දිනයේ තමන් විසින් ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යනු ලබන අයෙකු සමඟ කතා කළ අවස්ථාවේදී මේ වන විට ඉන්ධන ලීටරයක් සඳහා 1%ක ගාස්තුවක් පමණක් හිමි වන බවට දැන ගත් බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දැරණියගල සමූපකාර ඉන්ධන පිරවුම්හලේ 2.75 % ක් ආදායමෙන් ගෙවන බවත් එය ඔවුන් සතු භූමියක ඉන්ධන පිරවුම්හල ඉදිකර නොමැති බවත් අපගේ ඉන්ධන පිරවුම්හල ඉදි කරන්නේ සභාව සතු භූමියක නිසා 3%ක් ආදායමෙන් ලබා ගැනීමට හැකියාව ඇති බවත් පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

එසේ වුවත් මේ ප්‍රදේශයේ හැටියට ලීටර් 30,000 ක් අලෙවි කර ගැනීමේ හැකියාව තිබේද යන ගැටළුව තමන්ට උද්ගත වන බවත් කෙසේ සිදු කළත් මාසිතව උපරිම ලාභය ලෙස රුපියල් ලක්ෂ 05ක් දක්වා පමණක් යා හැකි වන බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දැරණියගල යනු හුදකලා නගරයක් බවත් එහි පිහිටා ඇති ඉන්දන පිරවුම්හල මාසයකට රුපියල් ලක්ෂ 11 ක ශුද්ධ ලාභයක් මේ වන විටත් ලබන බව පවසා සිටියේය. තමන් IOC සමාග සමඟ පැවති සම්මුඛ

පරීක්ෂණයට සහභාගී වූ බවත් එහිදී ටැංකි සහ පොම්ප ඔවුන් විසින් ලබා දී අවශ්‍ය ආකාරයට සකස් කර දෙන බවත් ඉන්ධන පිරවුම්හලට අවශ්‍ය කාර්යාලය සහ කැනපිය පමණක් අපට සකස් කර ගැනීමට සිදු වන බවට ඔවුන් විසින් ප්‍රකාශ කළ බවත් පවසා සිටියේය. ඔවුන් අනුමැතිය ලබා දුන් පසු පළාත් පාලන ඉංජිනේරු ගෙන්වා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම පමණක් අපට සිදු වන බවත් පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා සභාවට පැමිණෙන ලදී.පෙ:ව: 10.52)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

ඒ සඳහා මෙතරම් මුදලක් වැය නොවන බවත් මේවා මූල්‍ය ගණුදෙනු නිසා සුපරික්ෂාකාරී වීම අත්‍යාවශ්‍ය බවත් පැවසීය. එදා පළමුවරට මේ යෝජනාව ඉදිරිපත් කළ අවස්ථාවේ තමන් ඒ සඳහා අනුමැතිය ලබා දුන්නේ සද්භාවයෙන් බවත් අදත් ගරු සභාපතිතුමාගේ වචනය විශ්වාස කර මේ යෝජනාව සඳහාත් නිහඬව සිටියත් ඉදිරියේදී මේ ඉන්ධන පිරවුම්හල සම්බන්ධයෙන් එන ඕනෑම යෝජනාවක් සඳහා අනුමැතිය ලබා දෙන්නේ ව්‍යාපෘති යෝජනාව පරීක්ෂා කර බලා පමණක් යැයි පවසා සිටියේය. මේ ගෙවී යන්නේ මේ සභා වාරයේ අවසන් කාල පරිච්ඡේදය වන බැවින් හා මීළඟ සභා වාරයේදී සභාපතිධූරයේ යම් වෙනසක් සිදු වුවහොත් හෝ අප මේ සභාව සඳහා තේරී පත් නොවී නිවෙස් වල සිටින විටදීත් මේ කාර්යයන් සඳහා අනුමැතිය ලබා දීම මත අධිභාරයක් ගෙවීමට සිදු වුවහොත් යන ගැටළුව මත මේ තීරණයට එළඹීමට සිදු වන බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ කාර්යය සඳහා මහා සභාවේ අනුමැතිය හිමි වීම ප්‍රමාණවත් නොවන බවත් ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියත් හිමි විය යුතු බව පෙන්වා දෙන ලදී. එබැවින් මේ කාර්ය සිදු කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා මේ වන විට ලිඛිත අවසරය ලබා දි ඇති බවත් ඉදිරි කාර්යන් සඳහාත් ඒ ඒ අවස්ථාවන් වලදී අදාල අනුමැතිය ලබා ගෙන එම කාර්යන් සිදු කිරීමට අප බලාපොරොත්තු වන බව පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

මේ කාර්ය සිදු කිරීම සඳහා පත් කර ඇති කමිටුව සම්බන්ධයෙන් ගැටළුවක් නොමැති බවත් ඒ කාර්ය කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ඔවුන් සිය උපරිමයෙන් දායකත්වය දෙනු ඇති බවත් පවසා සිටියේය. එසේ වුවත් මෙහි මහජන නියෝජිතයන් පත් කර ඇති ආකාරය දෙස බැලූ විට ගරු සභාපතිතුමාට අතිශයින් හිතවත් පිරිසක් ඒ සඳහා පත් කරගෙන ඇති බැවින් එහි යම් සංශෝධනයක් සිදු කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එලෙස සිදු කර නොමැති බවත් විපක්ෂය නියෝජනය කරමින් අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමාත් වසම නියෝජනය කරමින් ගරු මන්ත්‍රී විකුම් චන්දන මැතිතුමාත් පත් කර ඇති බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

වසම නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් ලෙස ගරු මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමාත් සිටින බැවින් එතුමා මේ සඳහා නම් නොකලේ ඇයිද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මැතිවරණයෙන් ජයග්‍රහනය කලේ ගරු මන්ත්‍රී විකුම් චන්දන මැතිතුමා බැවින් එතුමාගේ නම මේ සඳහා ඇතුලත් කළ බව පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

මේ ව්‍යාපෘතියේ කටයුතු සම්බන්ධයෙන් අනිකුත් මන්ත්‍රීවරුන්ද දැනුවත් විය යුතු බැවින් මේ යෝජනාවට සංශෝධනයක් ඉදිරිපත් කිරීමට අදහස් කළ බව පවසා සිටි එතුමා විපක්ෂය නියෝජනය කරමින් ගරු මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා සිටියත් එතුමාට අමතරව දෙහිඕවිට නගරය නියෝජනය කරන විපක්ෂයේ සිටින ගරු මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමාත් මෙම කමිටුව සඳහා ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා කර සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා:**

එතුමා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව නියෝජනය කරන බව පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

එසේ වුවත් මෙහි සිදු වන කාර්යන් සම්බන්ධයෙන් තමා ඇතුළු කණ්ඩායමට තොරතුරු දැන ගැනීමට අවශ්‍ය බවත් එසේ නම් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව නියෝජනය කරන විපක්ෂයේ මන්ත්‍රීවරුන් දෙදෙනා වන ගරු මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා සහ ගරු මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා මේ සඳහා පත් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා:**

ඉන්ධන පිරවුම්හලක් මේ සභාවට හිමි වීම හොඳ කරුණක් බවත් පසුගිය සභා වාරයේදී හිටපු සභාපති අමිල රුවන් කන්දෙආරච්චි මැතිතුමාගේ කාලයේදී ආදාහනාගාරය ඉදිකිරීමේ කාර්යයයේදී සහ ජේ.සී.බී.යන්ත්‍රයක් මිලදී ගැනීමේ කාර්යය සිදු කිරීමේදිත් ඇතැම් මන්ත්‍රීවරු ඒ සඳහා විරුද්ධ වූ බව සිහිපත් කළ එතුමා නමුත් අද වන විට එම ආදාහනාගාරය හා ජේ.සී.බී.යන්ත්‍රය මේ සභාවට විශාල ආදායමක් ලබා දෙන ප්‍රභවයන් බවට පත් වී ඇති බව පෙන්වා දෙන ලදී. එසේම මේ ඉන්ධන පිරවුම්හලත් ඒ ආකාරයෙන්ම සභාවට හොඳ ආදායමක් ලබා දෙනු ඇති බව පෙන්වා දුන් එතුමා මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ රැස්වීම පැවති අවස්ථාවට තමන්ට සහභාගී වීමට නොහැකි වූ බවත් එම නිසා ඒ සම්බන්ධයෙන් ලොකු අවබෝධයක් තමන්ට නොමැති බව පැවසීය.

ඉන්ධන ලිටරයකින් 3.5%ක ආදායමක් හිමි වුවත් මාගම්මන ප්‍රදේශයෙ හා දෙහිඕවිට නගරයේ ඉන්ධන පිරවුම්හල් තිබියදී සභාව මෙතරම් වියදමක් දරා ඉන්ධන පිරවුම්හලක් ඉදි කළද එයින් සැලකිය යුතු ආදායමක් මේ සභාවට උපයාගත හැකි වේද යන සැකය තමන්ටද ඇති වන බව පවසා සිටියේය. අද වන විට අප රට ලෝකයේ උද්ධමනය අතින් මෙතරම් ඉහළ ස්ථානයකට පත්ව ඇත්තේත් මේ රටට ඔරොත්තු නොදෙන මට්ටමේ සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීම මත බව පැවසූ එතුමා ඒ එකදු ව්‍යාපෘතියකින් හෝ මේ රටට ආදායමක් උපයා ගැනීමට නොහැකි වී ඇති බව පැවසීය. මේ සභාවට මේ වන විට හොඳ ආදායමක් පවතින බවත් අප සියළුදෙනාගේ වැටුප් ගෙවීමට හැකි තත්වයක් තිබෙන බැවින් මේ අවස්ථාවේ බැංකු ණයකට ගොස් මෙවැනි ව්‍යාපෘතියක් සිදු කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් නැවත වාරයක් සිතා බලන ලෙස තමන් ඉල්ලා සිටින බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී.පෙ:ව: 11.02)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

යෝජනා අංක 01 (ix) හා 01 (x) මගින් ඉන්ධන පිරවුම්හල් ව්‍යාපෘතියට අදාල කාර්යන් සඳහා කමිටු 02ක් පත් කර ඇති බවත් ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍ර කුමාර මැතිතුමා මේ කමිටුව සඳහා තමන්ගේ නමත් යෝජනා කළ බවත් එසේ වුවත් තමනට ඒ සම්බන්ධයෙන් විශාල අත්දැකීමක් නොමැති බැවින් ඒ සඳහා නම් ඇතුලත් නොකරන්නට ඇතැයි පවසා සිටියේය. 1951 තම සීයා විසින් දෙහිඕවිට ඉන්ධන පිරවුම්හලක් ආරම්භ කළ බවත් පසුව 1954 වර්ෂයේදී අවිස්සාවේල්ල නගරයේ ඉන්ධන පිරවුම්හලක් ආරම්භ කළ

බවත් පැවසූ එතුමා ඒ සම්බන්ධ දැනුම ඇති තමන්ට වඩා විශේෂඥ කමිටුවක් ගරු සභාපතිතුමා විසින් පත් කරගෙන ඇති බව පවසා සිටියේය. මේ සම්බන්ධයෙන් අප විග්‍රහ කරන බවත් එහි ආනිසංස දකින බවත් ගුණදොස් විවේචනය කරන බවත් එම නිසා ගරු සභාපතිතුමා තමන්ට හිතෛෂී පිරිසක් මේ සඳහා පත් කර ගන්නට ඇතැයි විශ්වාස කරන බවත් පවසා සිටියේය. මේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් තමන් අධ්‍යයනය කළ විට එය තවත් නෙළුම් කුළුණක් වේදෝයි සැකයක් තමන්ට ඇති වූ බව පවසා සිටියේය. සභාවට අයත් මේ ඉඩමේ අනවසරකරුවන් අල්ලාගෙන සිටින භූමියේ ඉන්ධන පිරවුම්හලක් ඉදි කිරීමට අදහස් කිරීම අගය කරන බවත් එයත් චීනයේ ණය ආධාර මත ඉදි කළ නෙළුම්කුළුණ මෙන් බැලූ බැල්මට ලස්සන බව පැවසීය. නමුත් කෑගල්ල සිට අවිස්සාවේල්ල මාර්ගය ගත් විට රුවන්වැල්ල මුදුගමුවේ සිට කිලෝමීටර් 10ක දුර ඇතුලත ඉන්ධන පිරවුම්හල් 04 ක් තිබෙන බවත් මේ ඉන්ධන පිරවුම්හලත් ඉදි කළහොත් 05ක් වනු ඇති බව පවසා සිටියේය. නිලධාරීන් විසින් ව්‍යාපෘති වාර්තා සංකස්කර විවිධ අලංකාර එක් කර මේ සම්බන්ධව පෙන්වුවත් ඒ සියල්ල යථාර්ථයක් බවට පත් නොවන බවත් ඒවා උපකල්පන බවත් පෙන්වා දුන්නේය.

(ගරු මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. ගරු මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 11.04)

මේ සඳහා විශාල ජල හා විදුලි බිලක් වැය වන බවත් පැය 24 ම මාසයේ දින 31 පුරාම මෙය පවත්වාගෙන යාම සඳහා විශාල මුදලක් වැය වන බවත් පෙන්වා දුන් එතුමා මේ උපකල්පන ආදායම් ලබා ගැනීම ප්‍රායෝගික නොවන බවට විපක්ෂය විසින් ප්‍රකාශ කරන්නේ මේ හේතුව නිසා යැයි පවසා සිටියේය. පෙර පැවති රජයන් විසිනුත් මේ ආකාරයට වරාය , ගුවන්තොටුපල ඉදි කිරීම් සිදු කළ බවත් නමුත් ඒවායෙන් අපේක්ෂිත ආදායම් ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ බැවින් අද වන විට ලංකාව ලෝකය ඉදිරියේ ණය ගෙවා ගත නොහැකි රටක් බවට පත්ව ඇති බව පෙන්වා දෙන ලදී. පළාත් පාලන ආයතනයක් සතු ප්‍රධාන වගකීම මහජන සෞඛ්‍ය , පොදු මංමාවත් , ජලය , විදුලිය, ආදී සේවා සැපයීම බවත් එම කාර්යන් වලට අවධානය යොමු නොකර මෙවැනි මහා පරිමාණ ව්‍යාපෘති සඳහා යොමු වීම ප්‍රායෝගික නොවන බවට තමන් විශ්වාස කරන බව පවසා සිටියේය. පසුගිය කාලයේ රුපියල් ලක්ෂ 65ක් 70ක් හෙළ බොජුන්හල් ව්‍යාපෘතියට යැයි පවසමින් වියදම් කළ බවත් ඒවාගෙන් බලාපොරොත්තු වූ ආදායම ලැබෙනවාද ,එම ආදායම් සභාගත කරනවාද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මාසිකව හෙළ බොජුන්හලේ ආදායම ආදායම එක් කර ගන්නා බවත් ආදායම් ප්‍රගතිය සම්බන්ධ වාර්තා මාසිකව ලබා දෙන බැවින් ඒවා හොඳින් අධ්‍යනය කරන ලෙස දන්වා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

සභාවේ තිබෙන ස්ථාවරත්වය අනුව තීරණ ගැනීමේදී සභාපතිතුමාගේ අරමුණු ඉටු කර ගැනීම සම්බන්ධයෙන් පමණක් අවධානය යොමු කිරීම සුදුසු නොවන බවත් 85,000 ක් වූ මේ ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිත වලටත් මේ තීරණය බලපාන බව පෙන්වා දෙන ලදී. ආදාහනාගාර ව්‍යාපෘතියට අදාල යෝජනාව ගෙන ආ අවස්ථාවේදී ඒ සඳහා අපගේ සහය ලබා දුන් බවත් අනිවාර්යයෙන්ම ආදාහනය සඳහා මෘත දේහ ආදාහනාගාරය වෙත ලැබෙන බවත් එම කාර්යයෙන් කිසිදු පාඩුවක් සභාවට සිදු නොවන බැවින් ඒ කාර්ය සඳහා අනුමැතිය ලබා දීම සිදු කළ හැකිව තිබූ බව පවසා සිටියේය. එසේම මේ සභා සංකීර්ණය සහිත බහුකාර්ය ගොඩනැගිල්ල සකස් කරන අවස්ථාවේදිත් විපක්ෂය වශයෙන් අප ඒ සඳහා සහය ලබා දුන් බව සිහිපත් කළ එතුමා යම් ලෙසකින් ඉන්ධන පිරවුම්හල ඉදි කළ පසු එය දේශපාලනීකරණය වුවහොත් ඒවා පවත්වාගෙන යාම පිළිබඳව බලවත් ගැටළුවක් උද්ගත වන බව පෙන්වා දෙන ලදී. එසේම මේ සඳහා මධ්‍යම රජයෙන් හෝ වෙනත් ආයතනයකින් ණය මුදලක් හෝ අනුග්‍රහයක් ලබා දෙන්නේ නම් ගැටළුවක් නොවන බවත් නමුත් සභා දේපලක් උගසට තබා මේ ආකාරයට ණය මුදලක් ලබා ගෙන මෙවැනි කාර්යක් සිදු කරන්නේ නම් සභාවේ ආදායමට එය ඔරොත්තු නොදෙන තත්වයක් බව පෙන්වා දෙන ලදී. මුදුගමුවෙන් පටන්ගෙන මේ දක්වා ඇති ඉන්ධන පිරවුම්හල්

සඳහා ස්ථාවර පාරිභෝගික පිරිසක් නොමැති බවත් නමුත් අවිස්සාවේල්ල ඉන්ධන පිරවුම්හල් සඳහා කර්මාන්ත පුරයේ තිබෙන කර්මාන්ත ශාලා මඟින් ලැබෙන ආදායම් නිසා ස්ථාවර ආදායම් එම ආයතන සතුව පවතින බව පෙන්වා දෙන ලදී. එම නිසා මේ සඳහා පදනම් විරහිත තර්ක ඉදිරිපත් කරමින් මේ යෝජනාව සාධාරණීකරනය කිරීම සිදු නොකරන ලෙසත් ඒ වෙනුවට නගරයේ දැනට ඇති ඉන්ධන පිරවුම්හල සංවර්ධනය කිරීම සඳහා යම් වැඩපිළිවෙලක් සොයා බැලීම වඩාත් සුදුසු බවත් පෙන්වා දෙන ලදී. මේ කාර්ය සඳහා තමන් කැමති බවත් ඒ ජාත්‍යාන්තර මූල්‍ය අරමුදලෙන් , ආසියානු සංවර්ධන බැංකුවෙන් , මධ්‍යම රජයෙන් හෝ පළාත් සභාවෙන් මේ සඳහා ආධාර ලැබෙන්නේ නම් පමණක් බව පවසා සිටියේය. රටේ පවතින මූල්‍ය අර්බුදය සමඟ සීමා සහිත ඉන්ධන ප්‍රමාණයක් නිකුත් කරනු ලබන කාලයක බලාපොරොත්තු වන මට්ටමේ ආදායමක් ලබා ගැනීම දුෂකර වනු ඇති බව පෙන්වා දෙන ලදී. එම නිසා කුමන කමිටුවක් පත් කර ගත්තද සියළු කාර්යන් විනිවිද භාවයෙන් යුක්තව සිදු කරන ලෙසත් මහා සභාවේ අනුමැතියට අදාල සියළු ලේඛන ඉදිරිපත් කරන ලෙසත් ඉල්ල සිටියේය. කොසේ වෙතත් උපකල්පනය කරනු ලබන ආකාරයේ සාර්ථකත්වයක් මේ තුළින් ලැබිය නොහැකි බවට තමන් විශ්වාස කරන බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

සංඛ්‍යා ලේඛන ගැන ප්‍රකාශ කිරීමේදී මේ කාර්ය සඳහා මිලියන 05ක මුදලක් වැය වන බවට පවසා සිටි බවත් IOC සමාගමෙන් ටැංකි පොම්ප හා අනෙකුත් උපකරණ ලබා දීම හා සවි කර දීම සිදු කරනවා නම් එතරම් මුදලක් ලබා ගන්නේ ඇයිද යන්න විමසා සිටියේය. එසේ නම් මේ සඳහා ව්‍යාපාර වස්තු සැලසුම් රාමුවක් ( B.O.P.F.) අවශ්‍ය බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ඉන්ධන පිරවුම්හලට පිටුපසින් බස් නැවතුම්පලක් හා වෙළඳ සංකීර්ණයක්ද සකස් කිරීමේ අදහසක් ඇති බවත් සමාගමෙන් ඒ සඳහා අනුග්‍රහය නොලැබෙන බවත් පෙන්වා දෙන ලදී. පළමු අදියර ලෙස ඉන්ධන පිරවුම්හල ඉදි කළත් මේ සියළු කාර්යන් සඳහා මහා සභා අනුමැතිය ලබා ගැනීම සිදු කරන බවත් පවසා සිටියේය. නමුත් අදාල ආයතනය මඟින් අපට ඇස්මේන්තුවක් සකස් කිරීම සඳහා අවශ්‍ය සැලසුමත් , ඉදි කිරිම් සැලසුමත් ආදී තොරතුරු ලබා දුන් පසු අප විසින් ඉංජිනේරුවෙකුගේ මාර්ගයෙන් තොරතුරු ලබා දී ඇස්තමේන්තුවක් සකස් කරන බවත් ඒ ඇස්තමේන්තුවට අදාල ණය මුදල ලබා ගන්නා බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

තමන් වෘත්තීය සිවිල් ඉංජිනේරුවෙකු බවත් තමන්ට මේ ක්ෂේත්‍රයට අදාල උපාධියක් තිබෙන බවත් පැවසූ එතුමා මේ වන රටේ ඇති තත්වය හමුවේ ලංකාවේ ඉදි කිරීම් වලින් 90%ක්ම නවතා ඇති බවත් පවසා සිටියේය. සිමෙන්ති මිල හා අනෙකුත් ඉදි කිරීම් ආශ්‍රිත නිෂ්පාදන වල මිල ඉහල යාම බැංකු ණය වල පොලී ප්‍රතිශත ඉහළ යාම ආදී කරුණු හේතුවෙන් මේ අවස්ථාවේදී ව්‍යාපාර සැලසුමක් සකස් කරන්නේ නම් තිබෙන මිලට වඩා 50% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඒ සඳහා වැඩි වන බවත් එවැනි තත්වයක් යටතේ කඩිනමින් මෙය සකස් කිරීමේ අවශ්‍යතාවයක් තිබේද යන්නත් සිතා බැලිය යුතු බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ වන විට ලංකාව පුරා IOC ඉන්ධන පිරවුම්හල් 50ක් ඉදි කිරීම සඳහා අනුමැතිය රජය මඟින් හිමි වී ඇති බවත් ඒවා මාර්තු මාසය වන විට ආරම්භ කිරීමට අපේක්ෂා කරන බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

මේ සම්බන්ධයෙන් මහජන නියෝජිතයන් දැනුවත් කිරීමක් පැවති බවට ප්‍රකාශ වූ බවත් ඒ කාර්ය සිදු කිරීමට පෙර ලංකාවේ ප්‍රධාන පෙලේ ඉදි කිරීම් සමාගම් වලින් මේ කාර්ය සඳහා ඇස්තමේන්තු කැඳවීමක් කළාද , එයට අදාල ලියවිලි හෝ ඔවුන්ගේ ඉදි කිරීම් සම්බන්ධ වාර්තා ගෙන්වාගෙන පරීක්ෂා කළාද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙය ඉන්ධන පිරවුම්හල ඉදි කිරීමට අවශ්‍ය බලපත්‍රය ලබා ගැනීම හා අනෙකුත් අනුමැතියන් ලබා ගැනීමට පමණක් සකස් කරන ලද දළ සැලැස්මක් පමණක් බවත් ඉදිරියේදී මේ සඳහා විධිමත් සැලැස්මක් සකස් කරන බවත් පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

මෙය මිලියන 100 ක ව්‍යාපෘතියක් බවත් ලංකාවේ එවැනි ඉදි කිරීම් සිදු කිරීමට සුදුසුකම් සහිත සමාගම් වල ව්‍යාපාර සැලසුම් අප විසින් අධ්‍යනය කළාද ඔවුන් කැඳවා මේ ස්ථානය පෙන්වා අපට අවශ්‍ය සැලසුම ඉදිරිපත් කර එහි මෙම ව්‍යාපෘතිය සකස් කිරීම සම්බන්ධයේ ඔවුන්ගෙන් විස්තරාත්මක පැහැදිලි කිරීමක් ලබා ගත්තාද යන්න විමසා සිටියේය. මෙවැනි මහා පරිමාණ ව්‍යාපෘති සිදු කිරීමේ සාමාන්‍ය ක්‍රමවේදය මෙය බවත් එවැනි කාර්යක් සිදු නොකර මෙය ඉදි කරන්නේ කෙසේදැයි විමසා සිටියේය. මෙහි බඩු සඳහා මිලියන 05ක් ගෙවා අදාල ද්‍රව්‍ය සැපයිම සිදු කලත් ණය මුදල ලෙස මිලියන 121 ක් ආදී ලෙස සාකච්ඡා වන බවත් මිලියන 05 ලබා දුන් පසු ඇසතමේන්තුවේ තව මිලියන 116 ක් තිබෙන බවත් පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ සඳහා ඇස්තමේන්තුවක් තවමත් ලබා දී නොමැති බවත් IOC සමාගමෙන් ඔවුන්ගේ සැලසුම අප වෙත ලබා දුන් පසු පළාත් පාලන ඉංජිනේරු මගින් ඇස්තමේන්තුව සකස් කිරීම සිදු කරන බවත් එම ඇස්තමේන්තුවට ණය මුදල අයදුම් කිරීම සිදු කළ යුතු බවත් පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

එසේ නම් අප මේ කතා වන සැලසුම කුමක්ද යන්නත් එහි අඩු පාඩු ඇති බවත් කවුරුන් විසින් සකස් කළේද යන වගත් විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙය IOC සමාගම සමඟ සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වීමට අප විසින් සකස් කරන ලද ව්‍යාපෘති සැලසුම බවත් මෙය යෝජනාවක් වශයෙන් අදාල ආයතන වලට පෙන්වීම සඳහා දළ වශයෙන් සකස් කරන ලද්දක් බවත් පවසා සිටියේය. මෙය පිළිබඳව සභාවේදීත් පැහැදිලි කළ බවත් මන්ත්‍රීවරු දැනුවත් කිරීම සඳහා කැඳවන ලද අවස්ථාවේදීත් ඒ සම්බන්ධයෙන් පැහැදිලි කළ බවත් පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

මෙය කවුරුන් හෝ තාක්ෂණික නිලධාරියෙක් හෝ වෙනත් නිලධාරියෙකු විසින් සකස් කරන්නට ඇති බවත් එලෙස සකස් කළ ව්‍යාපෘති යෝජනාවේ ඇති අඩුපාඩු දෙස අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙය සකස් කිරීමේ යම් යම් අඩු පාඩු ඇති බවත් තමන්ද එය පිළිගන්නා බවත් මෙය ව්‍යාපෘති යෝජනාවක් පමණක් බවත් සහා අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක කරන්නේ මෙය නොවන බවත් එය අදාල සමාගමට ඉදිරිපත්කළ පසු සමාගමෙන් ලබා දෙන සැලසුමට අනුව සකස් කරන ඇස්මේන්තුවට අදාලව ව්‍යාපෘති යෝජනාව මහා සභාවට ඉදිරිපත් කරන බවත් පවසා සිටින ලදී. ඉන් පසු දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ණය මුදලක් ලබා ගැනීමට අපේක්ෂා කරන බවත් එහි පොලී අනුපාතය මේ වන විට 7% ක් වන බවත් පවසා සිටියේය.

(ගරු මන්ත්‍රීනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 11.14)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

දැනට ණය මුදල වශයෙන් කොතරම් මුදලක් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙය කාර්ය මණ්ඩලයයේ නිලධාරිනියක විසින් සකස් කළ එකක් බවත් මෙහි රුපියල් ලක්ෂ 1000 ක් ලෙස සඳහන්ව ඇතත් අදාල IOC සමාගම සමහ පැවති සම්මුඛ සාකච්ඡාවට සහභාගී වීමට ගිය අවස්ථාවේදී තමන් එහි සිටි නිලධාරීන් සමඟ කතා කළ බවත් එහිදී ඔවුන් මෙම ඉන්දන පිරවුම්හල ඉදිකිරීම රුපියල් ලක්ෂ 500 ක මුදලකට සිදු කළ හැකි වනු ඇති බවට පවසා සිටි බවත් ප්‍රකාශ කර සිටියේය. ඒ ඔවුන් දළ වශයෙන් තමන් වෙත ප්‍රකාශ කළ කරුණ බවත් නමුත් අනුමැතිය ලද පසු මේ සඳහා වන ඇස්තමේන්තුව සකස් කරන්නේ පළාත් පාලන ඉංජිනේරු මඟින් සභාවේ මැදිහත් වීමෙන් බවත් එය මහා සභා අනුමැතියට ඉදිරිපත් කරන බවත් එතෙක් තමන්ට නිශ්චිත මුදලක් සම්බන්ධයෙන් ප්‍රකාශ කිරීමට නොහැකි බවත් පවසා සිටින ලදී. මේ කාර්යන් පුළුල්ව සාකච්ඡා කිරිම සඳහා මෙම කමිටු පත් කරගෙන ඇති බවත් ඒවා සමඟත් සාකච්ඡා කර විනිවිද භාවයෙන් මේ කාර්යන් සියල්ලම සිදු කර මහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීම සිදු කරන බව පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ. පියරත්න මැතිතුමා:**

මේ සම්බන්ධයෙන් මන්ත්‍රීවරු දැනුවත් කිරීම සඳහා පැවති රැස්වීමේදී ඒ පැහැදිලි කිරීම සිදු කළ විෂය නිලධාරිනිය දැරණියගල ඉන්ධන පිරවුම්හල ලාභ ලබන ආකාරය පෙන්වා දෙමින් මේ කාරණය සාධාරණීකරණය කිරීමට ක්‍රියා කළ බවත් නමුත් දැරණියගල හා දෙහිඕවිට යනු නගර දෙකක් බවත් දැරණියගල නගරය පෞද්ගලික හා ලංගම බස් රථ නවතා තබන ස්ථානයක් බවත් නගරය මූලික කරගෙන බස් රථ ධාවනය වන නගරයක් බැවින් අපට වඩා ආදායම් ලබන නගරයක් ලෙස දැරණියගල හඳුන්වා දිය හැකි බව පවසා සිටියේය. දේශීය ණය සංවර්ධන අරමුදලෙන් මේ සඳහා මිලියන 100 ක ණය මුදලක් අප වෙත ලබා දෙනු ඇති යන්න විමසා සිටි එතුමා මීට පෙර ප්‍රකාශ කළේ මෙම ණය මුදල ලංකා බැංකුව හෝ මහජන බැංකුව මඟින් ලබා ගැනීමට අපේක්ෂා කරන බවට එදා විෂය නිලධාරිනිය එම පැහැදිලි කිරීමේදී ප්‍රකාශ කර සිටි බව පැවසූ එතුමා එලෙස සිදු කරන්නේ නම් එය මහා අපරාධයක් බවත් මේ මිලියන 100ට ගෙවීමට සිදු වන පොළිය දෙස බැලූ විට අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතනයක් ලෙස එය අපට දරා ගත නොහැකි වනු ඇති බව පවසා සිටියේය. එහෙත් ණය ලබා ගැනීම සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලට යොමු වන්නේ නම් එය වඩාත් සුදුසු බවත් නමුත් එතරම් විශාල මුදලක් අප සභාවට එම ආයතනය මඟින් ලබා දෙයිද යන ගැටළුව තමන්ට තිබෙන බව පවසා සිටියේය. ගරු මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා ප්‍රකාශ කළ ආකාරයට ඉදි කිරීම් ද්‍රව්‍ය සඳහා වන මිල ගණන් දෙතුන් ගුණයකින් ඉහල ගොස් ඇති මෙවැනි කාලයක මෙම ව්‍යාපෘතිය සිදු කිරීමට මෙතරම් උනන්දු වන්නේ ඇයිද යන්න ගැටළුවක් බව පවසා සිටින ලදී. මේ මිලියන 100 එහි ඉදි කරනු ලබන වෙළඳ සංකීර්ණය සෑදීමේ කාර්යත් ඇතුළුව වුවත් ව්‍යාපෘතිය ඉදිරිපත් කරන විට ඉදිරිපත් කරන්නේ ඉන්ධන පිරවුම්හල ඉදි කිරීමේ ව්‍යාපෘතිය ලෙස වන බව පැවසිය. එදා පැවති ව්‍යාපෘතිය සම්බන්ධව දැනුවත් කිරීමේ රැස්වීමේදී පැහැදිලි කළ පරිදි

පොම්ප හා ලීටර් 19 ටැංකි සඳහා වැය වන්නේ ලක්ෂ 50 ක් වන බැවින් මිලියන 100ක් මේ සඳහා වැය වන්නේ ඇයිද යන්න විමසා සිටියේය.

(සභාව සෝෂාකාරී)

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

තමන් විසින් මෙය පැහැදිලිව තේරුම් කළද තවත් එකම කාරණය සම්බන්ධයෙන් කතා කරමින් මේ ආකාරයට කාලය විනාශ කරන්නේ කුමන හේතුවක් නිසාද යන්න විමසා සිටියේය. ලකෂ 50 ක තැන්පතුවක් සිදු කළ පසු සමාගම විසින් ඉන්ධන ගබඩා කරන ටැංකි හා ඉන්ධන නිකුත් කරන පොම්ප සවි කිරීම සිදු කරන බවට තමන් පැහැදිලිව මේ සභාවට ප්‍රකාශ කළ බවත් නැවත නැවත ඒ සම්බන්ධයෙන් පවසා සිටින්නේ කුමක්ද යන්න විමසා සිටින ලදී. මෙතරම් සරලව තේරුම් කලද ගරු මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමාට එය අවබෝධ කර ගත නොහැකි වීම පිළිබඳව කණගාටු වන බව පවසා සිටින ලදී. මෙය විනිවිද භාවයෙන් සිදු බල යුතු බවත් ඒ කාර්ය සඳහා තමන් විසින් වෙනම කමිටුවක්ද යෝජනා කළ බව පවසා සිටියේය.

(සභාව සෝෂාකාරී)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ. පියරත්න මැතිතුමා:**

මේ පලාත් පාලන ක්‍රමවේදය තුළ ගරු උප සභාපතිතුමා හැර අනෙකුත් සියළු දෙනා සභිකයින් වන බවත් කමිටුවක් සඳහා පත් කරන්නේ නම් ඒ ඒ පක්ෂ නියෝජනය වන ලෙස එම පත් කිරීම් සිදු කළ යුතු බවත් පවසා සිටියේය. ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන මන්ත්‍රීතුමා මෙන්ම ස්වාධීන මන්ත්‍රීවරයෙකු ලෙස තමන්ද මේ සභාවේ සිටින බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සියළු දෙනාම සභිකයන් බැවින් දේශපාලන පක්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් පත් කර ගැනීම අනවශ බවත් සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගෙන් කීපදෙනෙක් ඒ සඳහා පත් කර ගන්නේ නම් එය ප්‍රමාණවත් බව පෙන්වා දෙන ලදී. ආණ්ඩු පක්ෂය මෙන්ම විපක්ෂයද නියෝජනය වන ලෙස ගරු විපක්ෂ නායක අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමාත් මේ සඳහා ඇතුලත් කර ඇති බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ. පියරත්න මැතිතුමා:**

විපක්ෂ නායක යනුවෙන් තනතුරක් නොමැති බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එක්සත් ජාතික පක්ෂයේ මහලේකම් විසින් එම පක්ෂයේ කණ්ඩායම් නායක ලෙස ගරු මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා පත් කර ඇති බවට ලිඛිතව දන්වා ඇති බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා , ගරු මන්ත්‍රී රනිල් විජේසිරි මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 11.21)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ. පියරත්න මැතිතුමා:**

එසේ නම් විපක්ෂයේ සිටින කෝසල ජයවීර මැතිතුමාටත් විපක්ෂ නායක ලෙස භාවිතා කළ හැකි බව පැවසීය. මෙම සභාවේ අසුන් පනවා ඇත්තේ කෙසේද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

යෝජනාවට අදා කරුණු පමණක් විමසන ලෙසත් අසුන් පනවා ඇති ආකාරය පිළිබඳව කතා කිරිමට අවශ්‍යා නම් ඒ සඳහා වෙනත් වේලාවක් යොදා ගන්නා ලෙසත් දන්වා සිටියේය. අනව්‍ය කතා පවසමින් මේ සභාවේ සහ අනෙක් මන්ත්‍රීවරුන්ගේ වටිනා කාලය නාස්ති නොකරන ලෙසත් දන්වා සිටියේය.

(සභාව ඝෝෂාකාරී)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

මේ කමිටුව සම්බන්ධයෙන් මෙතරම් කරුණු ප්‍රකාශ කරන ගරු මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා මේ කමිටුව සඳහා පත් කර ගැනීමට හැකි නම් එලෙස සිදු කරන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා:**

ගරු මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා සිදු කළ යෝජනාවට තමන්ද එකඟ බවත් ඒ යෝජනාව අනුමත කරන බවත් පවසා සිටියේය. හැකියාවක් ඇත්නම් එතුමා පත් කළහොත් මේ සියළු ගැටළු එතුමාට නිරාකරණය කර ගත හැකි බව පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකුම් චන්දන මැතිතුමා:**

විපක්ෂය නියෝජනය කරන එක් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයක් මේ කමිටුවට පත් කර ගෙන ඇත්තේ ගරු සභාපතිතුමාට හිතෛෂී එතුමාට ඕනෑම අකටයුත්තක් සිදු කිරීමට අනුමැතිය ලබා දෙන මන්ත්‍රීවරු බවට ප්‍රකාශ කළ බවත් එම ප්‍රකාශයට වෙනත් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙකු පිළිතුරු ලබා දෙනු ඇති බවට තමන් අපේක්ෂා කළත් එසේ සිදු නොවූ බැවින් ඒ සම්බන්ධයෙන් අදහසක් ප්‍රකාශ කිරීමට අවශ්‍ය බව පවසා සිටියේය. තමන් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මෙන්ම ප්‍රසම්පාදන කාරක සභාවත් නියෝජනය කරන බවත් එදා මෙදාතුර කිසිදු අවස්ථාවක වංචනික ක්‍රියාවක් සිදු කිරීම සඳහා තමන් අත්සන් කර ඇත්නම් අදාල ප්‍රකාශය සිදු කළ ගරු ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමාගේ අත්දැකීම්ද උපයෝගී කරගෙන එය ඔප්පු කරන ලෙස පවසා සිටියේය. එම ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු මුලින් පාරවල් සාදා පසුව ඇස්තමේන්තු අනුමැතිය සඳහා යොමු කළ අවස්ථා තිබූ බවත් ක්‍රියා පටිපාටියෙන් බැහැරව වුවත් කාර්ය සිදු කර ඇති බව සලකා ඒවා අනුමත කර ගැනීමට සහය ලබා දුන් බව සිහි පත් කර සිටි එතුමා තමන් මේ කමිටුවට නම් කර ඇති නිසා මෙලෙස නම් සම්බන්ධව ප්‍රකාශයක් සිදු කළ බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙම කමිටුව සඳහා මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන් වශයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමාගේත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමාගේ නම් සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමාගේ නමත් අලුතින් ඇතුලත් කරමින් යෝජනාව සංශෝධනය කරන බව පවසා සිටියේය.

සංශෝධිත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ. පියරත්න මැතිතුමා:**

එසේ නම් ගරු මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා යෝජනා කළ තමන්ගේ නම ඒ සඳහා ඇතුලත් කර නොගන්නේ ඇයිද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ඊට පෙර ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා විසිනුත් විපක්ෂය නියෝජනය කරන මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ සිටින ගරු මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමාගේ සහ එම්.එම්.එම්.ෆර්හාන්

මැතිතුමාගේ නම් යෝජනා කර තිබූ බව පෙන්වා දෙන ලදී. කමිටුවක් නිසා එතරම් විශාල පිරිසක් මේ සඳහා සම්බන්ධ කර ගැනීම අවශ්‍ය නොවන බවත් මේ සම්බන්ධනේ ගන්නා සියළුම තීරණ මහා සභාවේ අනුමැතියෙන් සිදු කරන බැවින් අනෙකුත් මන්ත්‍රීවරුන්ටත් ඒ කරුණු දැන ගැනීමට අවස්ථාව ලැබෙන බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා:**

මහජන නියෝජිතයන් 34 දෙනෙකු මෙම සභාව නියෝජනය කරන බවත් ඒ 34 දෙනාම නම් කර කමිටු පත් නොකරන බවත් එලෙස  අවශ්‍ය නම් එය කමිටුවක් ලෙස නොව මහා සභාවක් ලෙස පවත්වාගෙන යා හැකි බවත් පවසා සිටියේය. තීරණයක් ගැනීමට හැකි යම් කාරණයක් සම්බන්ධයෙන් සුබවාදී දැක්මක් ඇති පිරිසක් සමඟ එම කාරණය සිදු කරනු විනා හැම කරුණක් සම්බන්ධයෙන්ම අසුබවාදීව දකින පිරිසක් සමඟ කමිටු පවත්වාගෙන යා නොහැකි බවත් පැවසූ එතුමා ඒ ආකාරයේ කමිටු පාර්ලිමේන්තුවේ හෝ පත් නොකරන බව පවසා සිටියේය. එම නිසා ගරු සභාපතිතුමා ගෙන ආ ස්ථිර යෝජනාවේම සිටින ලෙසත් එක් එක් පුද්ගලයන්ට අවශළ ආකාරයෙන් එම තීරණ වෙනස් නොකරන ලෙසත් ඉල්ලා සිටියේය.

(සභාව සෝෂාකාරී)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  කෝසල ජයවීර මැතිතුමා:**

එවැනි කාර්යන් සිදු කිරීමට අවශ්‍ය නම් මෙලෙස කමිටු පත් කිරීමක් අනවශ්‍ය බව පවසා සිටියේය.

(සභාව සෝෂාකාරී)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

තමන් ගරු මන්ත්‍රී පියත්න මැතිතුමාගේ නම මෙම කමිටුව  සඳහා යෝජනා කළේ එතුමා මේ සභාවේ කතා කිරීමට ගිය විට මේ සභාවේ සිටින අනෙක් මන්ත්‍රීවරු සියළු දෙනා ලබා ගන්නා කාලයත් එක් යෝජනාවක් පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීම  සඳහා පියරත්න මැතිතුමා ලබා ගන්නා කාලයත් දෙස බැලූ විට අනෙක් මන්ත්‍රීවරුන් කතා කිරීමට ලැබෙන අවස්ථාව අඩු වීම මත බව පවසා සිටියේය. තමන් ඇතුළු අනෙකුත් මන්ත්‍රීවරු සියළු දෙනාටත් මේ සභාව තුළ කතා කිරීමට ඕනෑ තරම් කරුණු සහ අවශ්‍යතාවයන් තිබුණත් එතුමා එක් කතාවක් සඳහා ලබා ගන්නා කාල වේලාව හේතුවෙන් අනෙක් මන්ත්‍රීවරු තමන්ට කීමට අවශ්‍ය කරුණු පවා ප්‍රකාශ  නොකර සිටින බව පෙන්වා දුන් එතුමා මේ සභාවේ කතා කිරීමට ඇති එකම කාරණය මෙය නොවන බවත් පවසා සිටියේය. එම නිසා පියරත්න මැතිතුමා මේ කමිටුවට සම්බන්ධ කර ගතහොත් ඒ සම්බන්ධයෙන් එහිදී දැනුවත් විය හැකි නිසා සභාවේ අනෙක් මන්ත්‍රීවරුන්ටත් කතා කිරීමට කාලය ඉතිරිකර ගත හැකි වනු ඇති බවට තමන්ට අවබෝධ වූ බැවින් එලෙස සිදු කළ බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

මේ කමිටුව සඳහා එම ක්ෂේත්‍ර නියෝජනය වන පුද්ගලයන් සිටිය යුතු බැවින් ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරගෙන යන ගරු මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා වෘත්තීයෙන් ඉංජිනේරුවරයෙකු බැවින් එතුමාත් මේ කමිටුවට සම්බන්ධ කර ගැනීමේ වරදක් තමන් නොදකින බව පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

මෙය සභාවට විශාල ආදායමක් උත්පාදනය කර ගත හැකි ව්‍යාපෘතියක් බවත් හිටපු සභාපතිතුමාගේ කාලයේදී ආදාහනාගාරය ඉදි කිරීමේ කාර්යයේදීත් ඒ සඳහා විරුද්ධ වූ පිරිස් සිටි බවත් නමුත් ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරු වශයෙන් අප එම අවස්ථාවේදී එතුමාට සහයෝගය ලබා දෙමින් සිටි බවත් ඒ ශක්තිය තුළ හිටපු සභාපතිතුමා සියළු අභියෝග මැඩගෙන එම කාර්යය සාර්ථකව සිදු කළ බවත් සිහිපත් කර

සිටියේය. එම නිසා මෙය අසුබවාදීව දකින පිරිසක් සමඟ මෙම කාර්යය සිදු කළ නොහැකි බවත් කරුණු අවබෝධ කරගෙන ඒවා නිවැරදි කර ගනිමින් මේ ගමන යායුතු බවත් පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා:**

මෙම සභාවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු මේ සභාවේ කාර්ය පටිපාටිය සිදු වන ආකාරය දන්වා වුවත් මේ සභාව නියෝජනය කරන නවක මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් සිටින නිසා සභාව පවත්වාගෙන යාමේදී එහි කාර්යයන් සිදු විය යුතු ආකාරය නිවැරදිව අවබෝධ කර නොගැනීම මත කාලය නාස්ති වීම නිරන්තරයෙන් සිදු වන බවත් බොහෝ දෙනෙක් අදහස් ප්‍රකාශ කිරීමේදී සභා රීති වල දී ඇති විධිවිධාන සම්බන්ධයෙන් අවබෝධයකින් තොරව ක්‍රියා කරන බවත් පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රිනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය සභාවට පැමිණෙන ලදී. ගරු මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 11.37 )

මෙම ව්‍යාපෘතිය දෙහිඕවිට නගරයේ ක්‍රියාත්මක කිරීමට අවස්ථාව කඩිනමින් උදා වන්නේ නම් එය වඩාත් කාලෝචිත ව්‍යාපෘතියක් බවත් අද වන විට ව්‍යාපෘති යෝජනාවක් සකස් කිරීම සඳහා බාහිර පාර්ශවයකගේ සහය ලබා ගැනීමට කටයුතු කළහොත් ඒ සඳහා අධික මුදලක් ගෙවීමට සිදු වන බවත් එසේම මේ සකස් කර ඇති වාර්තාවට වඩා 50% ක 60% ක ප්‍රමාණයේ අමතර කරුණු එයට අන්තර්ගත විය හැකි බවත් පවසා සිටියේය. මේ සභා කාර්යාලය සහිත පොදු වෙළඳ සංකීර්ණය පිහිටි මේ ගොඩනැඟිල්ල ඉදි කිරීම මේ සභා ඉතිහාසයේ අප කළ විශාලම ව්‍යාපෘතිය වන බවත් එහි ව්‍යාපෘති යෝජනාව සකස් කර අපේක්ෂිත වියදම ලෙස මිලියන 350 ක් සඳහන් කළ බවත් නමුත් අවසානයේදී මේ සම්පූර්ණ ගොඩනැගිල්ල සෑදීම සඳහා වියදම් වූයේ රුපියල් මිලියන 257 ක් පමණක් බවත් පවසා සිටියේය. එහිදී පෙර සඟඳහන් කළ රුපියල් මිලියන 350 සඳහාම කැබිනට් අනුමැතිය හිමි වී තිබූ බවත් සිහිපත් කළ එතුමා එලෙස මුදල් අනුමත කරවා ගත්තද සභාපතිවරයාට රිසි පරිදි ඒ මුදල් වියදම් කිරීමේ හැකියාවක් නොමැති බවත් පෙන්වා දෙන ලදී. මේ ණය මුදල ලංකා බැංකුව හෝ වෙනත් රජයේ වාණිජ බැංකුවකින් ලබා ගතහොත් පොලී මුදල 30% ඉක්මවා යනු ඇති බවත් දේශීය ණය සංවර්ධන අරමුදල මඟින් මේ ණය ලබා ගන්නේ නම් එය ඉතාම සුදුසු බව පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 11.39)

අපට මෙම ණය මුදල ගෙවීමේ හැකියාව ඇතිද ඒ සඳහා අප උපයන ආදායම ප්‍රමාණවත්ද යන්න විමසා බලා මිස දේශිය ණය සංවර්ධන අරමුදලෙන් ණය ලබා දීමක් සිදු නොකරන බව පැවසූ එතුමා මෙම ව්‍යාපෘතිය ප්‍රායෝගික යථාර්ථයක් බවට පත් කර ගැනීමට නම් ගරු සභාපතිතුමාගේ කැපවීම වඩාත් අවශ්‍ය බවත් වෙනත් කිසිදු පළාත් පාලන ආයතනයකට තමන් දන්නා පරිදි ඉන්ධන පිරවුම්හලක් සඳහා අනුමැතිය ලබා දී නැති බවත් පැවසීය. එලෙස බැලූ විට ගරු සභාපතිතුමා දැරූ මෙම උත්සාහය අගය කළ යුතු බවත් පළාත් පාලන අමාත්‍යාංශයෙන් මේ සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහාත් කැපවීමෙන් ක්‍රියා කළ යුතු බව පවසා සිටියේය. මේ කිසිම ගණුදෙනුවක් ගරු සභාපතිතුමාට අවශ්‍ය පරිදි හිතුවක්කාරී ආකාරයට සිදු කළ නොහැකි බවත් ඒ සඳහා ඉහළ අමාත්‍යාංශ වල අධීක්ෂණය මෙන්ම විනිවිදභාවයෙන් යුතු ප්‍රසම්පාදන ක්‍රියාවලියක් පවතින බවත් පවසා සිටින ලදී. එම නිසා මේ සභාව තුල මේ සඳහා අනවශ්‍ය කාලයක් වැය කිරීම අනවශ්‍ය බවත් මේ කාර්ය කඩිනමින් සිදු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කිරීම වඩාත් සුදුසු බවත් පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා:**

ඉතාම වැදගත් යෝජනාවක් සම්බන්ධයෙන් සාකච්ඡා කරන මොහොතක අදහස් ප්‍රකාශ කිරීමට ලැබීම සම්බන්ධයෙන් සතුටු වන බව පවසා සිටියේය. තමන් මේ ක්‍රියාවලිය මුල සිටම දැනුවත් බවත් දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ණය ලබා ගැනීමේදී සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් ඇති වන බාධා සම්බන්ධයෙන් තමන් දන්නා බවත් ආදාහනාගාරය ඉදි කිරීමේ ව්‍යාපෘතියේදීත් මේ සභාවේ ඇතැම් ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුත් ඒ සඳහා විරුද්ධ වූ බව සිහිපත් කර සිටියේය. මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළහොත් සභාවට විශිෂ්ඨ ආදායමක් ලබා ගත හැකි බව පෙන්වා දෙමින් ඒ අවස්ථාවේදීත් තමන්

ආදාහනාගාරය ඉදි කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය සහය ලබා දුන් බව පවසා සිටියේය. ඇතැම් මන්ත්‍රීවරු මෙය සුදු අලියෙක් ලෙස අර්ථ දැක්වූ බවත් ඒ අවස්ථාවේදී මෙම ආදාහනාගාරයේ ඉදි කරනු ලබන ගොඩනැඟිල්ල කිසිවෙකුට කඩා ඉවත් කරගෙන යා නොහැකි බවත් ඒ වන විට දැරණියගල , රුවන්වැල්ල ආදී කිසිදු ප්‍රදේශයක ආදාහනාගාරයක් නොතිබීම මත එම ඉදි කිරීමෙන් ඇති වන ලාභය පෙන්වා දෙමින් ඒ අවස්ථාවේදී එම යෝජනාව සඳහා අනුමැතිය ලබා ගැනීමට සිදු වූ බව පෙන්වා දෙන ලදී. මේ කාර්යය සම්බන්ධයෙන් තමන් මුල සිට ක්‍රියා කිරීම හේතුවෙන් සෑම මසකම දේශීය ණය සංවර්ධන අරමුදලට යවනු ලබන චෙක්පත නිසි ආකාරයෙන් යවනු ලබන්නේද යන වග සහ ආදාහනාගාරයේ සියළු අධීක්ෂණ කටයුතු පිළිබඳව සොයා බැලීම සඳහා තමන් වෙත පවරා තිබූ බව පවසා සිටියේය. ඒ ආකාරයට මේ සභාවට යහපතක් වෙන ව්‍යාපෘති සඳහා ඒවායේ හොඳ නරක පරීක්ෂා කර බලා ඒ සඳහා අපගේ සහයෝගය ලබා දීමට කටයුතු කළ බව පවසා සිටි එතුමා ඉන්ධන පිරවුම්හල පිළිබඳව අදහස් දැක්වූ ඇතැම් මන්ත්‍රීවරු මේ අවට ඉන්ධන පිරවුම්හල් 10 කට වඩා තිබෙන බව පැවසූ බවත් දෙහිඕවිට තිබෙන ඉන්ධන පිරවුම්හලේ ඇතැම් දින වල ඉන්ධන ලීටරයක් හෝ ලබා ගැනීමට නොහැකි අවස්ථා උදා වන බව පෙන්වා දෙන ලදී. වර්තමානයේ ඇති ඉන්ධන අර්බුදයට පෙර සිටම එහි තත්වය මෙලෙස වූ බවත් ඒ හේතුවෙන් දෙහිඕවිට ප්‍රාදේශිය සභාව මඟින් ඉන්ධන පිරවුම්හලක් ඉදි කළහොත් එය කාලීන අවශ්‍යතාවය සඳහා ගනු ලැබූ වඩාත් හොඳ තීරණයක් බව පවසා සිටියේය.එම නිසා දැනට මේ සඳහා අවශ්‍ය මූලික කටයුතු මේ අවස්ථාවේ සිදු කිරීමට ක්‍රියා කරමු යැයි පවසා සිටි එතුමා සමහර මන්ත්‍රීවරුන් තමන්ගේ අදහස් ප්‍රකාශ කිරීම් මාධ්‍ය ඉදිරියේ පෙන්වීමට ක්‍රියා කළත් තමන් මෙය ප්‍රකාශ කළේ මාධ්‍යවේදීන් ඉදිරියේ කැපී පෙනීමට නොවන බවත් සැබෑ ලෙසම මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවා ගැනීමේ අවශ්‍යතාවය මත බවත් පවසා සිටියේය. එම නිසා සුළු සුළු අඩුපාඩු නිවැරදි කරගෙන මෙය ක්‍රියාත්මක කළහොත් බලාපොරොත්තු වූවාටත් වඩා හොඳ ආදායමක් මේ සභාවට උත්පාදනය කර ගැනීමට මෙම ව්‍යාපෘතිය ඉවහල් වන බව තමන්ට ඒකාන්තයෙන්ම විශ්වාස බව පවසා සිටින ලදී.

(ගරු මන්ත්‍රී කේ නිශාන් මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 11.44)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා:**

ලාභ ලැබීමේ අරමුණින් ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉතාමත් හොඳ යෝජනාවක් ලෙස මෙම ඉන්ධන පිරවුම්හල ව්‍යාපෘතිය හඳුන්වා දිය හැකි බව පවසා සිටියේය. මීට පෙර අදහස් ප්‍රකාශ කළ මන්ත්‍රීවරු පවසා සිටි ආකාරයට දෙහිඕවිට නගරයට ඇත්තේ එක් ඉන්ධන පිරවුම්හලක් පමණක් බවත් මාගම්මන ඉන්ධන පිරවුම්හල වෙත යාම සඳහා කි.මී. 4 ක් හා මීටර් 700 ක දුරක් යා යුතු වන බවත් පවසා සිටියේය. එසේ වුවත් මෙවැනි කාර්යක් සිදු කරන විට මේ සඳහා ඇති පසුබිම සම්බන්ධයෙන් පරීක්ෂාවක් සිදු කළ යුතු බවත් ව්‍යාපාරයක් සිදු කිරීමේදි මෙහි ව්‍යවසාය හැකියාව මෙන්ම අවධානමත් තිබෙන බව අවබෝධ කර ගත යුතු බවත් ලාභ ලැබීමේ අරමුණින් සිදු කර ව්‍යාපාරයක් නිසා මෙය ප්‍රවර්ධනය කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග මොනවාද යන්න සම්බන්ධයෙන්ද අවධානය යොමු කළ යුතු බව පවසා සිටියේය. මේ සඳහා පත් කර ඇති කමිටුව දෙස බැලූ විට එයට අවශ්‍ය උපදෙස් ලබා දිය හැකි ව්‍යාපාරිකයන් ආදී පිරිස්වලින් සමන්විත වන බැවින් එය අගය කරන බවත් ගරු මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා ප්‍රකාශ කළ ආකාරයට ඉන්ධන නොමැති කාල වල පමණක් නොව ඉන්ධන තිබෙන කාලවලත් දෙහිඕවිට ඉන්ධන පිරවුම්හලේ ඉන්ධන අඩුවෙන් තිබූ බව පවසා සිටියේය. එම නිසා හිඟුරලකන්ද , රුකාඟල්, අල්ගොඩ ආදී ප්‍රදේශ වල ජනතාවට විකල්ප ඉන්ධන පිරවුම්හලක් වෙත යාමට නම් දැරණියගලට හෝ අවිස්සාවේල්ල නගර වලට යාමට සිදු වන බවත් එම නිසා හොඳ කාර්යක්ෂම සේවාවක් මේ ප්‍රදේශයට හා අවට ගම් වල ජනතාවට මෙම ව්‍යාපෘතිය හරහා ලබා දිය හැකි බැවින් ඒ කාර්ය සාර්ථක කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාට අවශ්‍ය සම්පූර්ණ ශක්තිය ලබා දීමට කටයුතු කරන බව පවසා සිටියේය. එසේම අත්‍යාවශ්‍ය කාරණයක් සඳහා තමන්ට රත්නපුර නගරයට යාමට අවශ්‍ය බැවින් තරමක් වේලාසනින් පිටත් වීම සඳහා අවසර ලබා දෙන ලෙස ඉල්ලා සිටි එතුමා වෙනත් කරුණු යටතේ පැවසීමට අදහස් කර තිබූ කරුණක් සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාගේ අවධානය යොමු කිරීමට අවශ්‍ය බව පවසා සිටියේය. ඒ අනුව අල්ගොඩ මාර්ගය මේ වන විට වාහනයක් ධාවනය කිරිමට නොහැකි මට්ටමට අබලන් වී ඇති බවත් මේ කරුණ තම වසමේ සහෝදර ගරු මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමාත් දන්නා බවත් පැවසූ එතුමා හැකියාවක් ඇත්නම් සභාවේ කම්කරුවන් යොදාගෙන දීගල වත්ත ප්‍රිමික්ස්

අංගනයේ නිෂ්පාදනය කරනු ලබන ප්‍රිමික්ස් මඟින් ඒ මාර්ගය සංවර්ධනය කර දෙන මෙන් ගරු සභාපතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටින බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා:**

මේ යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රීවරු විසින් නොපැවසූ යමක් පැවසීමට තිබෙන බැවින් තමන් නැගී සිටි බව ප්‍රකාශ කර සිටියේය. ඉන්ධන පිරවුම්හල සඳහා පළමුවෙන් සිපෙට්කෝ ආයතනයෙන් විමසා සිටි බවත් එහිදී ඒ සඳහා අවස්ථාව නොලැබුණු බව පැවසිය. එහෙත් කැගල්ල , අවිස්සාවේල්ල, දැරණියගල හැරුනුකොට මේ අවට කිසිදු IOC ඉන්ධන පිරවුම්හලක් නොමැති බව පැවසූ එතුමා පසුගිය කාලයේ ඉන්ධන හිඟයක් තිබූ අවස්ථා වලදීත් IOC ඉන්ධන පිරවුම්හල් වල ඉන්ධන හිඟයක් නොතිබුණු බව සිහිපත් කර සිටියේය.

(ගරු මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා, ඩබ්.අබේසේන මැතිතුමා, යශෝධ පද්මසිරි මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 11.51)

එම නිසා කාර්යය ආරම්භ කිරීමට පෙර මෙහි සෘණාත්මක පැතිකඩ පමණකින් නොදකින ලෙසත් තමන්ගේ පෞද්ගලික වාසි වෙනුවෙන් මේ යෝජනා සඳහා අත් එසවීමට තමන් හෝ මේ කාර්ය අනුමත කරන වෙනත් කිසිදු මන්ත්‍රීවරයෙකුට අවශ්‍ය නොවන බවත් අත්තනෝමතික කාර්යක් සිදු වීමට කිසිදු අවස්ථාවක ඉඩ ලබා නොදෙන බවත් පවසා සිටින ලදී. මේ සඳහා අනුමැතිය හිමි වූ පසු බැංකු ණය ලබා ගැනීම ඇතුළු අනෙකුත් සියළු කාර්යන් සඳහා මහා සභා අනුමැතිය ලබා ගත යුතු බවත් ඒ සඳහා අදාල යෝජනා මහා සභාවට ඉදිරිපත් කිරිමට කටයුතු කරනු ඇති බවත් පවසා සිටියේය. එම නිසා ප්‍රදේශයේ මහජනතාවගේ හා දූදරුවන්ගේ අනාගතය සාර්ථක කර දීමේ අරමුණින් සිදු කරනු ලබන මේ කාර්ය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය සහය ලබා දීම අපගේ වගකීම බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ ව්‍යාපෘතිය සම්බන්ධ වර්තමාන තත්වය තමන් විසින් නිවේදන අවස්ථාවේ පැහැදිලි කර සිටියත් නැවත නැවත් යෝජනා සභා සම්මත කර ගන්නා අවස්ථා වල ඒ සම්බන්ධයෙන් දීර්ඝව අනවශ්‍ය ලෙස කාලය ගෙවමින් කතා කිරිමට අවශ්‍ය නොවන ලෙස බවත් එය අවබෝධ කර නොගැනීම පිළිබඳව කණගාටු වන බව පවසා සිටියේය. මේ වැඩපිළිවෙල විනිවිද භාවයෙන් සිදු කිරීමට තමන්ට ඇති අවශ්‍යතාවය නිසා මේ කමිටුව පත් කළ බවත් ඉදිරියටත් සිදු කරනු ලබන සියළුම කාර්යන් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මඟින් මහා සභාව වෙත යොමු කිරීමට සිදු කරනු ලබන බවත් පවසා සිටියේය. මේ සියළු කාර්යන් සිදු කිරීමට හැකි වන්නේ බලපත්‍රය ලැබුණු පසුවව බවත් එතෙක් ඒ සඳහා අවශ්‍ය පසුබිම සකස් කර ගනිමින් එම කටයුතු සිදු කරනු ලබන බවත් පවසා සිටින ලදී. 2023 මාර්තු 25 වන විට IOC සමාගම ලංකාව පුර ඉන්ධන පිරවුම්හල් 50ක් ඉදි කිරීම සඳහා අවසර ලබා දී ඇති බවත් ඒ කාල සීමාවට සමගාමීව රාජ්‍ය ආයතනයක් ලෙස අපද අදාල කාර්යයන් ආරම්භ කර තිබිය යුතු බවත් එම නිසා මේ ගැටළු නිරාකරණය කර ගැනීමේ අරමුණින් කමිටුවක් පත් කර මෙය සිදු කළ බව පවසා සිටියේය. මේ වාර්තා වල සංඛ්‍යා ලේඛන දළ වශයෙන් යොදා ඇති බවත් බලපත්‍රය හිමි වූ පසු ඇස්මේන්තු සකස් කිරීම සිදු කරන බවත් දන්වා සිටියේය.

(ගරු මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා සභාවට පැමිණෙන ලදි. ගරු මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී.පෙ:ව: 11.55)

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(x) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ප්‍රාදේශීය සභා ඉන්ධන පිරවුම්හල වාණිජ ව්‍යවසාය ව්‍යාපෘතියේ අපේක්ෂිත සැලැස්ම සඵලමත්ව ක්‍රියාත්මක කිරීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාම

සඳහා ඉදි කිරීම් අධීක්ෂණය සහ උපදෙස් ලබා දීම සඳහා පහත සඳහන් සාමාජිකයන්ගෙන් සැදුම්ලත් **ඉදි කිරීම් අධීක්ෂණ හා උපදේශක කමිටුවක්** පත් කිරීමත් සුදුසු බව යෝජනා කරමි.

I. දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ඒ.ජී.දමිදු ශ්‍යාමින්ද මැතිතුමා
II. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා
III. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා
IV. සබරගමු පළාත් සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක - ඉංජිනේරු (පළාත් පාලන)
V. පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ නිලධාරී
VI. දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්.ඩී.සී.රුක්ෂානි මහත්මිය
VII. කළමනාකරණ සේවා නිලධාරිනී ආර්.එච්.එම්.එන්.පත්මසිරි මිය
VIII. සංවර්ධන නිලධාරිනි ඊ.පී.එස්.සමන්ලතා මිය.
IX. ආදායම් පරීක්ෂක බී.ඩී.ටී.ටී.ප්‍රේමරත්න මිය
X. කාර්මික නිලධාරී ආර්.ඒ.යූ.එන්.රණසිංහ මහතා

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

කලින් යෝජනාව සම්බන්ධව අදහස් ප්‍රකාශ කිරීම ආරම්භ කලේ තමන් විසින් බවත් නිරාකරණය කර ගැනීමට තිබූ ගැටළු කීපයක් සම්බන්ධයෙන් කරුණු දැන ගැනීම පිණිස එලෙස නැඟී සිටියත් ඒ මෙම කාර්යය කඩාකප්පල් කිරීමට හෝ එයට විරුද්ධ වීමේ අරමුණින් එලෙස සිදු නොකළ බවත් පවසා සිටියේය. නමුත් පසුව අදහස් ඉදිරිපත් කිරීමට නැඟී සිටි මන්ත්‍රීවරු ජේ.සී.බී යන්ත්‍රය මිලදී ගැනිමට ගිය අවස්ථාවේදී සහ ආදාහනාගාරය ඉදි කිරීමට ගිය අවස්ථාවේදීත් විරුද්ධ වූ බව පවසමින් මේ කාර්ය සඳහාත් බහුතරයක් මන්ත්‍රිවරුන් විරුද්ධ බවට ඇඟවීමටත් ඒ තුළින් තමන් කැපී පෙනීමටත් උත්සාහ කළ බව පැවසීය. එවිට තමන් මූලිකව අදහස් කළ කාර්ය වෙනස් වන බවත් එවැනි ප්‍රකාශ සිදු කරමින් එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරු මේ සඳහා විරුද්ධ බවට මතයක් ගොඩනැඟීමට උත්සාහ නොකරන ලෙසත් ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිදු ශ්‍යාමින්ද මැතිතුමා:**

ඒ සම්බන්ධයෙන් ගැටළුවක් ඇතිකර නොගන්නා ලෙසත් සුළු පිරිසක් විසින් යම් යම් බාධාවන් සිදු කළත් සභා වාර්තාවේ මෙහි කතා වූ කරුණු සියල්ල සඳහන් වන බැවින් ඒ ආකාරයට ඔබතුමන් ඇතුළු අනෙක් මන්ත්‍රීවරු ගැන වැරදි අවබෝධයක් ඇති වීමක් සිදු නොවනු ඇති බවත් පවසා සිටියේය.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා සභාවට පැමිණෙන ලදි. පෙ:ව: 11.57)

**01.(xi) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19 (vii) වගන්තිය මගින් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දෙහිඕවිට ප්‍රාදේශීය සභාව හා අනෙකුත් රාජ්‍ය ආයතන සම්බන්ධ කර ගනිමින් බල ප්‍රදේශයේ දරුවන්ගේ සහ ගර්භනී මව්වරුන්ගේ ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය සහතික කිරිම සඳහා ග්‍රාමීය ආර්ථිකය පුනර්ජීවන කේන්ද්‍ර සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ පෙර පාසල් දරුවන් හා ගර්භනී මව්වරුන් මන්දපෝෂණ තත්වයෙන් මුදවා ගැනිම යටතේ දේශීය ආහාර උපයෝගි කර ගෙන ඔවුන්ගේ පෝෂණ තත්වය නගා සිටුවීමේ අරමුණින් දැනුවත් කිරීමේ හා ඔවුන් වෙත පෝෂ්‍යදායි ආහාර වේලක් ලබා දීමේ වැඩසටහනක් සිදු කිරිම අරමුණු කර ගෙන ඇත. ඒ සඳහා රු 50000.00 ක මුදලක් සභා අරමුදලින් ලබා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එච්.අමරාවතී මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය:**

මේ කාර්ය සිදු කර ගැනීම සඳහා මව්වරුන් හා දරුවන් තෝරා ගනු ලබන්නේ කුමන ආකාරයටද යන්න විමසා සිටියාය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ගරු මන්ත්‍රීනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය කාන්තා හා ළමා සුබසාධන කමිටු රැස්වීම් සඳහා නොපැමිණ මේ ආකාරයට විමසීම පිළිබඳව කණගාටු වන බව පවසා සිටියේය. එම කමිටු රැස්වීමේදී මේ සම්බන්ධයෙන් පුළුල් ලෙස සාකච්ඡා වූ බවත් ඉදිරියේදී හෝ එම කමිටුවේ රැස්වීම් පැවැත්වෙන දිනයට ඒ සඳහා සහභාගි වී අවශ්‍ය දැනුවත් වීම ලබා ගන්නේ නම් වටිනා බව පැවසීය. මේ දැනුවත් කිරීමේ වැඩසටහන කිරිමට අපේක්ෂා කරන්නේ බල ප්‍රදේශය තුළ ගැබිණි මව්වරුන් 611 ක් පමණ සිටින බවත් ඔවුන් සියළුදෙනාම දැනුවත් කිරීමේ වැඩසටහනට සහභාගී කර ගැනීමට  කටයුතු කරන බවත් ඒ කාර්යය පසුගිය වසර වලත් සිදු කරන ලද කාර්යක් බවත් පැවසීය. මෙම මූලික කාර්යන් සිදු කිරීම සඳහා පමණක් මේ සභාව මඟින් වෙන් කර ඇති දායකත්වය ලබා ගන්නා බවත් අනෙකුත් කටයුතු සඳහා සමිති සමාගම් හා අනුග්‍රහයකයින් සම්බන්ධ කර ගැනීමට අදහස් කරන බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය:**

කමිටු රැස්වීම පැවති දිනයේදී තමන්ට සහතික පත්‍ර ප්‍රධාන උත්සවයකට  සහභාගී වීමට තිබූ බව පැවසූ එතුමිය  මේ කාර්යය සඳහා දරුවන් සම්බන්ධ කර ගන්නා ආකාරය පැහැදිලි කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

පෙර පාසල් වල එම කාර්ය සඳහා සභා අරමුදලේ මුදල් භාවිතා නොකරන බවත් ඒ සඳහා අදාල වෘත්තියවේදීන් සහ ප්‍රජා සංවිධාන සම්බන්ධ කරගෙන සභාවේ මූලිකත්වයෙන් එම කාර්ය සිදු කිරීමට අපේක්ෂා කරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය:**

ඒ සඳහා රු 50000.00 ක මුදල පමණක් ප්‍රමාණවත් වනු ඇතිද යන්න විමසා සිටියාය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මූලිකවියදම් සඳහා අය වැයෙන් වෙන් කර ඇති මුදල පමණක් ලබා ගන්නා බවත් අනෙකුත් කාර්යන සඳහා අනුග්‍රහක හවතුන්ගේ සහය ලබා ගැනීමට කටයුතු කරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය:**

එලෙස අනුු්‍ග්‍රහකයන් සොයා ගන්නේ නම් සභා අරමුදලේ මුදල් ලබා ගැනීමට  අවශ්‍ය වන්නේ නැති බව පැවසුවාය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ කාර්යය සම්බන්ධයෙන් සෘණාත්මකව පමණක් කතා නොකරන ලෙසත් එතුලින් සමාජයට වන යහපත සම්බන්ධයෙන්ද අවධානය යොමු කරන ලෙස දන්වා සිටියේය. 2023 අය වැය ඉදිරිපත් කරන ලද අවස්ථාවේදී අය වැය එමඟින් කාන්තාවන්ට කිසිදු කාර්යයක් සිදු නොකරන බවට චෝදනා කරන ලද්දේත් ගරු මන්ත්‍රිනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය බවත් පැවසූ එතුමා සභා අරමුදලේ මූල්‍ය ප්‍රතිපාදන කාන්තාවන් වෙනුවෙන් සිදු කරන වැඩසටහනක් සඳහා යොදා නොගන්නා ලෙස තවත් කාන්තාවක් විසින් පැවසීම සම්බන්ධයෙන් කණගාටු වන බවත් පවසා සිටින ලදී. මේ කාර්යය සිදු කිරීමේදී පොලීසිය, අධ්‍යාපන කාර්යාලය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ආදී වෙනත් ආයතනද සම්බන්ධ කර ගැනීමට කටයුතු කරන බවත් ඒ සමඟ අවශ්‍ය අනුග්‍රහක භවතුන්ගේ සහයද ලබා ගැනීමට කටයුතු කරන බව පවසා සිටියේය. මේ සම්බන්ධව කාන්තා කමිටුවේදී දීර්ඝ ලෙස සාකච්ඡා කර එයට සහභාගී වූ මන්ත්‍රීතුමියන්ලාගේ සම්පූර්ණ එකඟතාව මත මෙම කාර්යය සිදු කිරීමට කටයුතු කරන බවත් කාරක සභාවකට මහා සභාවට යෝජනා ඉදිරිපත් කිරීමට නොහැකි නිසා ගරු සභාපතිතුමාගේ යෝජනාවක් ලෙස මෙය අද දින සභාවට ඉදිරිපත් කරන බවත් නමුත් මෙය කාන්තා කමිටුවේ එකඟතාව මත සිදු වන කාර්යක් බවත් පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය:**

ළමා හා කාන්තා කමිටු පැවැත්වෙන දිනය ඊට දින දෙදකට හෝ පෙරාතුව දන්වන ලෙස ඉල්ලා සිටියාය. තමන්ද කාර්ය බහුල බැවින් අද දිනයේ රැස්වීම පැවැත්වෙන බවට එදින උදෑසන දුරකථන මාර්ගයෙන් දැනුම් දුන් විට ඒ වන විට යොදා ගෙන ඇති කාර්යන් කළමනාකරණය කර ගත නොහැකි බව පවසා සිටියාය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

කමිටු රැස්වීම් දෙකක් පැවැති බවත් තමන් දන්නා ආකාරයට නම් ඒ රැස්වීම් දෙකම සම්බන්ධයෙන් වේලාසනින් දැනුම් දීම් සිදු කර තිබූ බවත් ඒ දැනුම් දීම් මත අනෙක් මන්ත්‍රීවරියන් කමිටු රැස්වීමට සහභාගී වූ බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

මෙය මෙතරම් දුර දිග ගෙන යා යුතු කතාවක් නොවන බවත් දැන ගැනීමට අවශ්‍ය වන්නේ මේ කාර්ය සිදු කිරීමේදී යම් සම්පත් දායකයෙකු මෙම සභාවේ ශ්‍රවණාගාරයට ගෙන්වා දැනුවත් කිරීමේ වැඩසටහනක් සිදු කරනවාද යන්න බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

අද වන විට ප්‍රදේශයේ ගැබිණි මව්වරුන් පෝෂණ හීනතාවයකින් පෙලෙන බවට සංඛ්‍යා දත්ත මඟින් වාර්තා වන බවත් එම නිසා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ මූලිකත්වයෙන් මේ සඳහා පත් කර ඇති දිස්ත්‍රික් කමිටුව හා පළාත් කමිටුව මඟින් පළාත් පාලන ආයතනය ලෙස අපටද යම් වගකීමක් පවරා ඇති බවත් ඒ අනුව මේ සම්බන්ධයෙන් ගැබිණි මව්වරුන් දැනුවත් කිරීමේ කාර්ය භාරය සිදු කිරීමට සභාවේ මූලිකත්වයෙන් කටයුතු කිරීමට අදහස් කරන බව පවසා සිටියේය. අද වන විට බොහෝ ගැබිණි මව්වරු පෝෂ්‍ය ගුණයෙන් පිරි පහසුවෙන් සකස් කර ගත හැකි දේශිය ආහාරවේලක් සකස් කර ගන්නා ආකාරය පිළිබඳව නොදන්නා බවත් ඒ සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කිරීම සඳහා යම් කාර්යක් සිදු කරන ලෙස ඔවුන් විසින් ඉල්ලා සිටි බව පවසා සිටියේය. මේ කාර්යයේදී එය එක් වසමකට පමණක් සීමා නොකර බල ප්‍රදේශයේ සියළුම ගැබිණි මව්වරුන් සේම පෙර පාසල් දරුවන්ද ඒ සඳහා සම්බන්ධ කර ගැනීමට අදහස් කරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ශ්‍රියානි ජයකොඩි මැතිණිය:**

තමන්ටද ඒ කමිටු රැස්වීම් දෙක සඳහා සහභාගී වීමට නොහැකි වූ බවත් නමුත් මේ සිදු කරනු ලබන කාර්යය අගය කරන බව පවසා සිටියාය. පසු ගිය සභා රැස්විමේදීත් තමන්ට පෙර පාසල් වල දරුවන්

සඳහා දිවා ආහාර වේලක් ලබා දීමේ වැඩසටහනක් සිදු කිරීම සම්බන්ධයෙන් යම් කාර්යක් සිදු කිරීමට යෝජනා කිරීම සඳහා අදහස් කරගෙන සිටියද එය සිදු කළ නොහැකි වූ බවත් මේ ආකාරයෙන් හෝ එවැනි කාර්යක් සඳහා මුලික වීම සම්බන්ධයෙන් සතුටු වන බවත් පවසා සිටියාය.

(ගරු මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා , ගරු මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා සභාවට පැමිණෙන ලදි.ප:ව: 12.05)

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

පෙර පාසල් දරුවන් සඳහා දිවා ආහාරය ලබා දීම තරමක් අසීරු කාර්යක් බවත් ඒ වෙනුවට පැමිණෙන දිනයේදී අදාල පෙර පාසලේ දරුවන්ට සුප් වීදුරුවක් හෝ කැඳ වීදුරුවක් ලබා දීම සඳහා කටයුතු කරන බවත් ඊට අමතරව මේ ප්‍රදේශයෙ සිටින දේශීය හා බටහිර වෛද්‍යවරු සහභාගී කරවාගෙන දැනුවත් කිරීමක් සිදු කිරීමට අදහස් කරන බවත් එමඟින් අවටින් සොයා ගත හැකි ආහාර වලින් දරුවන්ට අවශ්‍ය පෝෂණීය ආහාරවේලක් සකස් කර ගන්නා ආකාරය සම්බන්ධයෙන් උපදෙස් ලබා දෙන බවත්.මෙය වසම් මට්ටමින් සියළුම පෙර පාසැල් වල සිදු කිරීමට අදහස් කරන බවත් සංග්‍රහය සඳහා අනුග්‍රහකයන්ගේ සහය ලබා ගන්නා අතර වෛද්‍යවරු ඇතුළු සම්පත් දායකයින් සහ අනෙකුත් පිරිස් සභාවේ වාහන යොදාගෙන ප්‍රවාහන කටයුතු ආදිය වෙනුවෙන් වෙන් කර ගත් ප්‍රතිපාදන මෙම කාර්ය සඳහා යෙදවීමට අදහස් කරන බව පවසා සිටියේය.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(xii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙම සභාවේ සේවා ගිවිසුම් මත රියදුරු තනතුරේ සේවය කරනු ලබන එම්.ජී.නිලන්ත මහතාගේ ගිවිසුම්ගත කාලය 2022.12.24 දිනෙන් අවසන් වන බැවින් ඉදිරි වර්ෂයක කාලයක් සඳහා නැවත දීර්ඝ කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(xiii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2023 වර්ෂය සඳහා දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට අවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමට (ඇමුණුම 04 හි සඳහන් භාණ්ඩ හා සේවා සඳහා) සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීමටත් ඒ සඳහා සිංහල,දමිළ,මාධ්‍යයෙන් දිනමිණ, තිනකරන් පුවත්පත් වල දැන්වීම් පළ කර අයදුම්පත් කැඳවීමටත් එක් අයිතමයක් සඳහා ලියාපදිංචි වීමට රු.500.00ක් අය කිරීමටත් එක් අයිතමයකට වඩා ලියා පදිංචි වන්නේ නම් රු.100.00 ක අතිරේක ගාස්තුවක් අය කිරීමත් සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභා වාර්තා සලකා බැලීම:**

2022.10.26 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව, 2022.10.26 දින පැවති දින පැවති කාර්මික හා සේවා කාරක සභා වාර්තාව, 2022.10.26 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව, සහ 2022.10.26 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා කමිටු වාර්තාව සලකා බලන ලදී.

(උ) 2022 ඔක්තොම්බර් මාසයට අදාල එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව (ඇමුණුම 05) හා වියදම් විස්තරය (ඇමුණුම 06) සලකා බැලීම.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

සභාවේ ලිපි ශිර්ෂය යටතේ තිඹිරිපොල සුජීව හරිස්චන්ද්‍ර මහතාගේ නිවස පිහිටි ඉඩමේ ඇති අනතුරුදායක ගස් දෙකක් ඉවත් කරන ලෙස දන්වා ලිපියක් යවා ඇති බවත් එය නිරීක්ෂණය කිරීම සඳහා සභාවෙන් එම ස්ථානයට කිසිවෙකු ගියාද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

අනතුරුදායක ගස් පරීක්ෂා කිරීම සඳහා යන්නේ කාර්මික නිලධාරීන් බවත් ගරු මන්ත්‍රීතුමා පැවසූ සිදුවීමට අදාලව කාර්මික නිලධාරි විසින් පරීක්ෂා කර ලබා දුන් වාර්තාවට අනුව එම ලිපිය යොමු කර ඇතත් ඒ සම්බන්ධයෙන් නැවත පරීක්ෂාවක් සිදු කරන ලෙස අදාල පාර්ශවය ලිඛිතව ඉල්ලා සිටි බවත් ඒ අනුව මෙම ගැටළුව සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂාවක් සිදු කර වාර්තා කිරීම සඳහා කාර්මික හා සේවා කාරක සභාව වෙත යොමු කළ බව පවසා සිටින ලදී.

**(ඍ) වෙනත් කරුණු:**

සභාවට දන්වා නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම:

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා:**

ගරු ප්‍රාදේශීය සභ මන්ත්‍රිනී නයනා ප්‍රියන්ති මැතිණිය අසනීප තත්වයක් හේතුවෙන් අද දින මහා සභා රැස්වීම සඳහා සහභාගී නොවන බැවින් එතුමිය වෙනුවෙන් අසනීප නිවාඩු අනුමත කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු ප්‍රාදේශීය සභ මන්ත්‍රිනී නයනා ප්‍රියන්ති මැතිණිය සඳහා අසනීප නිවාඩු අනුමත විය

ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ මන්ත්‍රීතුමියන්ලාගේ අදහස් ඉදිරිපත් කිරීම:

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා:**

දයිගල මාර්ගයේ දෙපස කැලෑ වැවී ඇති බැවින් එම මාර්ගය භාවිතා කරන ජනතාව මහත් අපහසුතාවයට ලක්ව ඇති බවත් එම මාර්ගය දෙපස කැලෑ වැවීම හේතුවෙන් කාණු පද්ධතිය හරහා වතුර බැස යාමට අවහිර වී ඇති බවත් ඒ හේතුවෙන් වැසි දිනවල මාර්ගයේ ගමන් කිරීමට නොහැකි වන ලෙස වැසි ජලය පිරී යන බවත් පැවසීය. මේ සම්බන්ධයෙන් දෙහිඕවිට විධායක ඉංජිරෙු දැනුවත් කළත් මේ වන තෙක් කිසිදු විසඳුමක් නොලැබුණු බැවින් සභාවේ මැදිහත් වීමෙන් හෝ මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේය. එසේම මැතකදී නාපාවල ප්‍රදේශයේ වීථි ලාම්පු සවි කළ බවත්

ඇතැම් වීථි ලාම්පු තමන් හෝ ප්‍රදේශයේ ජනතාව විසින් මිලදී ගෙන සභාවේ සේවකයන් මඟින් සවි කර ගත් බවත් නමුත් පසුගිය දින වල පැවති වර්ෂාව සමඟ ඇති වූ අකුණු තත්වයන් හේතුවෙන් ඇතැම් විදුලි බල්බ ක්‍රියා විරහිත වී ගොස් ඇති බැවින් ඒවා සම්බන්ධයෙන් සොයා බලන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

තමන් අදාල ආයතනයට ගොස් මෙම මාර්ග සම්බන්ධයෙන් දැනුවත් කළ බවත් මුදල් නොමැති තත්වය මත අදාල කාර්යන් සිදු කරනු ලබන කොන්ත්‍රාත්කරුවන් සිය කාර්යන් නවතා ඇති බව එහිදී දැන ගැනීමට ලැබුණු බවත් මූල්‍ය ප්‍රතිපාදන නොමැති වීම මත අලුතින් කොන්ත්‍රාත් ලබා දීමත් තාවකාලිකව නවතා තිබෙන බවට ඔවුන් විසින් ප්‍රකාශ කළ බවත් පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා:**

ගරු මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමාත් සඳහන් කරන ලද අල්ගොඩ මාර්ගයේ ඇති කඩතොලු සහිත ස්ථාන සඳහා සභාවේ ප්‍රිමික්ස් අංගනයෙන් සකස් කරන ලද ප්‍රිමික්ස් යොදාගෙන එය සකස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා:**

දේවාලකන්ද වත්තේ ඇති වතු නිවාස වලට එම වත්තේ පිහිටි අනතුරුදායක ගස් වලින් සිදු වීමට ඇති හානි පෙන්වා දෙමින් මීට මාස 07 කට පමණ පෙර සභාවට ලිපියක් භාර දී ඇති බවත් එහෙත් ඒ සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගැනීමක් සිදු වී නොමැති බවත් පෙන්වා දෙන ලදී. වතු අධිකාරිය දැනුවත් කළත් එම ගස් වලින් හානියක් සිදු නොවන බවට ඔවුන් විසින් ප්‍රකාශ කරන බව පැවසූ එතුමා පසුගිය දින වල පැවති වර්ෂා තත්වය හමුවේ එම ගසක් කඩා වැටීම හේතුවෙන් නිවසකට සහ ඒ අසල නවතා තිබූ ත්‍රීරෝද රථයකට හානි සිදු වී ඇති බව පෙන්වා දෙන ලදී. සභාව මඟින් වතු අධිකාරියට අනතුරුදායක ගස ඉවත් කර ගන්නා ලෙස දන්වා ඇත්නම් එම ලිපි සහ සිහි කැඳවීම් සිදු කළේද දැනුවත් කර තිබියදී අදාල වතු අධිකාරීන් විසින් එය නොසලකා හැර ඇත්නම් ඒ සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි පියවර කුමක්ද යන්න විමසා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

පළමු දෙවන සහ තෙවන වශයෙන් සිහි කැඳවීම් ලිපි යවන බවත් එලෙස සිදු නොකළ හොත් අදාල පාර්ශවකරුට ගස කපන පුද්ගලයෙකු සම්බන්ධ කර දෙන ලෙස දන්වා පොලීසිය සහ කාර්මික නිලධාරී සම්බන්ධ කරගෙන ගස කපා ඉවත් කිරීමට කටයුතු කිරීම සභාව මඟින් සිදු කරනු ලබන ක්‍රමවේදය බව පැහැදිලි කර දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා:**

දේවාල කන්ද වත්තේ වතු කම්කරු ජනතාව විසින් අනතුරුදායක ගස් පිළිබඳව වතු අධිකාරිය දැනුවත් කළත් කම්කරු ජනතාව පවසන දෑ සම්බන්ධයෙන් සංවේදී වීමක් වතු පාලනාධිකාරිය විසින් සිදු නොකරන බැවින් ඔවුන් අපහසුතාවයට පත් වන බවත් ගස් වල අතු හෝ ගස් කඩා නොවැටෙන බවට ඔවුන් විසින් ප්‍රකාශ කර යම් ලෙසකින් කඩා වැටුණහොත් ඔවුන් ඒ සම්බන්ධයෙන් කිසිවක් නොදන්නා බව ප්‍රකාශ කරන බවත් පැවසූ එතුමා හම නිසා එලෙස යවන ලද සිහි කැඳවීම් ලිපි හෝ වෙනත් ලිපි වල පිටපත් සභාව සතුව ඇති බැවින් එලෙස පැමිණිලි කර එයට අදාලව ලබා දුන් නියෝග පිළිපැදීම් සිදු කර නොමැති එක් පුද්ගලයෙකුට හෝ විරුද්ධව නෛතික ක්‍රියා මාර්ග ගැනීමට මේ සභාව ක්‍රියාත්මක වුවහොත් එය ආදර්ශයක් වනු ඇති බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී.ප:ව: 12.15)

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දැනටත් ඒ ආකාරයට කටයුතු කරන බවත් එලෙස කපා ඉවත් කර නොගන්නා ගස් සභාවේ මැදිහත්වීමෙන් කපා ඉවත් කිරීමට කටයුතු කර ඇති අවස්ථා බොහොමයක් තිබෙන බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා:**

සභාවට තමන් විසින් සිදු කළ දැනුම් දීමෙන් පසුව අටුළුගම නගරයේ කාණු පද්ධතිය පිරිසිදු කර ඒවායේ අවහිරතා ඉවත් කිරීමට සභාවේ කම්කරුවන්ගේ සහයෝගයෙන් කටයුතු කළ බැවින් මෙවර ඇති වූ ධාරාණිපාත වර්ෂාව අවස්ථාවේදී නගරය ජලයෙන් යට නොවූ බව පවසා සිටියේය. ඒ සම්බන්ධයෙන් අටුළුගම ජනතාවගේ ප්‍රශංසාව ගරු සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට පිරිනමන ලෙස අද උදැසන තමන් මහා සභා රැස්වීම සඳහා පැමිණෙන අවස්ථාවේදී එම ජනතාව විසින් පැවසූ බව ප්‍රකාශ කර සිටියේය. එහි නිවාස අසල ඇති කාණු පද්ධතිය තුළ තිබෙන අවහිරතා ඉවත් කිරීම පමණක් සිදු කළ නොහැකි වූ බවත් එදින ඒ සඳහා යම් පිරිසක් පත් කළද ඔවුන් පසුදා අදාල කාර්ය සිදු කිරීමට සහභාගී වූ පසු නැවත නොපැමිණි බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටියේය. එසේම අද වනවිට මේ සමාජයේ දරුවන් බොහොමයක් නොමඟ ගොස් ඇති බවත් මත්ද්‍රව්‍ය ආදියට යොමුවී තරුණ වයසේදීම තම ජීවිත විනාශ කර ගැනීම සුලබව දක්නට ලැබෙන බවත් පැවසූ එතුමා දහම් අධ්‍යාපනය වෙත දරුවන් යොමු වීමේ අඩු බව මෙයට හේතුවක් වී ඇති බව පෙන්වා දෙන ලදි. එසේ වී ඇත්තේ ඉරිදා දිනයේ දහම් පාසල් පැවැත්වෙන කාල සීමාවේදීත් පෞද්ගලික උපකාරක පංති පැවැත්වීම හේතුවෙන් ඒ සඳහා දරුවන් වැඩි වශයෙන් යොමු වීම මත බව පෙන්වා දුන් එතුමා දහම් පාසල් අධ්‍යාපනයෙන් සමාජ විරෝධී ක්‍රියා වල ආදීනව පෙන්වා දෙන බවත් අද දරුවන්ට එය අහිමි වී ඇති බවත් පවසා සිටියේය. උපකාරක පංති හේතුවෙන් පාසල් අධ්‍යාපනයට අමතරව විෂය කරුණු සඳහාවිශාල දැනුම් සම්භාරයක් ලැබෙන බවත් තමන් විසින් උපකාරක පංති වලින් ලබා දෙන අධ්‍යාපනය කිසිසේත්ම හෑල්ලු නොකරණ බවත් පැවසූ එතුමා ඉරිදා දිනයේ දහම් පාසල් පැවැත්වෙන කාල සීමාව තුළ පමණක් උපකාරක පංති නොපවත්වන ලෙස උපකාරක පංති ගුරුවරුන්ගෙන් ඉල්ලා සිටීමට හැකියාවත් ඇත්නම් ඒ කාලය තුළ දරුවන් දහම් පාසල් අධ්‍යාපනය සඳහා යොමු කරවා ගැනීමේ අවස්ථාව උදා වන බව පවසා සිටියේය. දහම් පාසල් පැමිණෙන දරුවන් උපකාරක පංති සඳහා සහභාගී වීමට ඇති බැවින් පෙ:ව: 11.00 වන විට දහම් පාසලෙන් යා යුතු බවට ප්‍රකාශ කරන බවට දහම් පාසල් ගුරුවරු පවසන බවත් මේ සම්බන්ධයෙන් මෙම සභාවේ මැදිහත් වීමෙන් යමක් සිදු කළ හැකි නම් වඩාත් කාලෝචිත බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා සභාවට පැමිණෙන ලදී. ප:ව: 12.20)

එම නිසා අඩුතරමින් ශිෂ්‍යත්ව හා සාමාන්‍ය පෙළ පංති වල දරුවන් හැර අනෙකුත් පංති වල දරුවන් හෝ දහම් පාසල් අධ්‍යාපනය සඳහා යොමු කිරීමට කටයුතු කළ යුතු බවත් එම නිසා අවම වශයෙන් ඉරිදා දිනයේ උදේ වරුව හෝ උපකාරක පංති පැවැත්වීමෙන් නිදහස් කර ගැනීමට සාකච්ඡා කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

(ගරු මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. ගරු මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා සභාවට පැමිණෙන ලදී. ප:ව: 12.21)

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද්දේ කාලෝචිත යෝජනාවක් බවත් කුමන ආගමක හෝ වේවා දරුවන් දහම් අධ්‍යාපනය ලැබීම විය යුතු කාර්යක් බව පවසා සිටියේය. මීට පෙර මේ සම්බන්ධයෙන් තමන් කාර්ය මණ්ඩලය සමඟත් කතා කළ බව සිහිපත් කළ එතුමා අද වන විට අධ්‍යාපනය වෙළඳාමක් වී ඇති බවත් ඍජුව මුදල් මූලික කරගෙන උපකාරක පංති පැවැත්වෙන බවත් පවසා සිටියේය. මෙම උපකාරක පංති වාණිජ අරමුණින් සිදු කළත් සභාවට එයින් කිසිදු ආදායමක් නොලැබෙන බවත් අඩු තරමින් වෙළඳ බලපත්‍රයක් හෝ උපකාරක පංති වෙනුවෙන් ලබා ගැනීමක් සිදු නොවන බව පවසා සිටියේය. එම නිසා පෞද්ගලික උපකාරක පංති පිළිබඳව අතුරු ව්‍යවස්ථාවක් සකස් කර පෞද්ගලික

උපකාරක පංති පැවැත්වීම විධිමත් කිරීමට සභාවට හැකි වනු ඇති බවත් එලෙස සකස් කරන අතුරු ව්‍යවස්ථාව මඟින් ලබා දෙනු ලබන බලපත්‍රයේ ඉරිදා දිනයේ උදේ වරුව උපකාරක පංති සඳහා නිවාඩු ලබා දෙන ලෙස සඳහන් කල හැකි බව පවසා සිටියේය. එම නිසා ඉදිරියේදී මේ සඳහා මහා සභා අනුමැතියක් ලබා ගෙන අදාල කාර්යය සිදු කිරීමට කටයුතු කිරීම සුදුසු බැවින් එලෙස ඉදිරි කටයුතු සිදු කරන බව ප්‍රකාශ කර සිටියේය.

(ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා සභාවට පැමිණෙන ලදී. ප:ව: 12.24)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා:**

තල්දූව කැළණිවැලි ක්‍රීඩාංගනය පිහිටි ඉඩමෙන් පර්චස් 10 බැගින් කොටස් කඩා නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ඉඩම් කොටස් වෙන්දේසි කිරීමට කටයුතු කර ඇති බවත් මෙමඟින් මහත් විනාශයක් සිදු වී ඇති බවත් පවසා සිටියේය. තල්දූව සමෘද්ධි හිමි ජනතාව වෙනුවෙන් අපද සටන් කර එයින් ඉඩම් කොටස් 05 ක් වෙන් කර ගත් බව පවසූ එතුමා මෙම ඉඩම් කැලි 05 ට අමතරව අනෙක් ඒවායේ වැඩ දැනටමත් ආරම්භ කර ඇති බැවින් තල්දූව ජනතාව වෙනුවෙන් වෙන් කර ගත් කොටස් 05 සම්බන්ධයෙන් කිසිදු වගකිව යුතු නිලධාරියෙකු ඉදිරිපත් නොවන බවත් පවසා සිටියේය. එම නිසා ප්‍රදේශවාසීන් හැර වෙනත් කිසිදු පුද්ගලයෙකුට මේ ඉඩම් කොටස් 05 ට අයිතිවාසිකම් කීමට අවස්ථාව නොදෙන ලෙසත් මීට පෙර අවස්ථා වලදීත් කෑගල්ල දිස්ත්‍රික් දේශපාලන ප්‍රධානීන් යැයි කියා ගනිමින් ඇතැම් පිරිස් මේ කාර්යන් සඳහා මැදිහත් වීමට උත්සාහ කළ බවත් නැවත එවැනි තත්වයක් ඇති නොවීමට වග බලා ගන්නා ලෙසත් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටියේය. මේ ප්‍රදේශයේ අහිංසක ජනතාවට හිමි විය යුතු දේ ඔවුන් සඳහා ආරක්ෂා කර දීමට ගරු සභාපතිතුමාට මැදිහත් වන ලෙසත් දිස්ත්‍රික් ලේකම් සමඟ මේ පිළිබඳව සාකච්ඡා කරන ලෙසත් ඉල්ලා සිටියේය. කැබිනට් අමාත්‍යවරයෙකුගේ නියෝගයක් ලබා ගෙන එන ලෙස දන්වා ඇති බවට තමන්ට දැන ගැනීමට ලැබුණු බවත් මේ ප්‍රදේශයෙ ජනතාවට හිමි දේ ලබා ගැනීම සඳහා කැබිනට් නියෝග අවශ්‍ය වන්නේ කුමටදැයි විමසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා:**

ගර මන්ත්‍රී දරුක් මැතිතුමා පැවසූ කතාවේ සත්‍යක් ඇති බවත් තමන් මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් හමුවී කතා කළ බවත් පැවසීය ඒ අනුව එම ඉඩම් කොටස් වෙන්දේසි කළ පසු ප්‍රදේශයේ සමෘද්ධි ලාභීන්ට පමණක් මේ මුදල් බෙදීමට තීරණය කර ඇති බවට ඔහු විසින් ප්‍රකාශ කළ බව සිහිපත් කළ එතුමා එයට තමන් දැඩිව විරුද්ධ වී සමෘද්ධිලාභීන්ට පමණක් නොව අඩු ආදායම් ලාභීන්ටද එය බෙදී යායුතු බවට ප්‍රකාශ කළ බැවින් ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් එකඟ වූ බවත් එම ඉඩම් 05 ට යම් අත්තනෝමතික යමක් සිදු වුවහොත් ඒවා රාජ්‍ය දේපල නිසා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමේ හැකියාව ඇති බවත් පෙන්වා දුන් බව පවසා සිටියේය. මේ කාර්යය ජනතාවට වාසිදායක වන ලෙස සිදු කර ගැනීම සඳහා ගරු මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමාද කැපවීමෙන් ක්‍රියා කළ බව පවසා සිටි එතුමා එවැනි අත්තනෝමතික ක්‍රියාවක් සිදු වීමට ඉඩ නොලැබෙනු ඇති බවත් රාජ්‍ය දේපලක් නිසා එලෙස සිදු වීමේ හැකියාවක් නොමැති බවත් පවසා සිටියේය. සභාව තුළ ගැටළු සහගත කරුණුම කියා පාමින් ගරු සභාපතිතුමා අපහසුතාවට පත් කිරීමට කටයුතු කරනවා යැයි නොසිතන ලෙසත් වීථි පහන් සම්බන්ධ ගැටළු වලදී සභාවේ සේවකයන් අතින් සිදු වන යම් යම් අතපසුවීම් සම්බන්ධයෙන් සභාපතිතුමාගේ අවධානය යොමු කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව පවසා සිටියේය. වීථි පහන් සවි කිරීම සම්බන්ධ ගැටළු වලදී ගරු සභාපතිතුමා දැනුවත් කළ පසු කඩිනමින් එය විසඳීමට ගරු සභාපතිතුමා අදාල සේවකයන් දැනුවත් කළත් ඔවුන්ගෙන් එම කාර්ය නිසි ආකාරයට සිදු නොවන බව පවසා සිටියේය. එසේම බල්බයක් සවි කළ පසු වසරක වගකීම් කාලයක් තිබෙන බැවින් කලින් පිළිස්සී ගිය බල්බ එම කණු වලින් ගලවා ඉවත් කිරීමට කටයුතු නොකරන බව පැවසූ එතුමා ඊයේ දිනයේත් ගරු සභාපතිතුමාගේ මැතිවරණ ව්‍යාපාරයට සහය දුන් තල්දූව ප්‍රදේශයේ පුද්ගලයෙකු සිය නිවසේ පැවති දානමය පිංකම අවස්ථාවේදීවත් ඒ අසල ඇති බල්බය දමා ගැනීමට නොහැකි වූ බව පවසා ගරු

සභාපතිතුමාට, තමන්ට සහ ගරු මන්ත්‍රී දරුක් මැතිතුමාට දෝෂාරෝපණය කළ බව පවසා සිටියේය. එම නිසා මේ වන විට සභාවට මිලදී ඇති බල්බ සංඛ්‍යාව ඒවායින් සවිකරන ලද ප්‍රමාණය සහ පිළිස්සී ගොස් ඇති ප්‍රමාණය කොපමණදැයි යන්න සම්බන්ධයෙන් දැනුවත් වන ලෙස ඉල්ලා සිටියේය. අද පවතින තාක්ෂණය සමඟ කුඩා යෙදුම් (App) රැසක් තිබෙන බවත් ඒවායින් මෙම තොරතුරු දත්ත ගබඩා කර ගත හැකි ක්‍රමවේද සකස් කර ගත හැකි බවත් පවසා සිටියේය. එසේම තමන්ට නොදන්වා තම වසම තුළ බල්බ සවි කිරීමක් අවස්ථා කීපයකදී සිදු වී තිබූ බවත් මහජන නියෝජිතයන් ලෙස තමන්ට ඇති පිළිගැනීම ඒ මට්ටමින් හෑල්ලු කළ විට ප්‍රදේශයේ ජනතාවගේ චෝදනාවන්ට ලක් වීමට නිරන්තරයෙන් සිදු වන බවත් පෙන්වා දෙන ලදී. ෆර්හාන් මැතිතුමා මුදල් වියදම් කර බල්බ සවි කර ගත් බවට ප්‍රකාශ වූ බව සිහිපත් කළ එතුමා එතුමාට ඒ ආකාරයේ සේවාවක් ලබා දෙන්නේ නම් එවැනි සේවයක් මේ සභාව නියෝජනය කරනු ලබන අනෙකුත් මන්ත්‍රීවරුන්ටත් ලබා දීමට කටයුතු කළ යුතු බවත් පවසා සිටියේය. එසේම ඉන්ධන පිරවුම්හල ඉදි කිරීම සම්බන්ධව අද මන්ත්‍රීවරු විවිධ අදහස් ප්‍රකාශ කළ බවත් ඒවා ගණන් නොගෙන සිටිය හැකි කරුණු නොවන බවත් එම අදහස් වලද යම් ගත යුත්තක් ඇති බව පැවසීය. වීථි පහන් සම්බන්ධ ගැටළු නිසා ඉදිරියේදී සභාව විශාල අර්බුද වලට මුහුණ දිය හැකි බැවින් මේ කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටියේය. ගබඩාවෙන් බල්බ නිකුත් කරන්නේ කාටද යන්න පිළිබ දව සොයා බලන ලෙසත් ඒවායේ සීරියල් අංක ඇති නිසා ඉවත් කරනු ලබන බල්බ වලට සිදු කරන්නේ කුමක්ද යන්න පිළිබඳවත් දැන ගත හැකි බව පවසා සිටියේය. පිළිස්සී ගිය බල්බ පිළිබඳව පැමිණිලි ලැබුණු පසු නව බල්බ සවි කිරීමක් සිදු කිරීමේ කාර්ය සිදු වුවත් එය නිකුත් කරන ලද්දේ කාටද කවදාද යන්න සම්බන්ධයෙන්ද සොයා බැලිය යුතු බව පවසා සිටියේය. මෙතන වංචාවක් දූෂණයක් සිදු නොවන බවත් අකාර්යක්ෂමතාවය මෙයට හේතු වන බවත් පවසා සිටියේය. වසර 04 ක කාලයක් මේ කරුණ සම්බන්ධයෙන් පෙන්වා දුන්නත් එය නිවැරදි කර ගැනීමක් සිදු නොවූ බවත් තව මාස කීපයකින් මේ පළාත් පාලන ආයතන විසුරුවා හැරි පසු අප නැවත පත් නොවුනහොත් නිවෙස් වල සිටියත් මහජනතාවගේ දෝෂ දර්ශනයට ලක් වීමට මේ කරුණු හේතු වන බව පවසා සිටියේය. එසේම බල්බ් සවි කිරීම සම්බන්ධයෙන් විදුලි කාර්මිකගෙන් විමසා සිටි විට සභාපතිතුමා ප්‍රකාශ කළහොත් එම කාර්ය සිදු කළ හැකි බවට පවසන බවත් එසේ වීමට නම් වසම් නියෝජනය කරමින් මහජන නියෝජිතයන් සිටින්නේ ඇයිද යන්නත් විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

කල් ඉකුත් වීමේ දිනයට පෙර පිළිස්සී ගිය විදුලි බල්බ 150 කට වැඩි සංඛ්‍යාවක් මාරු කිරීම සඳහා ලබා දී ඇති බවත් නමුත් කඩවල අදාල බල්බ් තොග නොමැති වීම මත ගැටළු සහගත තත්වයක් උද්ගත වී ඇති බවත් පවසා සිටියේය. බල්බ ලබා ගැනීම් හා නිකුත් කිරීම් සම්බන්ධයෙන් වෙනම ලේඛනයක් නඩත්තු කරන බවත් පසු ගිය කාලයේ ගෙන්වන ලද බල්බ තුන්සිය ගණනකින් බල්බ 150 කට අධික සංඛ්‍යාවක් මාරු කිරීමට නියමිතව ඇති බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා:**

ගරු මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමාගේ ප්‍රකාශය සමඟ තමන්ද එකඟ වන බව පවසා සිටියේය. 2022 වර්ෂයේ අයවැය පසු වී සති 02 ක කාලයකින් පසු ගරු සභාපතිතුමා මඟින් නිමල් රජපක්ෂ මැතිතුමා නියෝජනය කරන හිඟුරලකන්ද වසමේ පිළිස්සී ගොස් ඇති විදුලි බල්බ නැවත දමා දෙන ලෙස විදුලි කාර්මිකව දැනුවත් කළ බවත් එම සිදු වීම වී වසරක කාලයක් ඉක්ම ගියද අදාල කාර්ය ඉටු නොවූ බවත් මේ වන විට විදුලි කාර්මික ඔවුන්ගේ මුහුණ නොබලන බවත් පවසා සිටියේය. මත්පැන් බෝතලයට බල්බ දමා දෙන බවට තමන් මීට පෙර අවස්ථාවක ප්‍රකාශ කලේ මේ හේතු නිසා බවත් පැවසීය. තමන් මීට පෙර සිටි කාර්මික නිලධාරී විජේතුංග මහතා මාර්ගයෙන්ද ඔහු දැනුවත් කළ බවත් කිසිදු අවස්ථාවක ඒ සම්බන්ධයෙන් අවධානය යොමු නොකළ බවත් පවසා සිටි එතුමා එම නිසා අදාල සේවකයා සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරන්නේ නම් එය සුදුසු බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා:**

මීට පෙර මහා සභා රැස්වීමක මාදොල ප්‍රදේශයේ ප්‍රජා ශාලාවක් සභාවට පවරා ගන්නා ලෙස තමන් විසින් ඉල්ලීමක් සිදු කර යෝජනාවක් සභාවට ඉදිරිපත් කළ බවත් ඒ සම්බන්ධයෙන් කටයුතු වලදී වර්තමාන තත්වය පිළිබඳව විමසා සිටියේය. එම ප්‍රදේශයේ අඩු ආදායම් ලාභී පවුල් වල දරුවන් එම ප්‍රජා ශාලාවේ පවත්වාගෙන යන පෙර පාසලේ අධ්‍යාපනය ලබන බවත් අද වන විට එහි වහලය දිරා ගොස් විටින් විට එහි උළු කැට බිමට වැටී ඇති බවත් පවසා සිටියේය. අයිතිකරුවෙක් නොමැති බැවින් මෙය සභාවට පවරාගෙන එහි නඩත්තු කටයුතු සිදු කරන ලෙස තමන් ඉල්ලා සිටින බවත් මාදොල ප්‍රාදේශයේ සෞඛ්‍ය සායන හා පොදු සුබසාධක කටයුතු බොහොමයක් සිදු කරන්නේ මේ ප්‍රජා ශාලාව මූලික කරගෙන බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ශ්‍රියානි ජයකොඩි මැතිණිය:**

දහම් පාසල් දරුවන් දහම් අධ්‍යාපනය සඳහා යොමු නොවන බවට ප්‍රකාශ වූ බවත් එසේම මේ ගැටළුව පොහොය දින වලදීත් දක්නනට ලැබෙන බවත් එදිනටත් පුද්ගලික උපකාරක පංති පැවැත්වෙන බැවින් පාසල් දරුවන් සිල් සමාදම් වීම සඳහා සහභාගී විමේ අඩුවක් දක්නට ලැබෙන බවත් පවසා සිටියාය. එසේම පුද්ගලික උපකාරක පංති වල ඉගැන්වීම් සිදු කරන්නේ පාසල් වල ගුරුවරුන් බැවින් එම පංති සඳහා දරුවන් සහභාගී නොවන විට එම දරුවන්ට දඬුවම් ලබා දීමක් සිදු කරන බැවින් දහම් අධ්‍යාපනය පසෙකලා ඒ දරුවන් පෞද්ගලික උපකාරක පංති සඳහා සහභාගී වීම සිදු කරන බව පවසා සිටින ලදී. එම නිසා ගරු මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා විසින් සිදු කළ යෝජනාව සම්බන්ධයෙන් අවධානය යොමු කර එය කඩිනමින් මේ බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා:**

ඉරිදා පස්වරු 02.00 වන තෙක් පෞද්ගලික උපකාරක පංති පැවැත්වීම පළාත් සභාව මඟින්ම මීට පෙර තහනම් කර තිබූ බවත් ඒ චක්‍ර ලේඛය සොයා ගැනීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටියේය. එසේම මාර්ග දෙපස දමා ඇති බැනර් කටවුට් සඳහා සභාවේ අවසරය ලබා ගත යුතු බවත් සීතාවක පාලම අසල එලෙස සභාවේ අවසරය ලබාගෙන ඉදි කර ඇති දැන්වීම් පුවරුවක් ප්‍රධාන පාරට ආසන්නව ඉදි කර ඇති බවත් එය වාහන ගමන් කිරිමේදී අවධානම් තත්වයක් ඇති ආකාරයට ඉදි කර තිබෙන බවත් පෙන්වා දෙන ලදී. එම නිසා සභාවට මුදල් බැඳ අවසර ගෙන දැන්වීම් පුවරු ඉදි කළත් ඒවා සම්බන්ධයෙන් පසු අධීක්ෂණයක්ද සභාවේ නිලධාරීන් යොමු කර සිදු කළ යුතු බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

රජය මඟින්ම ඉරිදා සහ පෝය දින වල පෞද්ගලික උපකාරක පංති පැවැත්වීම මුළු රටේම තහනම් කර පොදු නීතියක් පැනවූ බව සිහිපත් කළ එතුමා එය අද වන විට රටේ බහුතරයක් ප්‍රදේශ වල සිදු නොවන බැවින් සභා තීරණයක් මඟින් දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හෝ සිදු කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේය. එසේම කැළණිවැලි ක්‍රීඩා පිටියේ මැණික් පතල් වෙන්දේසි කිරීම සිදු කර එමඟින් ලබන ආදායම සමෘද්ධි ලාභීන්ට ලබා දීම සඳහා යැයි පවසමින් එයින් කොටස් කීපයක් වෙන් කර ගත් බවත් ඒවා පසුව සභාපතිතුමා විසින් තබා ගෙන පසුව ඒවායේ මැණික් ගැරීමට යන බවට කටකතාවක් යන බැවින් ඒ පිලිබඳව තමන්ගෙන් පුද්ගලයින් කීපදෙනෙකුම විමසා සිටි බවත් තමන් ඒ සම්බන්ධයෙන් නොදන්නා බැවින් ඔවුන්ටද එලෙස පැවසූ බවත් ප්‍රකාශ කර සිටියේය. ගරු මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා ප්‍රකාශ කළ පරිදි මෙය තල්දූව ප්‍රදේශයේ ජනතාවගේ පෞද්ගලික දේපලක් නොවන බවත් එම ක්‍රීඩා පිටියේ පෞද්ගලික අයිති හිමි පුද්ගල කොටසක් වෙනම සිටින බවත් නමුත් මේ මැණික් ගැරීම

තුළින් ලැබෙන ආදායම තල්දූව ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී ජනතාවට පමණක් ලබා දීමට තමන් විරුද්ධ බව පවසා සිටියේය. දෙහිඕවිට ප්‍රාදේශිය සභාව නියෝජනය කරන මහජන නියෝජිතයන් ලෙස එයින් ලැබෙන ආදායම මේ බල ප්‍රදේශයේ සිටින සියළුම අඩු ආදායම් ලාභී සහ ආබාධිත පුද්ගලයන් අතර සමසේ බෙදී යායුතු බවට තමන් අදහස් කරන බව පවසා සිටියේය.පසු ගිය කාලයේ සීතාවක පාලම අසල මැණික් ලබා ගෙන ඒවා වෙන්දේසි කළ බවත් මේ සභාවේ සිටි වගකිව යුතු පුද්ගලයන් ඒවාගේ චෙක්පත් ලබා ගෙන මාරු කළ බවට ඒ කාලයේ ප්‍රකාශ වූ බවත් පැවසූ එතුමා රු.40,000.00 චෙක්පත් එලෙස මාරු කළ බවට සාක්ෂි ඇතිව ඔප්පු කළ හැකි බවත් එය තමන් වගකීමෙන් ප්‍රකාශ කරන බවත් පවසා සිටියේය. එය පෞද්ගලිකව එක් පුද්ගලයෙකු විසින් සිදු කළත් පොදුවේ ප්‍රාදේශීය සභාවට බලපෑමක් සිදු වූ බවත් ඒ කාලයේදීත් අප විසින් ආබාධිත තරුණ පිරිස් සඳහා එයින් මුදල් ලබා දීමට කටයුතු කල බවත් සිහිපත් කළ එතුමා ඊට අමතරව ප්‍රාදේශිය සභාවට යැයි පවසා මුදල් කොටසක් ලබා ගෙන එයින් ලක්ෂ ගණනක වංචාවක් සිදු කළ බවත් එය කවුරුත් දන්නා කරුණක් බවත් පවසා සිටියේය. එම නිසා මෙවර මුදල් ලබා දිමේදී ඒ සඳහා නිර්ණායකයක් ඇති කර ගත යුතු බවත් එම මැණික් වෙන්දේසි කර ලබා ගන්නා මුදල් තල්දූව ප්‍රදේශයේ ජනතාවට පමණක් නොව මේ බල ප්‍රදේශයේ සිටින සියළුම අත්‍යාවශ්‍ය අඩු ආදායම් ලාභී සහ ආබාධිත පුද්ගලයන් අතර සමසේ බෙදී යායුතු බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එම සිදු වීම් සම්බන්ධයෙන් ප්‍රකාශ කරන විට තම නමත් පැවසූ නිසා ඒ ගැන යමක් පැවසිය යුතු බව ප්‍රකාශ කර සිටියේය. තමන් හෝ සභාව මෙයට කිසිදු සම්බන්ධයක් නොමැති බවත් ප්‍රාදේශිය ලේකම් මේ කාර්යය භාරව සිටින ප්‍රධානියා වන බවත් ඔහු අදාල නිලධාරීන් සම්බන්ධ කරගෙන මේ කාර්ය ඉදිරියට විධිමත්ව සිදු කරගෙන යන බව පවසා සිටියේය. ඒ අනුව මෙවර සභාවට මේ මුදල් වලින් කොටසක් හෝ ප්‍රතිශතයක් නොලැබෙන බවත් ප්රාදේශීය ලේකම් කාර්යාලය ග්‍රාම නිලධාරීන් සහ අනෙකුත් නිලධාරීන් සම්බන්ධ කරගෙන සිදු කරගෙන යන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එච්.අමරාවතී මැතිණිය:**

න්‍යාය පත්‍රය සකස් කිරීමේදී එයට එකතු කරනු ලබන ඇමුණුම් සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු බවත් අද එවැනි කාරණයක් නිසා සභාවේ කාලය වැඩි වේලාවක් වැය වූ බවත් පවසා සිටියාය. එසේම ගරු සභාපතිතුමා විසින් යෝජිත ඉන්ධන පිරවුම්හල් ව්‍යාපෘතිය සඳහා මේ සභාවේ සහය ලබා දෙන ලෙස ඉල්ලා සිටියාය. මේ නගරය තුල මේ වන විට ඇත්තේ එක් ඉන්ධන පිරවුම්හලක් පමණක් බවත් නමුත් ඇහැළියගොඩ නගරයේ ඉන්ධන පිරවුම්හල් තුනක් පවතින බවත් පෙන්වා දුන්නාය. එසේ වුවත් ඒ එකදු ඉන්ධන පිරවුම්හලක් හෝ පාඩු ලබන තත්වයකට පත් නොවන බවට තමන්ට විශ්වාස බවත් පවසා සිටියාය. අද දින සභාවේදී වීථි පහන් සවි කිරීම් කටයුතු වල සිදු වන අඩු පාඩු සම්බන්ධයෙන්ද කතා වූ බවත් තමන්ට නම් පෞද්ගලිකව එම විදුලි කාර්මික ශිල්පියාගෙන් කිසිදු වගකීම් පැහැර හැරීමක් සිදු වී නොමැති බවත් පවසා සිටියේය. තමන්ට විදුලි බල්බයක් සවි කර ගැනීමට අවශ්‍ය බව පැවසුවහොත් එහිදීත් ඔහු ඒ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා දැනුවත් කරන ලෙස තමන්ගෙන් ඉල්ලා සිටින බවත් එලෙස සභාපතිතුමා දැනුවත් කළ පසු අදාල කාර්ය සිදු කර දීමට කටයුතු කර ඇති බවත් පවසා සිටියේය. මේ කාලයේදී බල්බ හිඟ වීම මත ස්ථාන කීපයක බල්බ සවි කිරීමට නොහැකි වීම හැර අනෙකුත් සියළුම අවස්ථා වලදී තමන්ට අවශ්‍ය අවස්ථා වල විදුලි කාර්මිකගේ සේවය සිය වසමට ලබා ගැනීමට හැකි වූ බව පවසා සිටියාය. මේ කාලය තුළ සභාව මඟින් මාර්ග සංවර්ධන කටයුතු සිදු කරනවා නම් අම්බලම්පිටියේ සිට පූකුණුවලට යන මාර්ගයේ පූකුණුවල විහාරස්ථානය දක්වා ඇති කොටස වඩාත් අබලන් තත්වයේ පවතින බැවින් ඒ සුළු දුර ප්‍රමාණය හෝ සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා සිටියාය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. අබේසේන මැතිතුමා:**

තල්දූව ප්‍රදේශයේ කැළණිවැලි ක්‍රීඩාංගන භූමිය ආශ්‍රිතව සිදු කිරීමට යන මැණික් ගැරීම් සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී දරුක් මැතිතුමා සහ ගරු මන්ත්‍රී පතිරණ මැතිතුමා විසින් අදහස් ප්‍රකාශ කළ බවත් එයින් ලැබෙන මුදල් බෙදී යාය යුත්තේ කෙසේද යන්න සම්බන්ධව ගරු මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා ප්‍රකාශ කළ බවත් පැවසූ එතුමා මීට පෙර මැණික් වෙන්දේසි පැවති අවස්ථා වලදී සභාවට 05% ක මුදලක් ලබා දීමේ ප්‍රතිපත්තියක් තිබූ බවත් පෙන්වා දෙන ලදි. මෙහිදී එවැන්නක් අපිට නොලැබෙන තත්වයක් තිබේ නම් ඒ සම්බන්ධයෙන් අප අවංකව කටයුතු කළ යුතු බව පවසා සිටියේය. මෙය අපගේ බල ප්‍රදේශයේ සිදු වන කාර්යයක් බවත් පෙර අවස්ථාවේදී අපට අයත් නැති ප්‍රදේශයක සිදු කරන ලද කාර්යයකදීත් සභාවට මුදල් ලබා දුන්නා නම් මෙවර එය සිදු නොවන්නේ ඇයිද යන්න සොයා බලා එම 05 % මුදල් කොටස සභාවට ලබා ගැනීමට ක්‍රියා කරන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ ව්‍යාපෘතිය යටතේ වෙනම ආයතනයක් සතු ඉඩමක් වෙන්දේසි කිරීම සඳහා මැණික් හා ස්වර්ණාභරන අධිකාරිය ලබා දුන් බවට ඔවුන් ප්‍රකාශ කරන බවත් පෙර අවස්ථාවේ රජය සතු භූමියක වෙන්දේසි කිරීම සිදු වූ නිසා ආණ්ඩුව විසින් තීරණයක් ගත් බවත් මෙවර මැණික් හා ස්වර්ණාභරන අධිකාරිය වෙනත් පාර්ශවයකට මුදල් ලබා දීමට එකඟ නොවන බවට ඔවුන් ප්‍රකාශ කරන බව පවසා සිටියේය. අවස්ථා ගණනාවකදි මේ සම්බන්ධව ලිපි යොමු කර අදාල අමත්‍යාංශයේ ලේකම්තුමාටත් දුරකථන මාර්ගයෙන් කතා කළත් එකඟතාවයකට නොපැමිණි බවත් මේ කරුණ දිගින් දිගට ඇදී යාම මේ වෙන්දේසිය ප්‍රමාද වීමට හේතු වූ බවත් පවසා සිටියේය. මැණික් හා ස්වර්ණාභරන සංස්ථා පනතේ විධිවිධාන වලට අනුව 01% ක මුදලක් සභාවට අය කර ගැනීමටත් අවස්ථාව නොමැති බව පවසා සිටින ලදී. තමන් මේ ව්‍යාපෘති සිදු කරන වෙනත් ප්‍රදේශ වල පළාත් පාලන ආයතන වලින්ද ඒ සම්බන්ධයෙන් විමසා සිටි බවත් එලෙස මුදල් ප්‍රාදේශීය සභාවට ලබා දීමක් සිදු වි නොමැති බවත් පෙන්වා දෙන ලදි. පසුගිය අවස්ථාවේ අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි රජජය විසින් සිදු කළ ව්‍යාපෘතියක් නිසා සභාවට යම් මුදලක් හිමි වුවත් මේ ව්‍යාපෘතියට එ් ක්‍රමවේදය සම්බන්ධ කර ගැනීමේ හැකියාවක් නොමැති බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. අබේසේන මැතිතුමා:**

මේ සම්බන්ධයෙන් මැණික් සංස්ථාවේ සභාපතිතුමා සමඟ සාකච්ඡා කිරිමට අවස්ථාවක් ඉල්ලා සිටිමට නොහැකිදැයි විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එලෙස විමසා අදාල අමාත්‍යාංශ ලේකම්ට, ජාතික මැණික් හා ස්වර්ණාභරන අධිකාරියට එහි සභාපතිවරයාටත් ලිපි යොමු කර ඇති බවත් නමුත් මේ ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමක් බැවින් එය වෙන්දේසි කිරීමට තීරණය කර ඇත්තේ එම ආයතනය බැවින් එහි එකඟතාවයක් නොමැතිව එලෙස ලබා දිය නොහැකි බව ඔවුන් ප්‍රකාශ කරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. අබේසේන මැතිතුමා:**

එසේම GIS තාක්ෂණය මඟින් මාර්ග සිතියම්ගත කිරීමේ කාර්ය මේ වන විට සිදු වෙමින් පවතින බවත් එය කඩිනමින් සිදු කිරීම සඳහා අවශ්‍ය සහය ලබා දෙන ලෙස අනෙකුත් මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දිනයට නියමිත කරුණු සාකච්ඡා කර අවසන් බැවින් මහා සභා රැස්වීමේ කටයුතු අවසන් කරන බවත් මී ළඟ මහා සභා රැස්වීම 2022.12.13 වෙනි දින පෙ:ව:09.30 ට ප්‍රාදේශීය සභා කාර්යාලයේදී පැවැත්වෙන බව නිවේදනය කරමින් එදින ප:ව: 12.49 ට මහා සභා රැස්වීමේ කටයුතු අවසන් කරන බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදි.

ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද,
සභාපති,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාව.